ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 ආදි සිසුන් අපේ පාසල්වලට සැබවින්ම ආදරේද?


08 ලංකාරක්ෂක ස්මාරකයේ ජයන්ති ජනෝදය


12 සමිඳු මෑණියන් පිළිගත් "ගර්ජනා පුත්‍රයා"


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07



ලබන ඉරුදින ගොබ් ඉරුදිනයි.
එදිනෙන් ශුද්ධවූ සතිය ආරම්භ වේ.

ක්‍රි.ව. 2014 ක් වූ අප්‍රේල් 06 ඉරිදා 148 වෙළුම 44 කලබ සතිපතා පත්‍රය - පිටු 26 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

පශ්චත්තාපීය වැඩසටහන්වලට අමතරව අප්‍රේල් 11 දා විශේෂ ලෙස

# සමගි සන්ධාන ප්‍රසාද නිධානයට කැපවුණු දිනයක් ලෙස පවත්වන්න

## අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ විශේෂ නිවේදනයකින් අගරදගුරු පදවිය දැනුම්වත් කරති

**කොළඹ අගරදගුරු වසමේ මරිය වසර තුළ උදා වී ඇති චතාරික සමයේ දී සැදැහැවතුන් සියළු දෙනාට පාපොච්චාරණය නමැති උතුම් ප්‍රසාද නිධානයේ වටිනාකම ඉස්මතු කරනු වස් අප්‍රේල් මස 11 වැනි සිකුරාදා සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය වෙත සිත් යොමුකර ඊට අවස්ථාව සලසා දෙන්නැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පදවියේ පියතුමන්ගෙන් ඉල්ලා සිටිති.**

මෙදින ප.ව. 6.00 සිට 7.00 දක්වා විශේෂ පශ්චත්තාපික පැයක් අගරදගුරු පදවියේ සෑම මීසමකම පැවැත්වීමට ද සැලසුම් කර තිබේ. මෙදින පාපොච්චාරණය ලබා දීමට පෙළ ගැසෙන ලෙස අගරදගුරු හිමිපාණෝ මීසම් සේවක පියතුමන්ගෙන් ඉල්ලා සිටිති.


### විශේෂ දැනුම් දීමයි



මරිය වසර තුළ එළඹ ඇති චතාරික සමයේ දී කොළඹ අගරදගුරු පදවිය තුළ සැදැහැවතුන් සියලු දෙනා පාපොච්චාරණය නමැති උතුම් වූ සක්‍රමේන්තුව ලබා ගැනීම ඉතා වැදගත් දෙයක් වන්නේ ය. එබැවින් පාපොච්චාරණය නමැති උතුම් ප්‍රසාද නිධානයේ වටිනාකම ඉස්මතු කරනු වස් දැනට අප මීසම්වල සංවිධානය වෙමින් පවතින චතාරික පශ්චත්තාපීය වැඩසටහන් වලට අමතරව චතාරික සමයේ 5 වන සතිය තුළ එළඹෙන සිකුරාදා දින එනම් අප්‍රේල් මස 11 වැනිදා විශේෂ ලෙස සමඟි සන්ධාන ප්‍රසාද නිධානය වෙත සිත් යොමු කළ දිනයක් ලෙස පවත්වන මෙන් මා මීසම් සේවක පියතුමන්ගෙන් ඉල්ලා සිටිමි.


එදින සවස 6.00 සිට 7.00 දක්වා විශේෂ පශ්චත්තාපික පැය අගරදගුරු පදවියේ සියලුම මීසම්වල පැවැත්වීම වැදගත් වේ. ඒ අනුව මා ද ඇතුළුව කොළඹ අගරදගුරු පදවියේ සියලුම සහයක රදගුරු තුමන් එදින පාපොච්චාරණය ඇසීමේ කටයුත්තට සහභාගි වනු ඇත. එබැවින් මෙම දිනය විශේෂ දිනයක් ලෙස පදවිය තුළ සංවිධානය කරමින් පාපොච්චාරණ කුටිය තුළ රැඳෙමින් මෙම උතුම් කාර්යයට පෙළ ගැසෙන මෙන් සියලුම මීසම් සේවක පියතුමන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඔබට දේව පිහිටයි!



✠ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
කොළඹ අගරදගුරු
2014. මාර්තු 31 වෙනිදා

✍ ශිරාන් මෛත්‍රී විසිනි



අති උත්තම xxiii ජුවාම් හා භාග්‍යවන්ත දෙවැනි ජුවාම් පාවුළු හිමිපාණන් දෙනම සාන්තුවරයට ඔසොවන අප්‍රේල් 27 වැනි ඉරිදා දස දහස් සංඛ්‍යාත බැතිමතුන් රෝමයට එක්රොක් වෙතැයි අපේක්ෂා කැරේ.

එදින සාන්තුවරයට එසැවීමේ ඓතිහාසික මෙහෙය සා. පීතර චතුරස්‍රයේ දී පැවැත්වෙන්නේ අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ ප්‍රධානත්වයෙන් වන අතර විශ්‍රාමික අති උතුම් සොළොස්වන බෙනඩික් සසුන් පියා ද ඊට එක්වනු ඇතැයි විශ්වාස කැරේ.

මෙ නිමිත්තෙන් අප්‍රේල් 26 සෙනසුරාදා යැදුමේ ධවල රාත්‍රිය ලෙස නම් කර රාත්‍රි 9.00 සිට රෝමය හා ඒ අවට ඇති සියලූ දේවස්ථාන විවෘතව තබා ජනතාවට යාච්ඤා කිරීමටත් පාපොච්චාරණයටත් ඉඩ ලබා දී තිබේ. බයිබල් පාඨ කියවීම, සගසුව දිනූ සසුන් පිය දෙනමගේ විශ්ව ලේඛනවල පාඨ කියවා භාවනා කිරීම ආදිය ද සිදු කැරේ.

15 පිටුවට »

ඥානාර්ථ ප්‍රදීපය පාස්කු කලාපය ලබන ඉරිදා නිකුත් වේ.



අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් සමගි සන්ධානයේ සක්‍රමේන්තුව තරුණයෙකුට දානය කරමින්...

### සම්මාන ලැබිය යුත්තෝ කවුද?

**අති උතුම් කාදිනල් හිමිපාණන් බොරැල්ල සියලු සාන්තුවර බාලිකා විදුහලේ පැවත් වූ දේශනය FM 91.7 හා FM 91.9 තරංගමාලා ඔස්සේ 2014 අප්‍රේල් 06 දා ප.ව. 5.30 ගුවන් විදුලියේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය කැරේ. (ජූඩ් අයිවන්)**

### නව ධර්මදාන වැඩපිළිවෙල

**කොළඹ අගරදගුරු පදවිය තුළ ක්‍රියාත්මක වන නව ධර්මදාන වැඩපිළිවෙල සම්බන්ධයෙන් කතෝලික ව්‍යවසායකයින් හා වාණිජ ආයතනයන්හි විධායක නිලධාරි සැදැහැවතුන් දැනුම් වත් කිරීමේ වැඩසටහනක් ඉකුත් දා අගරදගුරු මැදුරේදී පැවැත්ණි. අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම හමුව සදහම් සජීවක මෙහෙවර සහ කතෝලික ව්‍යාපාරික සංසදය විසින් ඒකාබද්ධව සංවිධානය කැරිණි.**

### ඇතුගල්පුර භක්ති අභ්‍යාස

**ඇතුගල්පුර පදවියේ මාවතගම ඓතිහාසික කල්වාරි පුදබිමේ පාද නමස්කාරය සහ කුරුස පාමුල දිව්‍ය යාගය 2014 අප්‍රේල් 11 දා ප.ව. 2.30 කුරුණෑගල විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ සහභාගිත්වය සහිතව කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවැත්වේ.**

### "අනිමා ක්‍රිස්ටි"(Anima Christi)

වසරක් පාසා පවත්වනු ලබන චතාරික වැඩසටහන මෙවර "Anima Christi" යන තේමාව යටතේ 2014 අප්‍රේල් 11 සිකුරාදා ප.ව. 6.30 කොළඹ සා. ජෝශප් දෙව්මැඳුරේදී පැවැත්වේ.

මෙය විශ්වීය පිළිගැනීමක් ලෙස ඇති සා. ජෝසප් විද්‍යාලීය "සා. සිසිලියා" ගායනා කණ්ඩායම ක්‍රිස්තුන් වහන්සේගේ මිහිපිට අවසන් දින කීපය ආවර්ජනය කිරීමකි. ප්‍රවීන ශාස්ත්‍රවේදී සංගීතඥයන් අතින් ජනප්‍රිය පැරණි ගීත ද එයට ඇතුළත් කර ඇත. එසේම යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ සුමිහිරි ගායිකාවන්ගේ හා මාරිස්ටෙලා පාසලේ දායකත්වය ඇතුළු ගායක ගායිකාවන් 300 ක් පමණ සහභාගි වන මෙම "චතාරික ගීත මෙහෙය" සහභාගි වන සියල්ලන්ට අමිල අත්දැකීමක් වනු නිසැකය.

### ශුද්ධවූ තෛලය ආශිර්වාද මෙහෙය

**ශු. තෛලය ආශිර්වාද කිරීමේ මෙහෙය අප්‍රේල් 14 සඳුදා උදේ 10.30 ට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් සහ සහයක රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් බොරැල්ල සියලු සාන්තුවරයින්ගේ දේවස්ථානයේදී පැවැත්වේ.**

### ත්‍රිකුණාමලය නාච්චිකුඩා කල්වාරි පුදබිමෙන් ඇරියුමක්

ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් චීන වරාය ග්‍රාමයේ වෙල්ලමනල් ග්‍රාම නිලධාරි වසමේ නාච්චිකුඩා ගම්මානයේ ස්වාභාවික වන ලැහැබකින් යුත් ඉතා මනරම් කුඩා කඳු ගැටයකි. එහි සිට බලන විට චීනවරාය මුහුදු තීරය හා අවට ගම්මාන මනා ලෙස දිස්වෙයි.

චීන වරාය මීසමට අයත් වෙල්ලමනල් ශුද්ධාත්ම දේවස්ථානය හා මෙතෙක් ජේසු නිකාය පියවරුන්, මරිය නිකාය පියවරුන්, පදවි පූජක අඛණ්ඩව වර්ෂයක් පාසා සිදුකරන මෙම පාද නමස්කාරය මෙවරද නාච්චිකුඩා කල්වාරි පුදබිමේදී 2014. 04. 05 වන දින උදෑසන 8.00 ට අප පියතුමන්ගේ මෙහෙය වීමෙන් ආරම්භ කැරේ.

15 පිටුවට »

"ස්වාමින් වහන්සේගේ දුක්ගාවිනාවලට හවුල් වෙමු"

## පදවියට

# පල්ලකණ්ඩල් සා. අන්තෝනි දෙව්මැඳුරට ආධාර ඕනෑ!

පුත්තලම පරණ මන්නාරම් පාරේ එළුවන්කුලම 17 වන කණුවේ සිට කළා ඔයෙන් එගොඩට උතුරු දෙසට දිග හැරුණු පැරණි ඕලන්ද යුගයේ වැලි සහිත මන්නාරම් පාරේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල අසලින් දකුණට හැරී මද දුරක් ගිය විට හමුවන 24 වන සැතපුම් කණුව අසල කුරුස කණුව ඇත්තේ පල්ලකණ්ඩල් දේවස්ථානය ගැන කියන්නටයි. විල්පත්තු අභය භූමියේ වැවක් අසබඩ වන සතුන් ගහණ රමණීය බිම් පෙදෙසක අභිමානවත් අයුරින් සා. අන්තෝනි මුනිඳුන්ට කැපකළ මේ ඓතිහාසික දේවස්ථානය පිහිටා ඇත. මුල් කාලයේ මෙම පුදබිමට සැදැහැවතුන් පයින්, ගොන් බැඳි කරත්තවලින් දිවා රාත්‍රියේ පැමිණ කැළෑව තුළ කූඩාරම් ඉදිකර ගිනි මැලය සහ ලන්තෑරුම් එළියෙන් දෙවිඳුන්ට පුද පූජාවන් පැවැත්වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. 1954 වන විටත් හලාවත පදවියේ වනාතවිල්ලුවට දේවස්ථානයක් නොතිබූ බැවින් තලවිල දේවස්ථානය මගින් පාලනය වී අද වනාතවිල්ලුව මීසමට මෙම දේවස්ථානය අයත් වී ඇත.

ජුසේ වාස් පියතුමා පුත්තලමේ සිට සිදුකළ දූත මෙහෙවරේදී පල්ලකණ්ඩල් ගම්මානයේ නතරවී ගිමන් නිවා ගත් බවත්, දිව්‍ය පූජාවක් ගම්මානයේ පවත්වා කටු මැටි ගැසූ පොල් අතු සෙවිලි කළ දෙව්මැඳුරක් තනා ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ගේ පිළිරුවක් කැපකර ඇති අතර අද වන විටත් මෙම පිළිරුව පුදබිමේ ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේ ඉතා ප්‍රබල ලෙස මෙම පුදබිමේ ක්‍රියාකර ඇති බවට ප්‍රබල සාක්ෂි තිබේ. 1980 දශකයේ ඇතිවූ යුද ගිනි දැල් මත මෙම දේවස්ථානයේ වන්දනා මාන කිරීම නතර වී ඇත. වසර 25 ක යුද්ධය අවසන් වීමෙන් පසු 2010 වර්ෂයේදී මීසම් සේවක ගරු සරත් කුමාර පියතුමා සහ හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ඇඩි උත්සහය හා කැපවීම මත රජයේ ආරක්ෂක අංශවල අවසරය හා සහයෝගය මත දින දෙකක කාලයක් ලබාගෙන මංගල්‍ය කටයුතු කරන ලදී.

මේ පුදබිම ප්‍රාතිහාර්ය බහුල ප්‍රදේශයකි. ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ට වූ භාර ඉල්ලීමට හා ඔප්පුකිරීමට පුද බිමට ඇතුලුවීමට බලධාරීන් ඉඩ දුන්නේ නැත. මීසම් සේවක ගරු කමල් ඩේමියන් පියතුමා සහ හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් ඇතුළු සැදැහැවතුන්ගේ බලවත් ඉල්ලීම මත පසුගිය සැප්තැම්බර් මස 10 වන දින වන ජීවී අමාත්‍ය විජිත් විජිතමුණි ද සොයිසා මහතා පෞද්ගලිකව පුදබිමට පැමිණ සියලු කාරණා විමසා බලා මහින්ද චින්තනය අනුව සියලුම ආගම්වලට එකසේ සැලකීමේ ප්‍රතිපත්තිය මත පුදබිමට ඕනෑම දිනයක යාමට බැතිමතුන්ට අවසර ලබා දීමටත්, පළමුවන අඟහරුවාදා දින නුවාන දිව්‍ය පූජාව පැවැත්වීමටත්, මංගල්‍යයට අවශ්‍ය පරිදි සැදැහැවතුන්ට රාත්‍රියේ නවාතැන් ගැනීමටත්, දෙව්මැඳුර ප්‍රතිසංස්කරණය කිරීමට හා පියතුමන්ලාට නවාතැන් ගැනීමට මීසම් ගෘහයක් ඉදිකිරීමටත්, බැතිමතුන්ගේ පහසුව සඳහා වැසිකිළි සංකීර්ණ කිහිපයක් හා ජල පහසුකම් සපයා ගැනීමටත් අනුමතිය ලබා දීමට පොරොන්දු වී ඇත. පසුගිය ඔක්තෝබරයේදී ගරු පියතුමන් ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු වන ජීවී අමාත්‍යතුමා, නිළධාරීන් සමග වන ජීවී අමාත්‍යංශයේ පැවැති අවසාන සාකච්ඡාවේදී අවසරය ලිඛිතව ලබා දී ඇත. පුදබිමේ ඉඩම් අයිතිය ලිඛිතව නොපමාව ලබාදෙන බවට පොරොන්දු වී ඇත. මින්පසු පල්ලකණ්ඩල් පුදබිමට පැමිණ ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ට භාර ඉල්ලීමට හා ඔප්පුකිරීමට, මඩු වන්දනාවේ යන බැතිමතුන්ට ගිමන් නිවා ගැනීමේ අවස්ථාවද උදාවී ඇත. සෑම වර්ෂයකම ජූලි මස දෙවන ඉරුදින වාර්ෂික මංගල්‍යය පැවැත්වීමට කටයුතු යොදා ඇත. පසුගිය ඔක්තෝබර් මස සිට සෑම පළමුවන අඟහරුවාදා දිනක නුවානය හා දිව්‍ය පූජාව සිදුකරනු ලැබේ. අප්‍රේල් පළමුවන අඟහරුවාදා දින චතාරික කාලය වෙනුවෙන් පාදනමස්කාරයක් පැවැත්විය. මෙම දෙව්මැඳුරේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට හා මීසම් ගෘහයක් ස්ථාපනය කිරීමටත්, සංඨාර කුළුණක් ඉදිකිරීමටත්, බැතිමතුන්ගේ අවශ්‍යතාවන්ට වැසිකිළි සංකීර්ණ කිහිපයක් හා ජල නල පහසුකම් සැපයීම සඳහා ජල ටැංකි ස්ථාපනය කිරීමටත්, පුදබිමට පැමිණෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමටත් ගරු පියතුමා සැදැහැවත් ජනතාවගේ ආධාර බලාපොරොත්තු වේ. එම ආධාර පහත සඳහන් බැංකු ගිණුමට ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටී. හැටන් නැෂනල් බැංකුව, පුත්තලම ශාඛාව - ඉතිරිකිරීම් ගිනුම් අංක 083020175709 ගරු කමල් ඩේමියන් පියතුමා, සා. ජූඩ් දේවස්ථානය, වනාතවිල්ලුව. දුරකථන අංකය - 0718332266

**රෙනල් ප්‍රනාන්දු**

## සැලේසියානුවෝ පසන් ගයති

දොන් බොස්කෝ සැලේසියානු නිකායේ පියවරුන් විසින් සංවිධානය කරනු ලැබූ ප්‍රථම පසන් ගායනය උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් දුන්ගල්පිටිය දොන් බොස්කෝ රංග ශාලාවේදී සිදුකරන ලදි.

දන්කොටුව සැලේසියානු දෙව්සත්හලේ සිසුන් සමග මිගමුව, දුන්ගල්පිටිය, උස්වැටකෙයියාව, පල්ලියවත්ත යන දොන් බොස්කෝ ආයතනවලට සම්බන්ධ, ආද්මා සහ සැලේසියන් සහයකයන් විසින් මෙම පසන් ගායනය ඉදිරිපත් කරනු ලැබූ අතර, ශ්‍රී ලංකා සැලේසියානු උප ප්‍රාන්තයේ, උප ප්‍රාදේශාධිපති ගරු ඩික්සන් ප්‍රනාන්දු උස්වැටකෙයියාව දොන් බොස්කෝ ආයතනයේ අධ්‍යක්ෂ පියතුමෝ මඟපෙන්වූහ.

**සෙබස්තියන් පෙරේරා**



ස්වර්ගස්ථ වූ අති උතුම් ෆ්‍රෑන්ක් මාකස් ප්‍රනාන්දු හලාවත රදගුරු හිමිපාණන්ගේ කාලානුරූපී දේශනා ඇතුළත් රදගුරු චින්තා 'පාදනමස්කාර භාවනාව' සංයුක්ත තැටිය පසුගියදා එළිදැක්වුණි. හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ට මෙහි පළමු පිටපත පදවි ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු ෆ්‍රෑන්ක් තිසේරා පියතුමන් විසින් පිළිගැන්විය. මෙම අවස්ථාවට පදවි පරිපාලන අතිගරු ප්‍රැට්ක් විජේසිංහ පියතුමා ජනසන්නිවේදන කමිටුවේ ලේකම් ආනන්ද තිසේරා මහතාද එක්විය. මෙම සංයුක්ත තැටිය රදගුරු හිමිපාණන්ගේ නිර්මාණ සංරක්ෂණය කිරීමේ අරමුණින් හලාවත පදවි ජනසන්නිවේදන හා සංස්කෘතික කේන්ද්‍රය මගින් නිෂ්පාදනය කෙරිණි.

**ප්‍රියන්ත පීටර්ස්**

## පන්නිපිටිය බයිබලීය පාදනමස්කාරය

මීසමවාසින් විශාල පිරිසක් හවුල් වූ බයිබලීය පාදනමස්කාර මෙහෙයක් පසුගියදා පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරේදී පැවැත්විය. ගැයුම්, යැදුම් හා භාවනාවකින්ද මෙම මෙහෙය සමන්විත විය. පාදනමස්කාර මෙහෙය ජීවිතයට සවියක් කර ගන්නා ආකාරය මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා පියතුමන් විසින් මෙම මෙහෙයේදී පහදා දෙනු ලැබිය. සහයක ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමා සමග වැඩිහිටි තරුණ ක්‍රියාකාරී කමිටුව විසින් මෙහෙයේ කටයුතු සංවිධානය කරන ලදි.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**



පමුණුගම අගරදගුරු පදවි ධර්මදූත සේවා පුහුණු මධ්‍යස්ථානයේ පළමු අදියරේ පුහුණු ධර්ම දානයක් පමුණුගම මධ්‍යස්ථානයෙන් සමුගැනීමේ අක්තපත්‍ර බාර ගැනීමේ හා තුතිපිදීමේ දිව්‍ය යාගයක් පමුණුගම මධ්‍යස්ථාන දෙව්මැදුරේදි කොළඹ සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. රදගුරු හිමි සමග පමුණුගම ධර්මදූත සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ගරු ජූඩ් පීරිස් පියතුමා ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියතුමා කඩුගන්නාව මීසමේ ගරු දියෝගුපිල්ලේ ක්‍රිස්ටෝපර් පියතුමා ගරු මේරි ඔගස්ටින් පැවිදි සහෝදරිය සමග තම සහතික අත දැරූ පුහුණු ධර්මදූතයෝ ඡේයාරූවට පෙනී සිටියහ.

## මුහුදු වෙරළේ පාදනමස්කාරයක්

තලාහේන නව මීසමේ, චතාරික වැඩසටහනේ එක් භක්ති අභ්‍යාසයක්වූ මහා පාදනමස්කාරය, තලාහේන දේවස්ථානයට අයත් සීමාවේ මුහුදු වෙරළේදී පවත්වන ලදි. මෙහිදී එක්, එක් ස්ථානවලදී මෙනෙහි කිරීම නුවාන කොට්ඨාශ මූලිකයන් විසින් සිදුකරන ලද අතර, විශාල පිරිසක් ඉතාමත් බැතියෙන් සහභාගි වූහ. මීසම් සේවක ගරු ප්‍රදීප් චමින්ද පියතුමාගේ මඟපෙන්වීම මත නුවාන කොට්ටාස මට්ටමින් මෙය සංවිධානය කරන ලදි.

**තලාහේන වාර්තාකරු**



කටුපොත සා. වින්සෙන්තිද පාවුලා කන්ෆරන්සය මගින් පසුගිය ඉරුදින මීසම් සේවක ගරු අනිල් මාකස් සහයක ගරු සම්පත් සුජීව පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් කටුපොත, වාරියපොල, කිරිමැටියාව දෙව්මැඳුරු වලට අයත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සැදැහැවතුන් සඳහා වැඩිහිටි දිනයක් 15 වන වරටත් පවත්වන ලදි. ඒ සැම දෙනෙක්ම උදෑසන දිව්‍ය පූජාවට සහභාගි කරවා ඉන් අනතුරුව සවස් යාමය වන තුරු මෙම අයගෙන් සභාවට හා සමාජයට ඉටුවූ සේවාවන් ඇගයීමට පාත්‍ර කරමින් ආහාර පානාදියෙන් පෝෂණය කරමින්ද, ත්‍යාග පිරිනමමින්ද ඔවුන්ගේ අතීත සිහිවීම් විදහා දක්වමින් නැටුමෙන් හා ගැයුමෙන් තෘප්තිමත් කිරීම තුළින් සිය නිවෙස් වල ඇති ඒකාකාරි ජීවිතයෙන් මදකට හෝ මිදී සතුටට පත්වන්නට අවකාශ සැලසීය. ඔවුන් සියළු දෙනා ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**ඔස්ටින් කැෂ්මියර් ප්‍රනාන්දු**

## චතාරිකයට වැඩමුළුවක්

ලෝකය පරදවන වික්‍රමය නම් ඇදහිල්ලයි. තේමාව යටතේ එක් දින වැඩමුළුවක් ගරු ප්‍රිය ජයමාන්න පියතුමාගේ අනුශාසකත්වයෙන් අප්‍රේල් 12 සෙනසුරාදා පෙ.ව. 9.00 සිට තේවත්තේදී පැවැත්වේ.

ශුද්ධ වූ සතියට සූදානමක් වශයෙන් පැවැත්වෙන මෙම වැඩමුළුවෙන් නියම මනස්ථාපනයකින් සිත හරවාගෙන ඇදහිල්ලට යොමුවීමට අගනා අත්වැලක් බව පැවැසේ.

## පාස්කු ධර්ම විවේකයක්!

කැලණිය මීසමේ වරාගොඩ සා. පාවුළු දේවස්ථාන මරිය හමුදාව මගින් 4 වන වතාවට පවත්වනු ලැබූ වාර්ෂික පාස්කු ධර්ම විවේකය පසුගිය දා දිව්‍ය ගැළවුම්කරුවාණන්ගේ නිකායේ ගරු සරත් කුමාර පියතුමාගේ ප්‍රධානත්වයෙන් සැදැහැවතුන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.

මරිය වසර වෙනුවෙන් විශේෂයෙන් සහභාගි වූ සෑම සැදැහැවතියකුටම ජපමාලයක් දානය කරන ලදි. මීසම් සේවක ගරු ජෝසප් ඉන්දික සහ සහයක ගරු නිලන්ත එදිරිවික්‍රම පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ මරිය හමුදාව විසින් මෙය සාර්ථක ලෙස සංවිධානය කරනු ලැබීය.

**ක්ලැරන්ස් ලෙනාඩ්**



කුරණ කටුනායක සා. ජූඩ් විදුහලේ සහයක පියතුමකු ලෙස සේවය කළ ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමා මාරුවී යාම නිමිත්තෙන් එම විදුහලේ පැවති සමුදීමේ උත්සවය අවසානයේ සා. ජූඩ් විදුහලේ හිටපු අදියුරු හා වත්මන් ආත්මික අධ්‍යක්ෂ ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමා ගරු රොෂාන් පියතුමාට තිළිණයක් පිරිනැමූ අයුරු. සා. ජූඩ් විදුහලේ නව අදියුරු ගරු රෝහිත රුද්‍රිගු පියනම සමග සහයක පියතුමාද මෙහි වෙති.

**ටී. සුනිල් ප්‍රනාන්දු**

## කඳාන ක්‍යුරියාව ආචියස් උත්සවය පවත්වයි

කඳාන දිසාවට අයත් මරිය භටයන් පසුගියදා කඳාන සා. සෙබස්තියන් මුනි සිද්ධස්ථානයේදී ආචියස් උත්සවය පවත්වන ලදි.

එදින කඳාන මරිය හමුදා දිසා අධ්‍යක්ෂ ගරු බර්නාඩ් රෙහාට් පියතුමා අනුශාසනය සිදුකළ අතර, කඳාන සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දානය කළේය. කඳාන දිසාවට අයත් සියලුම ප්‍රසිඩියම්වලට අයත් මරිය භටයෝ ඊට සහභාගි වූහ.

**ඩල්සි මෙන්ඩිස්**

## රත්නපුර පදවි දෙව්මව් උපහාරය මෙදා මඩු පුද බිමේදී

මරිය වසර කේන්ද්‍ර කරගෙන රත්නපුර රදගුරු පදවියේ සෑම මීසමක් නියෝජනය කරමින් ගිහි පැවිදි පූජක සැමගේ සහභාගිත්වයෙන් ධර්ම විවේකයක් අගෝස්තු 22,23,24 දිනවල මඩු පුදබිමේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

පසුගියදා පැවති රත්නපුර පදවි මීසම් ධර්ම සේවා සභා රැස්වීමේදී රත්නපුර පදවි වාර්ෂික වන්දනා ගමනට සමගාමීව මෙය පැවැත්වීමට තීරණය කැරිණ.

**තියබෝල්ඩ් සමරතුංග**

## නායකකන්ද චතාරික වන්දනා ගමන

නායකකන්ද මීසමේ වාර්ෂික චතාරික වන්දනා ගමන මෙවර මඩු සිද්ධස්ථානයට ගියහ. 'මරිය තුමිය අන්දකින කිතුනුවෙකු වෙමු' යන තේමාව යටතේ පුරා දින දෙකක් ඥානකාන්තිය, පාද නමස්කාරය, දිව්‍ය පූජාව් හා කොට්ඨාස මට්ටමින් ජපමාලය උච්චාරණය කිරීම වැනි චතාරික අභ්‍යාස වලින් සමන්විතවූ මෙම වන්දනා ගමනට දහසකට අධික බැතිමතුන් පිරිසක් සහභාගි වූහ.

ඥානකාන්තිය ගරු රංජිත් ඩි මෙල් පියතුමන් විසින් මෙහෙයවන ලද අතර නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ මූලිකත්වයෙන් කටයුතු සංවිධානය කරන ලදී.

**නිහාල් සී. පෙරේරා**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 අප්‍රේල් 06 ඉරිදා

# ආදි සිසුන් අපේ පාසල් වලට සැබවින්ම ආදරේද?

දැනට පවතින කතෝලික පෞද්ගලික පාඨශාලා වලින් ඉගෙනුම ලබා ඉන් බැහැරව වසර ගණනාවක් ගිය පසුත් තමන් ඉගෙන ගත් පාසලට ආදරය නොකර ඒ ඒ පාසල් වල කීර්තිනාමය කෙලසන සමහර ආදි සිසුන් පිළිබඳව විවිධ ජනමාධ්‍ය හරහා එළිදැක්වෙන කරුණු කාරණා සම්බන්ධයෙන් තමන් කනස්සල්ලටත් විමතියටත් පත් වී ඇති බවට පාඨක බොහෝ දෙනෙක් අප වෙත යොමු කරන ලිපි මඟින් හෙළිදරව්වක් කරති. මෙය සැබවින්ම විමසීමට ලක් කළ යුතු කරුණකි. අද කතෝලික සභාවට අයිති පෞද්ගලික පාසල් අතරින් කිහිපයක් හැරෙන්නට විශාල සංඛ්‍යාවක් මෑතකදි බිහිවූ පාසල් බව නොරහසකි. වසර පනහ ඉක්මවූ පාසල් කිහිපය තුළින් මේ වන විට බැහැරව ඇති සිසු සිසුවියන් සංඛ්‍යාව ඉමහත්ය. බොහෝ දෙනෙක් සමාජ පංති මට්ටම් අතර ඉහළ තලයක හෝ මධ්‍යම තලයක වෙසෙන්නෝ වෙති. පෞද්ගලික ආයතන හෝ මහපරිමාණ ව්‍යාපාර පාලනය කරන්නෝ වෙති. නැතිනම් ඒවා වල හිමිකාරයෝ වෙති. පොදුවේ පිරිමි මෙන්ම කාන්තා කතෝලික පෞද්ගලික පාසල් වලින් ඉගෙනුම ලබා ඉන් බැහැරව අද සමාජයේ ජීවත් වන සමහර උදවිය තුළින් අධ්‍යාත්මිකව බැඳුනු ආදරයක්ද, කතෝලික දහම කෙරෙහි එතරම් ඇල්මක්ද නොමැති බවද පෙනී යයි.

රජයේ කතෝලික පාසල් වලින් ඉගෙනුම ලබා ඉන් එළි බට බොහෝ දෙනෙක් අදටත් කතෝලික විශ්වාසය සමඟ නිරන්තරයෙන් එකට බැඳී ජීවත් වන බව පැහැදිලිව දැකිය හැකියි. දේව කැඳවීම් උපරිමයෙන්ම ලැබී ඇත්තේ ගම්බද හෝ අර්ධ නාගරික ප්‍රදේශ වල පිහිටා ඇති රජයේ කතෝලික පාසල් වලිනි. ගමේ පල්ලියේ මංගල්‍ය කටයුතු වලදි කොඩිගස ඔසවන විටදි කඹ ඇදගෙන, කොඩි සරසා ඒ වත් පිළිවෙත් වලට එකතු වන්නේ එදා රජයේ කතෝලික පාසලින් අධ්‍යාපනය ලබා අදටත් ඒ පාසලට මෙන්ම ආගමටත් ආදරය කරන පැරණි සිසුන් බව ආඩම්බරයෙන් පැවසිය හැකියි.

නමුත් අපේ කතෝලික පෞද්ගලික පාසල් වලින් එළි බට බොහෝ පිරිසක් පාසලට වෛර කරමින් පිටවී ගොස් ඇති බවට පැන නැඟී ඇති කුහුලේ ඇතුලාන්ත සත්‍යය කුමක්ද? එකී කරුණ සැබෑවක්ද? නැතිනම් ප්‍රලාපයක්ද? විමසා බලමු. පාසලේ ක්‍රිකට් කණ්ඩායම අරබයා අර්බුදයක් පැන නැඟුනොත් ආගම දහමට පවා වෛර කරන්නට දරුවන් පොළඹවන්නේ ඔවුන්ගේ දෙමව්පියන්ය. අද කොළඹ නගරයේ ලුම්පන් සමාජ ආකල්පය දරන අය අතරේ ආගම දහම පවා පංති පරතරය පෙන්වන තරගයක් බවට පත්වී තිබේ. දේවස්ථානයන්හි පැයක දිව්‍ය පූජාව විවේචනය කරන එවන් උදවිය සමාජ පංති මට්ටම තුළ එල්ලී සිටින්නට විවිධ යාච්ඤා මධ්‍යස්ථාන කරා හඹා ගොස් පැය ගණන් කාලය මිඩංගු කරන අයුරුත් දැකගත හැකියි. කොළඹ ප්‍රධාන පෙලේ අන්‍ය ආගමික පාසල් වලින් බැහැරව ගොස් ඇති ආදි සිසුන් අදටත් ඒ විදුහල් වල කීර්ති නාමය ආරක්ෂා කරන හැටි දකින විටත් ඇති වන්නේ ගෞරවයකි. නමුත් කතෝලික පෞද්ගලික පාසල් වල වර්තමාන විදුහල්පති පියවරුනට, පැවිදි සොහොයුරියනට වින කරන්නේ ඒ ඒ පාසල් වලින් පිටවී ගිය ආදි සිසුන් බව දැකීම සැබවින්ම සමස්ථය ගැන වේදනාවක් උපදවන සුළුයි. මෑතකදි සිදුවූ බොහෝ කරුණු කාරණා මෙකී කරුණු සාක්ෂාත් කරයි. අවුරුදු ගාණක් පැවති පාසල් කීර්ති නාමය පමණක් නොව ආගමික අධ්‍යාපනයද පළුදු කරන්නට එවන් ආදි සිසුන් කටයුතු කරනු දැකීම පාසල පිළිබඳවම අනේ අපොයි ! අනුකම්පාවක් දැනවීමට හේතු වී ඇත.

අද ප්‍රසිද්ධ ජන මාධ්‍ය අතරට එන කතෝලික පෞද්ගලික පාසල් වලින් ඉගෙන ගත් බොහෝ දෙනෙක් දහම පිළිබඳව, පාසල පිළිබඳව වැරදි පින්තූර ලබාදෙන්නටද උත්සහ දරන බව පෙනේ. සියල්ල මුදලටම සීමා කර ඇත. මේ පාසල් වලින් බිහිවී පිටව ගිය සමහර පැරණි සිසුන් වර්තමානයේ මෙකී පාසල් අය කරන මුදල් ගැන නඟන හඬ සැබවින්ම කන්දක් විළිලා බිහිකළ මී පැටවෙකුට බොහෝ සෙයින් සමාන කළ හැකියි. නමුත් වසර 13 සිසුන් අධ්‍යාපනය ලබන පරිසරයේ මුල් අවස්ථාවේ අය කරන මුදල ගැන වැරදි පින්තූර ඇතිකර වැරදි විදිහට එකී සමාජ මතය තනන්නට උත්සහ දරන්නේද පැරණි සිසුන්ම වීම ඇතිවන කණගාටුව තිව්‍ර කරවයි.

අපේ පෞද්ගලික පාසල් තුළින් බිහිකරන දරුවන්ට පාසල පිළිබඳව මුල පටන්ම දැඩි ආදරයක් ඇති කළ හැක්කේ දහම, ආධ්‍යාත්මිකත්වය නිවැරදිව ලබාදීම තුළින් පමණකි. එබැවින් ආගමික අධ්‍යාපනය අද ඉහළින්ම තබා කතෝලික පෞද්ගලික පාසල් වල කතෝලික ආගමික ප්‍රතිශතය 98% දක්වා රඳා පවත්වා ගත හැකිනම් අනාගත ප්‍රතිඵල වඩාත් යහපත් කරගත හැකියි. එබැවින් විවිධ ආගම්වලට ඇදී යන ආදි සිසුන්ගේ දරුවන් ඔවුන් ආදි සිසුන් වීම නිසාම ගත යුතුය යන ප්‍රතිපත්ති දැන් නම් වෙනස් කිරීමට කාලය එළඹී ඇති බව දැඩිව අවධාරණය කරමු.

# "අපි දිනුම්" "ඔබ පැරදුම්" යන න්‍යාය පසුපස හඹා යනු වෙනුවට "අපි සැවොම දිනුම්" යන න්‍යාය අනුගමනය කිරීම කාගේත් යුතුකමයි

## කාදිනල් හිමිපාණෝ කරුණු පැහැදිලි කරති

මාර්තු මස 30 වන දින ඥානාර්ථ ප්‍රදීප පුවත්පතේ ඇල්ෆ්‍රඩ් නෙල්සන් නමැති අයෙකු නමින් පළ වූ ලිපිය මගේ අවධානයට යොමු වී ඇත. එම ලිපිය මගින් පෞද්ගලිකව මගේ ද ශ්‍රී ලාංකීය කතෝලික සභාවේ ද ඇතැම් තීරණ වලට වැරදි අර්ථ කථන ලබා දී ඇති බවට හැඟී ගියෙන් ඒවා නිවැරදි කිරීම සඳහා මෙසේ ලියමි.

යුරෝපා සංගමය ලබාදුන් GSP සහනය අහෝසි කිරීම සම්බන්ධ තීරණය ප්‍රකාශිත වූ සමයේ දී අන්තර් ආගමික කණ්ඩායමක් සමග මා යුරෝපා රටවලට ගොස් අදාල නියෝජිතයන් ගෙන් එසේ නොකරන ලෙස ඉල්ලා සිටියේ එම ලිපියේ අඟවා ඇති ලෙස රජයට සහයෝගය දැක්වීමට නොව එම තීරණය නිසා විශේෂයෙන් නිදහස් වෙළඳ කලාප තුළ රැකියාවල නියුතු වන අසරණ කම්කරුවන් හා සේවක සේවිකාවන්ගේ රැකියා අහිමිවීමේ තර්ජනයට පිළිතුරක් සොයා ගැනීමේ අටියෙනි. මේ සඳහා සියලු ආගම් නියෝජනය වන කණ්ඩායමක් සහභාගි වීම ජනතා ප්‍රශ්න වලදී ආගමික නායකයන් සංවේදී වීමේ වැදගත් කම පැහැදිලි කරදුනි.

යුරෝපා සංගමයේ නියෝජිතයින් හමු වූ විට දී අප කියා සිටියේ ලංකාවේ පොදුජන ආර්ථිකය බිඳවැටීම නිසා රටට සහ එහි පුරවැසියන්ට ඉමහත් ආර්ථික අපහසුතා සමූහයකට මුහුණ දීමට සිදුවන බවය. විරැකියාව වැඩිවීමෙන් ජන ජීවිතය අවුල් වන නිසා එසේ නොකරන ලෙස අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටියෙමු. මේ සංචාරයේ දී සිදු වූ අනෙක් වැදගත් දෙය වූයේ යුරෝපා සංගමයේ ඉල්ලීම පරිදි යුද්ධයෙන් පසු එදා කඳවුරු වල රඳවාගෙන සිටි ද්‍රවිඩ සිවිල් වැසියන් එම කඳවුරු වලින් නිදහස් කර තම ගම් වලට යැවීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමට රජයට කළ ඉල්ලීම තුළින් නියෝජිත කණ්ඩායම නැවත මෙරටට සැපත් වීමටත් පෙර එම වැසියන් කඳවුරු වලින් නිදහස් කිරීමට ක්‍රියාත්මක වීමයි. අප සංචාරය නිමා කොට නැවත ලංකාවට පැමිණෙන විට 150,000 ක් පමණ වන කඳවුරු වල රඳවා සිටි සිවිල් වැසියන් රජය විසින් නිදහස් කර තිබුණි. මෙය අප සංචාරයේ සුබවාදි ප්‍රතිඵලයක් වූ බව බොහෝ දෙනා නොදනිති. නමුත් එය සිදුවුයේ එසේය.

එලෙසම කටුනායක සිදුවූ සිද්ධියෙන් අවාසනාවන්ත ලෙස කිතුනු තරුණයකු මියගිය බව මා හට දැනගන්නට ලැබුණේ මා විදෙස්ගතව සිටියදී ය. එබැවින් ඒ තරුණ මහතාගේ අවසන් කටයුතු සියල්ල සංවිධානය කරනු ලැබුවේ කොළඹ අගරදගුරු පදවියේ පරිපාලන බාරව සිටි ගරු පියතුමන්ලා කිහිප දෙනෙකු විසිනි. එම අවමඟුල් උත්සවය සංවිධානය කිරීමේ දී ගන්නා ලද ආරක්ෂක විධි විධාන පල්ලියේ අනුග්‍රහය ඇති ව සිදුවූයේ යැයි පැවසීම සත්‍යවාදී නොවන බව ද මම දන්වා සිටිමි.

මන්ද එයට හේතුව ආරක්ෂක විධිවිධාන සංවිධානය කිරීම ආරක්ෂක අංශ වල වගකීම වීමයි. සභාව කියා සිටියේ මෙම සිද්ධිය තුළින් තවත් ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීමට ඉඩනොදී සාමකාමී ලෙස එම මියගිය තරුණයාට ගෞරව දක්වමින් අවසන් කටයුතු සිදුවිය යුතු බවය. එම කාලයේ දී පදවිය පරිපාලනය කළ පියතුමන්ලා මෙම ප්‍රතිපත්තියෙහි පිහිටුවා කටයුතු කළ බව පැහැදිලි ය. එහි වරදක් මට නම් නොපෙනේ.

මීගමුව කලපුවේ seaplane සඳහා පිඹුරුපත් සකස් කරමින් සිටි රජයට සියල්ලන්ට පළමුව කතෝලික සභාව විසින් විරෝධතාවය පළකරන්නට කටයුතු කළ බව බොහෝදෙනා නොදන්නවා විය හැක. seaplane ව්‍යාපෘතිය මඟින් මඩබොක්ක යන මත්ස්‍ය ජනනයට ප්‍රසිද්ධ වූ ප්‍රදේශය අවහිරවීම ගැන මා විසින් රජයේ ඉහල තනතුරු හොබවන්නන් දැනුම්වත් කරන ලද්දේ ඒ පිළිබඳව ධීවර ජනයාගෙන් විමසීමෙන් පසුවය. එහෙත් රජය ඒ තුළම කටයුතු කිරීම මඟින් එම ප්‍රදේශයේ ධීවර ජනතාවට සිදුවූ අපහසුතාවය නිසා විරෝධතාව වර්ධනය වූයෙන් රජය එය කිඳිගොඩ ප්‍රදේශයට ගෙනගියේ ය. එයට ද සභාවට දොස් පැවරීම සාධාරණ නොවේ.

උතුරු නැගෙනහිර ප්‍රශ්නය පිළිබඳව ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩලය සිය එඬේරික ලිපිය මඟින් ඉදිරිපත් කළ සාමූහික යෝජනා මඟින් උතුරටත් දකුණටත් පිළිගත හැකි සාමයේ ක්‍රියාදාමයන් ක්‍රියාවට නැංවීම තුළින් ජාතීන් අතර එකමුතුකම ඇති කරලීමට හැකි බව පැහැදිලිය. එහෙත් ඒවා ක්‍රියාවට නංවනු වෙනුවට අන්තවාදීව ක්‍රියා කිරීම තුළින් දෙපාර්ශවයම සාමයට බාධා පමුණුවන බවට කණගාටුවෙන් වුව ප්‍රකාශ කළ යුතු වේ. මේ ප්‍රශ්නයේ දී 'අපි දිනුම්' 'ඔබ පැරදුම්' යන න්‍යාය පසුපස හඹා යනු වෙනුවට 'අපි සැවොම දිනුම්' යන න්‍යාය අනුගමනය කිරීම අප කාගේත් යුතුකම වේ. එසේ කිරීම වෙනුවට අන්තවාදී ව කටයුතු කරමින් සාමයට බාධා කිරීම පිළිගත හැකි ක්‍රියාදාමයක් නොවේ. කතෝලික රදගුරු මණ්ඩලය මේ පිළිබඳව විවිධ අවස්ථා වලදී දැක් වූ අදහස් අදාල පාර්ශවයන් පිළි නොගැනීම ඇත්තෙන්ම කණගාටු දායකය.


මෙම ලියවිල්ල ලිවීමේදී එකී ලියුම්කරු විසින් සෘජුව හෝ වක්‍රව සභාවට සාවද්‍ය ලෙස දොස් පැවරීම කර ඇත. එබැවින් සභාව පිළිබඳ වැරදි හැඟීමක් මෙය කියවීම මඟින් ඇති විය හැක. සිදුවූ දේ ඒ ආකාරයෙන් වාර්තා කිරීම මිස එකිනෙකා මවාගත් මිත්‍යා මත අනුව එකිනෙකාට චෝදනා කිරීම දසපනතේ 8 වන පනතට විරුද්ධ වන බව ද ප්‍රකාශ කරමි. එබැවින් මේ වැරදි අර්ථ කථනයන් ප්‍රතික්ෂේප කරමින් ඒවා නිවැරදි කරන්නට මෙසේ ලියමි. ස්තුතියි.

**ජේසු පිහිටයි !**

**අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ**
කොළඹ අගරදගුරු

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත

" මා සමඟ නුඹලාට පැයක්වත් අවදිවී සිටීමට නොහැකිද?"



# තරුණ තරුණියන්ගේ පාදනමස්කාර මෙහෙයක්

කුරුණෑගල පදවියේ ඉරබඩගම මීසමට අයත්, ඉරබඩගම හෙට්ටිරිප්පුව හා මුතුගලයාගම දෙව්මැඳුරු තුනේ තරුණ සමිතිවලට අයත් තරුණ තරුණියන් එකට එක්ව මහා පාදනමස්කාර මෙහෙයක් හෙට්ටිරිප්පුව ශුද්ධ වූ රෝගුස් මුනිඳුන්ගේ දෙව්මැඳුරු පරිශ්‍රයේදී පවත්වන්නට යෙදුනි.

මධ්‍යහ්නයේ විශාල ශ්‍රී කුරුසිය කරතබාගෙන ගමන්ගත්මෙම පාදනමස්කාර මෙහෙය ප්‍රැන්සිස්කාන තෙවන නිකායේ ගරු එමසි ප්‍රියශාන්ත පියතුමන්ගේ හරබර දේශනයන්ගෙන් යුතුව පැය දෙකහමාරකට අධික කාලයක් පුරා ගමන් ගත් අතර සංවිධානය කිරීම, පදවි කුඩා කිතුනු සේවා අධ්‍යක්ෂ හා ඉරබඩගම මීසම් සේවක ගරු හිලරි රූපස් තැලිස් පියතුමාගේ මඟපෙන්වීම ඔස්සේ ඉරබඩගම මීසම් සංඝයේ තරුණ තරුණියන් විසිනි.

**ජී. බී. එච්. ලිවේරා**

# ශ්‍රී කුරුස වන්දනාව මෙවරත් කුරුණෑගල පදවියේ

"ශ්‍රී කුරුස වන්දනාව" කුරුණෑගල පදවිය තුළ සංවිධානය වේ. ගෙයින් ගෙට යමින් මීට පෙර වසර වල සිදුකළ මේ භක්ති අභ්‍යාසය තුළින් ලැබූ දේව වරප්‍රසාද වලට ජනතාව අත්දැකීමෙන් සාක්ෂි දරති.

පදවියේ කුඩා කිතුනු සංඝ අධ්‍යක්ෂ ගරු රූපස් හිලරි පියතුමන්ගේ මඟපෙන්වීම මත මීසම් සේවක පියවරුන්ගේ සහයෝගයෙන් පදවියේ දේවස්ථාන වලට අයත් කුඩා කිතුනු සංඝ තුළ මේ සඳහා ජනතාව උද්යෝගයෙන් එකමුතුවෙති.

**ප්‍රිස්කා සුමුදිනී**

# 'කුරුසියේ හඬ' කොටුගොඩ දී

පසන් ලතෝනි ගායනා, නැවතත් කරලියට ගෙනඒමට කොටුගොඩ මීසම් ජනතාව මේ දිනවල සූදානම් වෙමින් සිටී. ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ දුක්ප්‍රාප්ති සහ පසන් පොත් ඇසුරෙන් ලෝකය මැවීමේ සිට කිතු සමිඳුන්ගේ උත්ථානයේ විජයග්‍රහණය දක්වා පසන් ලතෝනි ගායනය සමඟින් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියේ විවිධ අවස්ථා රංගනයෙන් ඉදිරිපත් කෙරෙන 'කුරුසියේ හඬ' පාස්කු දර්ශනය අප්‍රේල් 13 ඉරිදා සවස 6.00 ට අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මැනුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කොටුගොඩ ශු. කයිතානු මුනිඳුන්ගේ දේවස්ථාන භූමියේදී රඟදැක්වෙනු ඇත.

කොටුගොඩ සහයක ගරු ජූඩ් සුරේස් රංගන පියතුමන්ගේ සහ කිංස්ලි නිකුලස් අප්පුහාමි මහතාගේ කතා පිටපත් හා අධ්‍යක්ෂණයෙන් නිර්මාණය වන අතර මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමා අනුශාසක දායකත්වය ලබාදෙයි.

**මැල්කම් සිල්වා**

# වාර්ෂික චතාරික වන්දනා චාරිකාව

වත්තල ගල්වැටියේ ශු. ජපමාල රාජේශ්වරියගේ සංගමයේ වාර්ෂික චතාරික වන්දනා චාරිකාව දෙවන වතාවටත් හිනිදුම කල්වරි පුදබිම වෙත පසුගිය දා වත්තල සා. අන්තෝනි විදුහලේ විදුහල්පති ගරු මාල් වර්ණශාන්ත ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සාමාජික සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් ගමන් කළහ.

**ක්ලැරන්ස් ලෙනාඩ්**

# නාගොඩ සුබ සාධක සංගමයේ 25 වන සංවත්සරයට නැති බැරි අයෙකුට හිසට සෙවනක්



වැලිසර - නාගොඩ එක්සත් සුභ සාධක සංගමය සිය 25 වන සංවත්සරය සමරන්නට සූදානම් වනුයේ ප්‍රදේශයේ ඉතා දිළිඳු අසරණ අයෙකුට හිසට සෙවනක් ලබාදීමට ක්‍රියා කරමිනි. රු. ලක්ෂ අටකට ආසන්න මුදලක් වැය වන මෙම සත් ක්‍රියාව සඳහා සංගමයේ සාමාජිකයෝ සිය දායකත්වය ලබාදෙති. මෙයට අමතරව පාසල් දරුවනට පොත් පාර්සල් 100 ක් හා වියළි ආහාර ද්‍රව්‍ය මළු 200 ක් ප්‍රදානය කිරීම ද සිදුවනු ඇත.

1989 අප්‍රේල් 6 ආරම්භ කරන ලද මේ සංගමයේ 25 වන සංවත්සරය යෙදෙනුයේ චතාරික සමයේ බැවින්, සුබ සාධක සංගමයේ සංවත්සර දිව්‍ය පූජාව ලබන අප්‍රේල් 27 වන දින සිදුකිරීමට නියමිතය.

සෑම වසරකම නිදහස් දින සැමරුම සංවිධානය කිරීම, මීසමේ වාර්ෂික මංගල්‍යයේදී ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ ප්‍රතිමාව රැගෙන යන රථය නිර්මාණය කිරීම, වසර අවසානයේ ප්‍රදේශයේ පාසල් දරුවනට අභ්‍යාස පොත් ප්‍රදානය කිරීම හා සංගමයේ බෞද්ධ සාමාජිකයින් සිටින නිසා ආගමික සහජීවනය අරබයා සෑම වසරකම වෙසක් උත්සවය වෙනුවෙන් වියළි ආහාර ද්‍රව්‍ය මළු පරිත්‍යාග කිරීම යන සමාජ සත්කාරයන් ද සිදුකෙරේ.

මෙහි ආරම්භක සභාපති ලෙස ෂෙල්ටන් කුමාරසිංහ මහතා ද ආරම්භක ලේකම් ලෙස මිල්රෝයි මෙන්ඩිස් මහතා ද කටයුතු කළහ. වත්මන් ආත්මික අධ්‍යක්ෂ නාගොඩ මීසම් සේවක ගරු රන්ජන් සිල්වා පියතුමාගේ මඟපෙන්වීම හා සහයෝගය මත සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික ලෙස පිළිවෙලින් චාල්ස් විජේගුණවර්ධන, චමින්ද විතානගේ හා ප්‍රියන්ත මල්ලවාරච්චි මහත්වරු ක්‍රියා කරති.

**ඩී.ඩී. මේරි රීටා**



හලාවත ආසන දෙව්මැඳුරේ කතෝලික සංස්කෘතික සංසදයේ සභාපති රංජිත් නිමල් කුරේරා සම්පාදනය කළ අභාවයට ගිය හලාවත කතෝලික දෙමළ නාඩගම් කලාව පොත් පිංච කතෝලික සංස්කෘතික සංසදයේ රැස්වීමේදී හලාවත මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් ප්‍රනාන්දු පියතුමාට පිළිගැන්වූ අයුරු. හලාවත නගරාධිපති හිලරි ප්‍රසන්න ප්‍රනාන්දු මහතාටද පොත් පිංච පිළිගැන්විණි.

**පර්සි ප්‍රනාන්දු**

# විසෙන්ති පාවුලා චතාරික ධර්ම විවේකයක්

හලාවත පදවි වින්සන්ද පාවුලා සමිති අධ්‍යක්ෂ ගරු කුවින්ටස් ප්‍රනාන්දු පියතුමන්ගේ හා මධ්‍ය මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් හලාවත දිසාවේ කොන්පරන්ස සාමාජික සාමාජිකාවන් සඳහා එක්දින චතාරික ධර්ම විවේකයක් පසුගියදා හලාවත ඇඳුරු ඔය සා. ජූඩ් දේවස්ථානයේදී පැවැත්විණි.

එම දිසාවේ කොන්පරන්සවල සාමාජික සාමාජිකාවන් සියයකට ආසන්න සංඛ්‍යාවක් මෙ සඳහා සහභාගිවූ අතර ගරු ජස්ටින් වර්ණකුල පියතුමා දේශන පැවැත්විය.

**කේ. නිහාල් ප්‍රනාන්දු**

# කළුතර දිසා පාදනමස්කාරය අද

කළුතර දිසා වාර්ෂික චතාරික පාදනමස්කාරය, අප්‍රේල් 6 ඉරුදින (අද) පෙරවරු 8 ට, දියලගොඩ ගාළුපාර මංසන්ධියෙන් ආරම්භ වී මග්ගොන කල්වාරිය දක්වා ගමන් කිරීමෙන් පසු දිව්‍ය පූජා මෙහෙය පැවැත්වේ. කළුතර දිසානායක, ගරු ජූලියන් තිසේරා පියතුමා සමග දිසාවේ පියවරුන් විසින් මෙය සංවිධානය කරනු ලබති.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



කටුපොත සා. විසෙන්තිද පාවුලා කන්ෆරන්සයේ 15 වන වාර්ෂික මහා සභා රැස්වීම කටුපොත 'ඔසානාම් නිවසේදී ආත්මික අනුශාසක ගරු අනිල් මාකස් පියතුමන්ගේ මූලිකත්වයෙන් පවත්වන ලදී. මෙදින නව නිලධාරීන් වශයෙන් ඔස්ටින් කැෂ්මීයර් සභාපති සීතා වේරගොඩ, භාණ්ඩාගාරික ශ්‍රියානි බර්නඩෙත් තවදුරටත් ලේකම් ලෙසද පත්වීම් ලැබූහ. එහි සාමාජික සාමාජිකාවන් ප්‍රදීප කැමරාවට පෙනී සිටි අයුරු.

# මග්ගොන ජාතික කල්වාරි පුදබිම

පුදබිමක අසිරිය

ශ්‍රී ලංකාවේ ඉපැරණිම කල්වාරිය ලෙස සැලකෙන මග්ගොන ජාතික කල්වාරි පුදබිම, බොහෝ බැතිමතුන්ගේ ජනාදරයට පත්වී ඇති වන්දනා ස්ථානයකි. අළු බදාදායින් ඇරඹෙන චතාරික සමය තුළ, මෙම කල්වාරියට දහස් සංඛ්‍යාත කිතු බැතිමත්හු පැමිණ තමන්ගේ චතාරික වත් පිළිවෙත් ඉටුකර ගන්නට අමතක නොකරති. මෙම වන්දනා ස්ථානයේ අතීතය පිළිබඳව සලකා බලන කල 1891 දී නිමල මරිය නිකායේ පියවරුන් සාන්ත විසෙන්ති නිවාසය පාලනය කිරීමට 'බාරගත්' අතර, එවකට සිටි රදගුරු තුමාගේ මූලිකත්වයෙන් ඉහතකී ආයතනයේ පාලනය, ගරු චාල්ස් කොන්රඩ් පියතුමාට පැවරුනි. එමෙන්ම, මෙම ආයතනයේ විසූ ගරු ජෝසප් ගොන්සාල්වේස් ස්වදේශීය ප්‍රැන්සිස්කානු සහෝදර තුමා විසින්, මෙම කල්වාරිය නිර්මාණය කිරීම සඳහා ළමා නිවාසය හා චරිත ශෝධනාගාරයේ දරුවන්ගේ සහයෙන්, මහ වනය එළි පෙහෙළි කර, කඳු මුදුනේ බැම්මක් හා විශාල ලී කුරුසයක් සිටුවා, ස්ථාන 13 කට කුඩා ලී කුරුස සිටුවා, පාදනමස්කාරය කිරීමට හැකිවන අයුරින්, කල්වාරියේ වැඩ කටයුතු සෑහෙන අන්දමකට නිමා කරන ලදුව, එවකට පාලකව සිටි, ගරු ඉසිදෝර් බෙල් නි.ම.නි පියතුමා විසින්, වසර 1900 දී මෙම කල්වාරිය ආසිරි ගන්වා, ප්‍රථම මංගල දිව්‍ය පූජාව සිදුකරන ලදි.

වසර 1905 දී ගරු බෙල් නි.ම.නි පියතුමා රෝමයට ගිය අවස්ථාවේදී මග්ගොන කල්වාරියට, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන ප්‍රමාණයෙ ලෝකඩ ප්‍රතිමාවක අවශ්‍යතාව තිබූ බව දැනගත් හෙයින්, රෝම නුවරින් එම ප්‍රතිමාවක් ලබා ගැනීමට එතුමාට හැකිවිය. වසර 100 ටත් වඩා පැරණි අතීතයක් ඇති එම ලෝකඩ ප්‍රතිමාව, අදත් මග්ගොන කල්වාරි කඳුමුදුනේ පිහිටුවා ඇත. මේ අන්දමින් මෙම කල්වාරියේ ඉතිරි වැඩ කටයුතු නිම කිරීම සඳහා, බොහෝ පරිත්‍යාගශීලින් දායකවූ අතර, එවකට සාන්ත විසෙන්ති ආයතනයේ කළමනාකාර තනතුර හෙබවූ පරලෝ සැපත් ගරු ඩී. ඇලෝසියස් දසනායක පියතුමා සහ ගරු දොන් මර්සලින් හා ජෝන් මනුවෙල් ප්‍රනාන්දු. සහෝදරතුමන්ලාගේ ශ්‍රම දායකත්වයෙන් මෙම කල්වාරිය අංගසම්පූර්ණ වන්දනා ස්ථානයක් බවට පත්කරවන ලදී. වන්දනා කරුවන් සඳහා අවශ්‍ය වැසිකිළි, ජලනල, විදුලිය, විශ්‍රාමශාලා, ආපනශාලා ආදියෙන් සම්පූර්ණ කර, වසර 1965 මාර්තු මසදී එවකට ගාලු රදගුරු අතිඋතුම් ඇන්තනි ද සේරම් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.



කොළඹ වෙළෙඳ ව්‍යාපාරික මහතකුගෙන් ලැබුණු මුදල් පරිත්‍යාග යකින් කල්වාරියේ ගල් ලෙන් වැඩ කටයුතු නිමා කොට, එය ගරු ඇලෝසියස් දසනායක නි.ම.නි පියතුමා විසින්ද, 1966 වර්ෂයේ මාර්තු මසදී නව ජෙත්සෙමෙනි උයන අගරදගුරු පදවියේ අනුනායක, අතිගරු බැසිල් වීරතුංග පියතුමා ආසිරි ගන්වා විවෘත කළ අතර කල්වාරියට අඩුවක්ව පැවති මහ සිකුරාදා තුන්පැය ධ්‍යානය සඳහා උපයෝගිකර ගන්නා ප්‍රතිමාව හා ලී කුරුසය, ගරු මයිකල් කෲස් පියතුමන්ගේ පාලන කාලයේදී ලබා ගැනීමට හැකිවිය. කල්වාරියේ 75 ජයන්ති සමරු උලෙළ ශුද්ධාසනයේ ශ්‍රී ලංකා නියෝජිත අතිඋතුම් කාර්ලෝකුරිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

වසර 114 ක අතීතයකට හිමිකම් කියන, මග්ගොන ඓතිහාසික කල්වාරිය, ජාතික පුදබිමක් ලෙස 2008 වසරේදී රජය විසින් ප්‍රකාශයට පත්කරන ලදි. වත්මන් අධ්‍යක්ෂ. ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි පියතුමන්ගේ මූලිකත්වයෙන් ගරු අජිත් පෙරේරා, ගරු ඇන්තනි ජයමාන්න යන පියතුමන් ඇතුළු නිමල මරිය නිකායේ සංවිධානයෙන් මෙහි පැමිණෙන වන්දනා කරුවන් සඳහා අවශ්‍ය සෑම පහසුකමක්ම ලබාදීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර ඇත.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



ඉතාලිය, මිලානෝවට ආසන්න වරේසි නම් නගරයේ ලෙන්ඤද්ඤදානෝ ප්‍රදේශයේ හා කස්ටෙල්ලාන්සා ප්‍රදේශයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකික බැතිමත් කිතුනු සංඝය මගින් වසර හයකට ආසන්න කාලයක් මසකට වරක් පවත්වනු ලබන සිංහල දිව්‍ය පූජා යාගය ගරු මැල්කම් පෙරේරා පියතුමන්ගේ අනුශාසකත්වයෙන් පවත්වනු ලබයි. මෙම දිව්‍ය පූජා යාගය ආරම්භයේ පටන් මේ දක්වා සියලු සංවිධාන කටයුතු මෙහෙයවනු ලබමින්, සාර්ථක මෙහෙවරක් ශ්‍රී ලංකා වාසි සැමට හා ගරු පියවරුන් හට ලබා දෙමින් කටයුතු කර විශ්‍රාම ලබා දිවයිනට යන කඳවල ලයනල් කරුණානායක මහතා හා ශ්‍රියානි කරුණානායක මහත්මියට කෘත ගුණ සලකමින් තුති පිදීමේ දිව්‍ය පූජා මෙහෙයක් ගරු මැල්කම් පෙරේරා පියතුමන් විසින් පවත්වනු ලැබූ අයුරු.

**සිල්වෙස්ටර් කැනීසියස් ප්‍රනාන්දු**



දයාවේ සේවයට අමතරව 'ඥානාර්ථ ප්‍රදීපය', 'ළමා ප්‍රදීපය'. 'ඥානඔලි' අප කතෝලික සඟරාවන්අලෙවියේ වසර ගණනාවක් තිස්සේ යෙදී සිටින පේරාදෙණියේ ශ්‍රී කුරුසියේ කන්‍යාරාමයේ ගරු මර්ලින් ජයතිලක පැවිදි සොයුරියට අපේ සුපැතුම්!

**ජූඩ් ජේ. ප්‍රනාන්දු**

# සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා!

**දෙවියන් වහන්සේගේ ශුද්ධවූ, වෙනස් වූ භයානක වූ ප්‍රේමය අනාවරණය වූ අති සුවිශේෂ වූත්, සතිය හෙවත් ගොබ් ඉරුදින සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකයාගේ ගමන කුමක් ද යන්න පැහැදිලි වෙන ක්‍රිස්තුන් වහන්සේගේ විමුක්තිදායක ගමන හෙවත් එතෙරවීමේ ගමනේ සත් දින චාරිකාවේ ආරම්භයයි.**



ජුදා සම්ප්‍රදාය අනුව පාස්කු මංගල දිනය ආසන්න වෙත් ම එම ජනතාව ජෙරුසලම කරා යන වන්දනා ගමනට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ද එක්වුණා විය හැකිය. ඔවුන් වහන්සේ තම ශ්‍රාවකයන් කැටුව ජෙරුසලමට ලංව ඔලීව කන්දට නුදුරුව බෙත්පාගයට හා බෙතානියට පැමිණියහ. (ශු. මාක් 11:1).

ඉදිරියේදී කළයුතු දේ තම ගෝලයනට පවසන්නේ ආලෝකමත් අවදිවීමෙන් බව පෙනේ. රාජකීය ලීලාවෙන් දෙන විධානය හා කොටළු දෙනක පිට නැගී ගමන් කරන විලාසය දුටුවන් ප්‍රීති ප්‍රමෝද වී හෝසන්නා! හෝසන්නා! යනුවෙන් කළ මොරගැසීම නිහඬ කිරීමට කිසිවෙකුට නොහැකි විය. හෝසන්නා! සමිඳුන් නාමෙන් වඩින උතුමාණන් හට ආසිරි වේවා! සමිඳුන් නාමෙන් වඩින උතුමාණන් හට ආසිරි වේවා! අති උසස් තන්හි හෝසන්නා! (ශු. මාර්ක් 11:9-10) සමහර පරිසිවරුන්ට මෙය දරාගන්නට බැරි වූ නිසා ප්‍රශංසා කරන ජනතාව නිහඬ කරන්නැයි සමිඳාණන් වහන්සේගෙන් ඉල්ලූහ. "මොවුන් නිහඬ වුවහොත් ගල් පවා මොර ගසනු ඇතැයි ඔවුන් වහන්සේ වදාළ සේක"

දෙවි පියාණන් වහන්සේව මහිමයට පත් කිරීමේ පැය ආරම්භ වෙයි. එකින් එක සිදුවීම් හා ඔවුන් වහන්සේගේ ඇතුළාන්ත අත්දැකීම අතිශයින්ම වැදගත් ය. වෛරයකට,කෝපයකට හෝ තමා පිළිබඳව ස්ව අනුකම්පාවට යට නොවී මුහුණ දෙන සෑම සිදුවීමක් හරහා ම ජේසුස් වහන්සේ පාස්කුවක් හෙවත් එතෙර වීමක් අත්දකින සේක.

සිටින තැනින්, සිටිය යුතු තැනට එතෙර වීම, වෛරය නිහින තැනින් ප්‍රේම කරන තැනට එතෙරවීම පාස්කුවයි. පැරණි ජුදා පාස්කුව අභිබවා යන මහා පාස්කුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරණය පරදා උත්ථාන වීමේ පාස්කුවයි.

තවද ප්‍රසාද ස්නාපනය තුළින් අප ලබා ඇති කැඳවීමට මුල්වන ජේසුස් ක්‍රිස්තුන් සමිඳාණන්ගේ පාස්කු අත්දැකීම අප ජීවිතයේ එදිනෙදා සිදුවීම් හරහා එතෙරවීමක් අවස්ථාවක් නොවන්නේ නම් අප ගත කරන කිතුනු දිවිය අර්ථයක් නැති ජීවිතයක් වෙයි. ජීවිත ගමනේ සාර්ථක අසාර්ථක සියළුම සිදුවීම් හරහා අපව මෙහෙයවන බලවේගයන් කර නොගෙන ඒවා තුළින් පාස්කු අත්දැකීමට සහභාගි වන්නට ගමනක් යා යුතුව තිබෙන බව පවසන දිනයකි ගොබ් ඉරිදා.

නින්දා කිරීම, පහරදීම, පමණක් නොව මරණයට තීන්දු කරනු ලැබීම පවා දරා ගැනීමට ඔවුන් වහන්සේට හැකිවීමේ රහස නිරන්තරයෙන්ම පියාණන් වහන්සේ අභිමුව සිටීමේ හැකියාව වූයේ නිරන්තර යාච්ඤාවයි. පීඩාවට පත්වූවන් ශක්තිමත් කරන ගුරුවරයකු මෙන් ක්‍රියා කරන්නට මඟ පෙන්වන්නට පෙර හැම උදයකම මහෝත්තම දෙවි පියාණන් අභිමුවට යාමට තමන් වහන්සේ තුළ තිබුණු ඇතුලාන්ත පිපාසය කිසිවිටෙක ජේසු සමිඳාණෝ ඉවත නොදැමූ සේක. තම දුක් ගැනවිලි, කොඳුර කොඳුරා පැවසීම නොව පියාණන් වහන්සේට සවන් දීම හා ඔවුන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයට අවදිව සිටීමේ දීමනාව ආලෝකවත් අත්දැකීමකි. අන් අයට නොපෙනෙන වෙනම ම විශ්වාසයේ තලයකට පිවිසීම යාච්ඤාවේ අත්දැකීමයි. කලකිරීම, සානුකම්පාවට බරවීම ලැජ්ජාවෙන් මුහුණ සඟවා ගැනීමට වඩා දේව පුත්‍රභාවයේ අභිමානය අත්විඳීම උත්ථානයේ පෙර නිමිත්තකි.

2014 වසරේ ශුද්ධවූ සතිය තව නොබෝ දිනකින් ආරම්භ වෙයි. සතළිස් දින ඥානකාන්තිය පුරාවට ගැඹුරු ආධ්‍යාත්මික ශක්තියක් ලැබූ අප ජේසු සමිඳාණන් වහන්සේ සමඟ ඔවුන් වහන්සේගේ අත්දැකීමට සහභාගිවීමට ශුද්ධවූ සතියට පිවිසෙමු. එය ගමනකි. එම ගමන ජීවිතයේ අප යන ගමන හා කෙසේ සම්බන්ධ කරගත යුතු දැයි අවදි කරන්නට ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පතා යාච්ඤා කරමු.

**✍ ටී. එච්. අජිත් ශාන්ත**
**බොරලැස්ස**




**ගොබ් ඉරිදායින් ශුද්ධවූ සතිය ඇරඹෙයි. ගොබ් ඉරිදා යනුවෙන් අදහස් කරන්නේ ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් කොටළුවකු පිට නැග ජෙරුසලමට ඇතුළු වී ඔවුන් වහන්සේගේ දුක්විඳීම, මරණය, තැන්පත් කරනු ලැබීම හා අභිරහස්මක උත්ථානය පිළිබඳ සිහිපත් කරන ජනවන්දනා චක්‍රයේ සුවිශේෂ වූ සතියට පිවිසීමයි.**

# දුක්බෝත්සව ඉරුදින හෙවත් ගොබ් ඉරුදින

ස්පාඤ්ඤ ජාතික එජේරියා නමැති කුලවත් කාන්තාවගේ දින පොතෙහි ඇය ජෙරුසලම් නගරයේ වන්දනාව සඳහා පැමිණි කාල වකවානුව තුළ ක්‍රි.ව. 381 -384 දක්වා අත්දුටු ජනවන්දනා පිළිවෙත් අපට මැනවින් විස්තර කරයි. ඇයගේ වාර්තාවන් වලට අනුව මෙකී කාල වකවානුව වන විටත්, ශුද්ධවූ පාස්කුව සැමරීමට මත්තෙන් එළඹෙන ඉරිදා දින ජෙරුසලමේ සිට කිතුනුවන් ඔලිව් කන්දට නැග, උදයවරුවේ දේව වචනය මෙනෙහි කොට, සවස් යාමය වන විට තාම් අතු හෝ ඔලිව් අතු රැගෙන පෙරහරින් ජෙරුසලෙම් නුවරට ඇතුළු වී ඔවුන්ගේ පාස්කු චාරිත්‍ර සිදු කරනු ලබයි. පෙරදිග අනෙකුත් සභාවන් ද මෙම චාරිත්‍රය අනුගමනය කරන්නට පටන් ගත්හ. ක්‍රි.ව. 600 පමණ වන විට ප්‍රංශයේ හා ස්පාඤ්ඤයේ ගොබ් ඉරුදින යන නාමය භාවිත කරන්නට පටන් ගති. තාම් අතු හෝ වෙනත් අතු ආශිර්වාද කිරීමේ චාරිත්‍රය ඇරඹුනේ අටවන සියවසේ අගභාගයේ දී ය. ආශිර්වාද කරන ලද ඔලිව් අතු පෙරහරින් රැගෙන යාමේ දී දුෂ්ඨාත්මයන් පලවා හැරීමේ බලයක් අන්තර්ගත වී යැයි විශ්වාසයක් මෙකී කාලය තුළ ජෙරුසලමේ බැතිමතුන් අතර පැවතුනහ. එම නිසා ඒවා නිවෙස් වලට රැගෙන ගොස් නිවෙස්වල ප්‍රධාන ස්ථානවල රඳවන ලදි. එවැනි චාරිත්‍රයකට සභා අනුමැතිය ද පසුව ලැබුණි.

වත්මන් සභා නීතිය අනුව ගොබ් ඉරුදින දේව මෙහෙය කොටස් දෙකකින් සමන්විතය. ක්‍රිස්තුන් වහන්සේ රජෙකු ලෙස පැමිණෙන ජය ශ්‍රී පෙරහර සිහිපත් කිරීම හා ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය කියවීම විශ්වය තුළ සෑම දේවස්ථානයකම සිදුවේ. කිතුනුවන් ආශිර්වාද කරන ලද ගොබ්කොළ රැගෙන එය ඉහළට ඔසවාගෙන පෙරහරින් "හෝසන්නා" "හෝසන්නා" ක්‍රිස්තු රජාණන්ට හෝසන්නා යනුවෙන් උච්චාරණය කරමින් බැති සිතින් දේවස්ථානයට ඇතුළු වෙයි. "හෝසන්නා" යනු හිබෲ වචනයකි. එහි අර්ථය දෙවියන් වහන්සේ අප ගලවන සේක යන්නයි. මෙම ගොබ් කොළ වලින් කුරුස සාදා නිවෙස්වල උළුවහු, ජනේලවල ආරක්ෂාව මත රඳවා තබා වසරකට පසු ඒවා නැවත එකතු කර දේවස්ථානයට රැගෙන ගොස් එය ආශිර්වාදකර පුළුස්සා මිනිසාගේ නළල මත ආලේප කරනු ලබයි. එදිනට අපි අළු බදාදා යනුවෙන් නම්කර මිනිසාගේ මරණය ගැන සිහිපත් කරනු ලබයි.

ජේසුස් ස්වාමින් වහන්සේ අවස්ථා තුනකදීම තමන් වහන්සේගේ මරණය ගැන කලින් දැන් වූ සේක. (ශුද්ධ ලියවිල්ලෙහි මාක් 8 පරි. 31-33, 9 පරි. 31-32, 10,32-33) එවිට උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන් බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මූලිකයන්ද, විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නටත් මරනු ලබන්නටත් තෙදිනකට පසු නැවත නැගිටින්නටත් නියම බව ඔවුන්ට උගන්වන්නට පටන් ගත් සේක. උන්වහන්සේ මෙය ගැන ප්‍රසිද්ධියේම කතා කළ සේක. එකල පේදුරු උන්වහන්සේ පසෙකට ගෙන, උන්වහන්සේට තදින් චෝදනා කළේය. උන්වහන්සේ හැරී සිය ශ්‍රාවකයන් දෙස බලා පේදුරුට තදින් චෝදනා කරමින් සාතන් අහකට යව, නුඹ සිතන්නේ මිනිසුන් සිතන විදියට මිස, දෙවියන් වහන්සේ සිතන විදියට නොවේය"යි වදාළ සේක.

දුක්ප්‍රාප්තිය ගැන සිහිකරන විට උන්වහන්සේට සිදුවන සියළුම දේ උන්වහන්සේ දැන සිටී. "සැබවින්ම මම ඔබට කියමි. ඔබෙන් කෙනෙක් මා පාවා දෙන්නෙහිය"යි වදාළ සේක. ඔව්හු අතිශයින් ශෝකව එකිනෙකා "ස්වාමිනි ඒ මම දැයි අසන්න පටන් ගත්හ. උන්වහන්සේ උත්තර දෙමින් "මා සමඟ එක පාත්‍රයේ අතලන තැනැත්තේ මා පාවා දෙන්නෙහිය" මනුෂ්‍ය පුත්‍රයාණන් ගැන ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙන ලෙසම ඔහු නියමිත ගමන යන්නේ ය. එසේ දේව අණට කීකරුව දේව කැමැත්තට හිස නැමූ සමිඳාණන් පාපී අප වෙනුවෙන් කුරුස ගස මත දිවි පුද දුන්නේය.

**✍ මයිකල් සෝමරත්න**
**රන්පොකුණගම**

## චතාරික සමය තුළින්

# සැබෑ ජීවිත වෙනසක්

**කිතුනුවන් වන අපට චතාරික කාලය සැබෑ මනස්ථාපනයක් තුළ ජීවිතය වෙනස් කර ගත හැකි ඉතා වටිනා ආශිර්වාදාත්මක කාලයක් වන අතර මෙය දෙවියන් වහන්සේගෙන් අප ලබන විශේෂ දේව දීමනාවකි.**

පවුලේ පියෙක්, මවක්, හෝ දරුවකු වශයෙන් අපගේ එදිනෙදා වගකීම් සහ යුතුකම්, මෙනෙහි කරමින් අප ගත කළ ජීවිතයත් දැන් ගත කරන ජීවිතය සහ ඉදිරියේදී අප ගත කිරීමට බලාපොරොත්තු වන ජීවිතයත් හරි මඟ යොමු කිරීමට හා අප ජීවිත ශුද්ධවන්ත කර ගැනීමටත් අපට ලැබී ඇති කාලයකි මෙම චතාරික කාලය.



මේ කාලය තුළ අපෙන් බොහෝ දෙනා විවිධ ආගමික වත් පිළිවෙත් වලට සහභාගි වේ. මේවා අතර පාද නමස්කාර මෙහෙයයන්, විශේෂ චතාරික වැඩසටහන් සහ චතාරික වන්දනා ගමන් ආදියට ප්‍රමුඛතාවයක් දක්වමින් සහභාගි වෙනවා දැකීම සුලභ දර්ශනයයි.

මේ සෑම දෙයක්ම ජීවිතයේ ආධ්‍යාත්මය ගොඩනඟා ගැනීමට උපකාර වන නමුත් අප තුළ සැබෑ වෙනසක් ඇති කර නොගතහොත් අපි පතන පූර්ණ වෙනසක් අත්දැකිය නොහැකිය. අප ජීවිතය වෙනස් කර ගැනීම සහ ගොඩනඟා ගැනීම අප තුළින්ම සිදුවිය යුතුය.

මත්පැනට ඇබ්බැහි වූ අයෙකු මනස්ථාපනය තුළින් මේ චතාරික සමයේ ඉන් වැළකී සිටීමට අධිෂ්ඨාන කරමින් එසේ වැළකී සිටිමින් මේ කාලයෙන් පසුව නැවත පෙර සේම සුපුරුදු විධියට මත්පැන් වලට ඇබ්බැහිවේ නම් ජීවිතයේ සැබෑ වෙනසක් අත්දැකිය නොහැකිය.

අප රැකියාව කරන ස්ථානය තුළ අප යන එන ගමන් මඟ තුළ අපගේ එදිනෙදා ජීවිතය තුළ අප වෙනස් විය යුත්තේ වෙනස් වීමකට උත්සාහ කළ යුත්තේ විශේෂයෙන් මේ චතාරික සමය තුළය.

☛ 15 පිටුවට

**✍ ඇල්. ඩී. පැට්‍රික්**
**නඳුරුපිටිය**

# මගේ පුතුනි, පෙම් කරන්න

පෙම් කරන්න පෙම් කරන්න එකිනෙකාට පෙම් කරන්න
තම තමාට ප්‍රේම කරන ලෙසට සැමට පෙම් කරන්න
මිතුරන් හට පමණක් නොව සතුරන්ටත් පෙම් කරන්න
හිංසා පීඩා කරමින් වද දෙන අය ගැන යදින්න

ජේසු ඔබ අයැද සිටිය අණ කෙරුවා මේ විලසට
ප්‍රේමය පිරිතිරී ගලන ජීවිත ගත කරන ලෙසට
බලය සවිය දිරිය දෙන්න ඔබ දුක් විඳ දිවි පිදුවට
ඒ පෙම් ලොව උදා වුනේ නැහැ තවමත් මේ ලොවට

මහ ලොකු බලවන්තයනුත් පාතාලයෙ මැර කල්ලිත්
සමාජයේ නිති හමුවන නෙක නෙක තත්ත්වයේ දනනුත්
වෛරය, ක්‍රෝධය වපුරා ලෝකය කරමින් දෙවනත්
ඔබ පතනා ඒ පෙම් ලොව රුදුරු දරුණ ලෙස වනයක්

මම දන්නව අමාරුමයි ඒ විලසට පෙම් කරන්න
වෛර කරන දනට මගේ ප්‍රේමයෙ අණ ගැන කියන්න
ආදරයෙන් එකමුතු වී ඒ සොයුරන් ගැන යදින්න
හැකි පමණින් මා කී ලෙස මගේ පුතුනි පෙම් කරන්න

**✍ මා.කො. ජයමාන්න**
**කැපුන්ගොඩ**



**පාස්කු ඉරුදිනට දින 40 කට පෙර (ඉරුදින හැර) උදාවන දිනය අළු බදාදා ලෙස හඳුන්වමු. මෙලෙස හැඳින්වීමට හේතුව එදින චතාරික සමය ආරම්භය සංකේතවත් කරමින් සැදැහැවත් ජනතාවගේ නළලෙහි අළු තවරා කුරුසියේ ලකුණ සනිටුහන් කිරීමයි.**

මෙලෙස අළු තැවරීමෙන් උත්පත්ති පොතේ සඳහන් පරිදි මිනිසා දූවිල්ලෙන් සෑදුනු බව සිහිගන්වන අතර මරණින් පසු නැවතත් දූවිල්ලටම හැරෙන බව සිහිගන්වයි. එබැවින් අපගේ පව්කාර බව පිළිගෙන දෙවිපියාණන් වෙතට හැරී ඒමට කරන ආරාධනයකි.

අළු බදාදා දිනයේ ඉතිහාසය ඉතා පැහැදිලිව සඳහන්ව නොතිබුණත් මෙම සභා සම්ප්‍රදාය 06 වන ශත වර්ෂය දක්වා දිව යයි. නළල මත අළු තැවරීමේ මෙම චාරිත්‍රය අති උතුම් ග්‍රෙගරි ශුද්ධෝත්තම පියාණන්ගේ කාලයේ දී ආරම්භ වන්නට ඇතැයි විශ්වාස කෙරෙන නමුත් දෙවන අර්බන් පාප් තුමා විසින් 1091 වර්ෂයේ දී සෑම සැදැහැවතකුගේම නළල මත අළු තැවරීම කළ යුතු බව අනිවාර්යය භක්ති අභ්‍යාසයක් බව පෙන්වා දෙන ලදී.

පුරාණ ගිවිසුමේ ඊශ්‍රායෙල් ජනතාව අතරද අළු තැවරීමේ හා ගෝනි රෙදි හැඳ ගැනීමේ චාරිත්‍රය පැවතිණි. ඔවුන් මෙසේ අළු තවරා ගැනීමෙන් හා ගෝනි රෙදි ඇඳ ගැනීමෙන් දෙවිඳුන් කෙරෙහි වූ යටහත් පහත් බව, මිනිසා මරණයට යටත් බව හා පාපිෂ්ට බව පිළිගෙන මනස්ථාපනය වීම අර්ථ ගැන්වීමය. එබැවින් "අළු" යනු පශ්චත්තාපයේ සලකුණ වේ. එමෙන්ම කොරොස්මය හෙවත් පශ්චාත්තාපයේ සමය මෙය වන අතර මෙම සූදානම් වීමේ කාලයට ඇතුළුවීම සඳහා ඇති දොරටුව අළු බදාදා දිනයි. පුරාණ ගිවිසුමේ දී ද දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාවට විවිධ කාල වලදී දිවැසිවරුන් තුළින් මනස්ථාපනය සඳහා වරින් වර ඇරියුම් කරමින් ඔවුන්ව සූදානම් කළ සේක. (ජොඑල් 2:1-2) දෙවියන් වහන්සේ තම ජනතාවට ජෝවෙල් තුළින් මනස්ථාපනය සඳහා මෙසේ ඇරියුම් කරයි.

"උපවාසයෙන් ද, වැලපීමෙන් ද, මුළු සිතින් ද, දැන්වත් මා වෙත හැරී එන්න" (ජොවෙල් 2:1-2)

තම පාපයන් ගැන සුසුම්ලන සහ පිළිකුල් ක්‍රියාවක් ගැන දුක්වන අයගේ නළලෙහි ලකුණක් ඇති කිසිවෙකුත් විනාශ නොවන බව පවසයි. (එසකියෙල් 9:4-6) මින් අපට මතක් කර දෙන්නේ සැබෑ මනස්ථාපනය හා සිත් හැරීම තුළ නිසැකවම ගැළවීම ඇති බවයි. අළු භාවිතයෙන් නළලෙහි සලකුණු කරනු ලබන කුරුසියෙහි ඇති විශේෂත්වය වනුයේ අපගේ පාපි බව ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේ සමඟම ඇණ ගසා අපට ගැළවීම දානය කළ බව සිහිගැන්වීමයි.

දෙවියන් වහන්සේ මනස්ථාපනය සඳහා ඊශ්‍රායෙල් ජනතාවට බාහිර සළකුණු ලබා දුන්නේ ඔවුන් තුළ පූර්ණ සිත් හැරීමක් සඳහා උනන්දුවක් හා පෙළඹවීමක් ඇතිකරනු පිණිසය. නමුත් ඔවුන් තම මනස්ථාපනය බාහිර සලකුණු හා චාරිත්‍ර වලට පමණක් සීමා කොට, ඇතුළාන්ත වෙනසකට යොමු නොවීය. එබැවින් ගෝනි රෙදි ඇඳ අළු තවරා කරනු ලබන උපවාස දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන ලදී. බාහිර සලකුණු වලින් හා අර්ථ විරහිත උපවාස වලින් මිදී ඇතුළාන්ත සිත් හැරීමක් සඳහා ඊශ්‍රායෙල් ජනතාවට ඇරියුම් කරමින් සැබෑ උපවාසයක් කළ යුත්තේ කෙසේ ද යන්න දෙවියන් වහන්සේ පෙන්වා දුන් සේක.

එබැවින් අපගේ නළල මත තවරණ අළු වලට පමණක් අපගේ මනස්ථාපනය සීමා නොකොට සැබෑ ජීවිත වෙනසක් කරා ගමන් කිරීම කිතුනු අප සතු වගකීමක් වේ.

අළු බදාදායින් උදාවන මෙම ප්‍රසාදජනක වරප්‍රසාද කාලය තුළ දෙවි පියාණන්ට වඩාත් සමීප වන්නට හැකිවනු පිණිස උපවාස හා එක්වරු ශීලය රකිමින් අපගේ පාපයන්ට මනස්ථාපනය වී දෙවිඳුන් සමඟ වැඩි කාලයක් සංවාදයේ යෙදෙමින් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානයෙහි සාක්ෂිකරුවන් වන්නට අදිටන් කරගන්න.

**ඉෂාන් රමේෂ්**
**මීගමුව**

# චතාරික සිතුවිලි



**සමිඳුන් එදා...**
දුක හිතුනා හිතට තදින් සමිඳුනි ඒ ඔබගේ
ඒ නිසාම ලාසරස්ට යළි ජීවිතෙ ලැබුනේ
මාර්ගය ද ඇත්තද ජීවනය ඔබ වෙමින්
දෙවිඳු බලය අවදි කළා සැමට සතුට දෙමින්

**මම අද ...**
සෑමදාම මරණ මංචකේ ම වගේ විහින්
මිනිස්කමත් තුරන් වෙලා අපිත් මැරිල ගිහින්
එහා මෙහා ගමන් කළත් අපේ හුස්ම ගිහින්
යළිත් අවදි කරනු මැනවී අපේ සොහොන් ගෙයින්

මැරුණා කෙනෙක් වගේ වෙලා දිවි ගෙවන්න බෑ
ජීවිතයට සෑමදාම සතුට ලැබෙන් නෑ
කුරුසිය සමිඳුන් මා හා වෙන් කරන්න බෑ
සමිඳුන්ගේ ආදරයත් වෙනස් වෙන්නෙ නෑ

.......................................................

**සමිඳුන් එදා...**
පවක් නැතිව අහිංසකව සිටියත් ඔබ එදා
පිලාත්තුගේ තීන්දුවට හිස නැමුවා නිසා
චෝදනාව බරට බරේ කරට ම පැට වුණා
ගොල්ගොතාව විමුක්තියේ ලෙයින් තෙත්ව ගලා

**මම අද ...**
පිලාත්තුලා වගේ මමත් අනුන් හට ම මෙදා
නිදොස් වුණා මගේ දහම් ගතිය හැමට කියා
බලය නිලය ධනය ගැනම ගැඹුරු සිහින මවා
අවිහිංසක බොහෝ දෙනෙක් වින්දේ මම නිසා

සමිඳුනි ඔබ දිහා බලා හඬනවාට වඩා
ම'විසින් කළ ක්‍රියා නිසා සිදුවූ බව සිතා
වරදට පසුතැවිලි වෙලා අලුත් සිතක් මවා
කුරුසිය මගෙ ගෙන එන්නම් ඔබ පසුපස සොයා

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

# මෙවර පාස්කුවත් තවත් එක්තරා පාස්කුවක් පමණක්ම වේවිද?

**2014 වර්ෂයේ ජනවන්දනා ලිතට අනුව මාර්තු මස පස්වෙනි දින එනම් චතාරික සමයේ ආරම්භය සනිටුහන් කරමින්, දූවිල්ලෙන් සෑදුනු මිනිසා නැවත දූවිල්ලටම හැරෙනා බව මේ වසර තුළත් පසක් කර දෙමින් අළු බදාදා දිනයේ දී සුපුරුදු ලෙසම නළලත අළු තවරා ගත්තෙමු.**

එලෙස අළු තවරා ගත්තේ, එයින් ගම්‍ය වන්නා වූ සැබෑ යථාර්ථය අවබෝධ කරගත් නිසාවෙන් ද, නැතිනම් හුදෙක් බාහිරයට තමන් කිතුනුවකු බව පෙන්වීමට පමණක් ද, යන කාරණය වත්මන් සමාජයේ මැවුම්කරුවාණන්ට වඩා මැවිල්ලට ප්‍රමුඛතාව දී ඇති ඔබත් මමත් සිතා බැලිය යුතු කරුණක් නොවන්නේ ද?

වත්මන් සමාජය තුළ යක්ෂයා, ලෝකයා හා මාංශයා සමඟ දෛනිකව ගනුදෙනු කරන අප, සැබෑ ප්‍රේමය පිළිබඳ අපට කියා දුන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ප්‍රේමය තුළ ජීවත් වන ප්‍රේමයේ ජනතාවක් ද නැතහොත් සුදුහුනු ගා පිටත ආටෝපය පමණක් ඇති පිරිසක් ද, ජේසුස් වහන්සේ අපට ප්‍රේම කළා සේම අපිදු අන් අයට ප්‍රේම කරන්නෙමු ද? දේව අණට පිටුපා පාපය තුළ වහලුන් වූ අපව එම වහල්භාවයෙන් මුදා ගැනීමට තම ඒක ජනිත පුතනුවන් මෙලොවට එවා වදාළේ උන්වහන්සේ අපට දැක්වූ අසීමිත ආදරය නිසා බව ඔබත් මමත් හොඳින්ම දන්නා කරුණකි. නමුත් අප තම ආත්මාර්ථකාමී සිතිවිලි මුදුන්පත් කරගැනීමට ධනයට බලයට ආශාවන්ට වහල් වී තම ජීවිතය තුළ ඇති ස්වර්ගීය වටිනාකම් නැතිකරගනිමින්, මෙලොව ජීවිතය තුළ තෘප්තිමත්භාවය වෙනුවෙන් ක්‍රියා කිරීමට යුහුසුළු වේ.

මොහොතක් සිතන්න. පාපය තුළ ජරා ජීරණ වී ඒ තුළ තාවකාලික වින්දනයක් ලබා මියැදෙනවාට වඩා සැබෑ සිත් හැරීමක් මනස්ථාපනයක් තුළ ක්‍රිස්තුන් වහන්සේගේ විජයග්‍රාහී කුරුසියේ ගමනට සැබෑ පංගුකාරයන් වී පාපි වහල් භාවයෙන් මිදී සදාතනික ජීවිතයේ හිමිකරුවන් වීමට මෙවර පාස්කුව රුකුලක් බවට පත්කර ගනිමු.

**මාධව ප්‍රනාන්දු - දුන්ගාල්පිටිය**

# චතාරිකයේ සැබෑ වෙනසක්

**කතෝලිකයින් වන අපි ජේසුස් වහන්සේ සිහි කරමින් චතාරික සමයේ දී පූජාවන්ට සහභාගිවීම, එකිනෙකාට දයාව පෙන්වීම, සමාව දීම, බෙදාගැනීම වැනිදේ ද මර්දන ක්‍රියා වැනි දේ කරමින් ධාර්මිකව ජීවත්වීම මේ කාලයේදී අප නිසැකවම ඉටුකළ යුතුයි.**

අප කොතරම් පව් නොකර සිටීමට සිතුවත් එසේ කිරීමට නොහැකි වන්නේ අප දුර්වල මිනිසුන් නිසාය. දිනපතාම කොතරම් යාච්ඤා පොත් කියවමින්, අප සහෝදර සහෝදරියන්ටත්, අසල්වාසින්ටත් නපුරුකම් කරනවා නම් යාච්ඤා පොත් කියවීමෙන් ඇති ඵලය කුමක් ද? අප දේවස්ථානයට ගියවිට අපගේ වැරදි සඟවාගෙන අන් අයගේ වැරදි සොයමින් එකිනෙකාට ඒවා කියමින් අප දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගත්තත් ඉන් ඇතිවන ප්‍රතිඵලය කුමක් ද? එහෙත් අපේ පාපවලට සමාව දීමට ජේසුස් වහන්සේ නිතරම සූදානම්ව සිටින සේක. උන්වහන්සේ වද වේදනා විඳ කුරුසියේ ඇණගැසුම් කෑවේ අපේ පව් නිසාය. නමුත් උන්වහන්සේ අපට අනුකම්පා කර අපේ පාප වලට සමාව දෙන සේක. දේව කැමැත්ත අනුව අපගේ ජීවිත කාලයේදී පාපයෙන් මිදී ජේසුස් වහන්සේගේ ශ්‍රී කුරුසියේ බල මහිමයෙන් අපගේ ජීවිත ආලෝකවත් කරගනිමින් සැබෑ වෙනසකට දැන් සිටම අප සූදානම් විය යුතුයි.

**ලලිතා කරුණාරත්න**
**මාලබේ**

## පූජා සතිය
## මාර්තු 06 සිට අප්‍රේල් 13 දක්වා

| | |
|---|---|
| 06 ඉරිදා | **චතාරික සමයේ පස්වන ඉරුදින**<br>(දම්) එසකියෙල් 37:12-14<br>ගීතාවලිය 130:1-7<br>රෝම 8:8-11<br>ජොහාන් 11:1-46 හෝ 11:3-7,17,20-27,32-45 |
| 07 සඳුදා | (දම්) දානියෙල් (ද්.ස.ග්‍ර.) 2:1-9,15-17, 19-20<br>33-62 හෝ 2:41-62 ගීතාවලිය 23:1-6<br>ජොහාන් 8:1-6 |
| 08 අඟහරුවාදා | (දම්) ගණන් කථාව 21:4-9<br>ගීතාවලිය 102:1-2,15-20 ජොහාන් 8:21-30 |
| 09 බදාදා | (දම්) දානියෙල් 3:14-20,24-25,28<br>දානියෙල් (ද්.ස.ග්‍ර.) 1:29-34 ජොහාන් 8:31-42 |
| 10 බ්‍රහස්පතින්දා | (දම්) උත්පත්ති 17:3-9 ගීතාවලිය 105:4-9<br>ජොහාන් 8:51-59 |
| 11 සිකුරාදා | (දම්) ජෙරමියා 20:10-13<br>ගීතාවලිය 18:1-6 ජොහාන් 10:31-42 |
| 12 සෙනසුරාදා | (දම්) එසකියෙල් 37:21-28<br>(සංගීතය) ජෙරමියා 31:10-13<br>ජොහාන් 11:45-57 |
| 13 ඉරිදා | **ගොබ් ඉරුදින**<br>යෙසායා 50:4-7<br>ගීතාවලිය 22:7-8,16-19,22-23<br>පිලිප්පි 2:6-11<br>මතෙව් 26:14-27,66 හෝ<br>27:11-54 |

.......................................................

# වඩින්න ජේසු සමිඳුනේ

*අයුක්තිය රජ වී*
*ඇති අය නැති අයව පාගා දමන*
*ප්‍රේමය සාමය දුරස් කර*
*වෛරයෙන් ක්‍රෝධයෙන් පිරුණු*
*අඳමිටු සිත් තුළට*
*වඩින්න ජේසු සමිඳුනේ...*
*ඔවුන් සිත් වෙනස්කර*
*මෙදා පාස්කුව*
*අරුත් බර එකක් කෙරුමට*

**ඩිලීෂියා තිලකරත්න**
**කෑගල්ල**

# යහපත් සිතින් යුතු අලුත් චතාරිකයක්

**චතාරිකයේ දින 40 ක කාලය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ මෙලොව දූත කාර්යයේ අවසාන මොහොත සිහිපත් කරවන දුක්ප්‍රාප්ති සමයයි. මෙම කාලය තුළ අපි කුරුසිය ගැන කතා කරමු. "යමෙක් මා අනුගාමී වන්නේ ද හෙතෙම තමකම නසා කුරුසිය රැගෙන මා අනුව එයි. (මතෙව් 16:24)**

ජේසුස් ස්වාමින් වහන්සේගේ පාස්කුව මුළු ජීවිත කැපවීම තුළය. "බීජය පොළොවේ වැටී නොමළොත් එය තනි බීජයක්ව පවතී" කෙනෙක් වෙනුවෙන් කරන යහපතක් තුළ හෝ යම් කෙනෙකුට ආදරය කරන විට එහි ඇති වටිනාකම් තුළ තම ජීවිත පූජා කළ ජේසු සමිඳුන්ගෙ නියම ආදරයේ රහස සැඟවී තිබෙන්නේ අනුන්ගේ යහපත වෙනුවෙන් ය. මෙන්න මේ ආදරය තමයි පාස්කු අභිරහස තුළ දුක් විඳි කුරුසිය මත මරණයට පත්වෙලා අපට දුන්නේ. මමත්වයේ අයුක්තියේ අසමානතාවයේ කටු ඔටුනු ඉහට උඩින් ලෙළ දෙන මෙවන් වකවානුවක කිතුනුවන් වන අප කුරුසිය අදහන, පිළිගෙන අපි අප වෙනුවෙන් පමණක් නොව, නැති බැරි අය සමඟ බෙදා ගනිමින්, යහපත්කම්, උගත්කම් දක්ෂතාවයන් නොසලකා, තම හැකියාවන් තුළ අනිත් අයගේ ජීවිත වලට අත දෙමින් සැමගේ වැරදි අඩුපාඩු පිළිගෙන සැබෑ මනස්ථාපනයක් තුළ දෙවිඳුන්ට නිරතුරු ප්‍රශංසා කරමින් දූවිල්ලෙන් සෑදුන අප නැවතත් දූවිලි බවට පත්වෙන බවට සිතමින් දෙවිඳුන්ගෙන් ඈත් වී ගිය අය දෙවිඳුන්ට ළං කරමින් පරිත්‍යාගි ජීවිතයක් තුළ ජීවත් වෙමින් දිවි ගෙවමු.

මහා සිකුරාදා පමණක් කරන කුරුස සිපාවාරය චාරිත්‍රයක් හෝ වත් පිළිවෙතක් හැටියට සීමා නොකර වසර පුරාවටම අනුන් වෙනුවෙන් කුරුස ගත වීමට අප සිතමු.

"සදාතන දයා කරුණා ප්‍රේමයෙන් යුක්ත වූ දෙවි සමිඳුන් වෙත වත ඉරාගෙන නොව සිත ඉරාගෙන සැමදාම හැරෙන්නට හැකි වනු ඇත.

**කාමන් සකුන්තලා**
**විලගෙදර**

# ගුරු සහයක පත්වීම් කිතුනු දහම් පාසල් ගුරුවරුන්ට අහිමිද?

හඬ

කතුතුමනි,

බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත්, වසර පහක් නොකඩවා දහම් පාසල් ගුරුවරයකු ලෙස ස්වෙච්ඡා සේවය කළ ගුරුවරුන් දහසකට සහයක ගුරුපත්වීම් ලබාදීම සිදුකළ බව පසුගිය දින ජනමාධ්‍ය මඟින් අසන්නට, දැනගන්නට, ලැබුනි. මෙවැනි ගුරු සහයක පත්වීම් සඳහා සුදුසුකම් ඇති ධර්මාචාර්ය විභාගය සමත් කිතුනු ගුරුවර ගුරුවරියන් බොහෝ දෙනෙක්, අප දහම් පාසල් වල සේවය කරති.

ඒ අයටද එවැනි සහයක ගුරුපත්වීම් ලබාදීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් නොමැතිවීම කණගාටුවට කරුණකි.

රජයට පවරාගත් සමහර කිතුනු පාසල් වලද, කතෝලික ධර්මය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු නොමැත. එසේම, රජයේ වෙනත් පාසල් වලද, කිතුනු ගුරුවරුන් නොමැතිකම නිසා කිතුනු දරුවන්ට බෞද්ධ ධර්මය ඉගෙන ගැනීමට සිදුවූ අවස්ථා එමටය.

මෙම අසාධාරණ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් සභා නායකයන් නිහඬ වී නොසිට, මේ සඳහා රජයේ වගකිව යුතු නායකයන් සමඟ සාකච්ඡා කොට කිතුනු දරු පරපුර හා ගුරු පරපුර වෙනුවෙන් ක්‍රමවත් වැඩ පිළිවෙලක් යෙදීම කාලෝචිතය.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**
දියලගොඩ

# විෂම අපරාධ රැල්ලෙන් මිදෙන්නට ඇරියුමක්!

කතුතුමනි,

රට පුරා විෂම අපරාධ රැල්ලක් පවතින බව රහසක් නොවේ. දිනපතා ජාතික පුවත්පත්වල ප්‍රවෘත්ති විමර්ශනය කර බැලීමේ දී මෙහි ඇති බිහිසුණු බව හොඳාකාරවම පසක් වෙයි. එවන් සමහර පුවත් ප්‍රවෘත්තිපත්‍රයකින් එළිදැක්වීම නුසුදුසු තරමට අප්‍රසන්නය. ඒවා මොනවාදැයි විස්තර නොකළාට පුවත්පත් පරිශීලනය කරන්නෝ හොඳහැටි දනිති.

දිවයිනේ ජනතාව අදහන සිව් මහ ආගම් වලින් ක්‍රියාත්මක දහම් පාසල් වලින් සමාජයට එළිදක්වන අනාගත දරු පරපුර මේ විෂම සමාජ රැල්ලෙන් ගලවා ගැනීමට විධිමත් ක්‍රියාපිළිවෙලක් අත්‍යාවශ්‍ය වේ. සැබවින්ම දහම් පාසල් අධ්‍යාපනය ලබන දරු පරපුර, එසේ නොවන්නට වඩා ගුණ ගරුක බවකින් යුතු විය යුතුය. දහම් පාසල තුළ හුදෙක් විෂය නිර්දේශයක් ක්‍රියාත්මක කිරීමෙන් සෑහීමට පත් නොවිය යුතුය. ප්‍රායෝගික ධාර්මික ජීවිතයකට දරුවා පෙළ ගැස්වීම මුඛ්‍ය පරමාර්ථය විය යුතුය. මෙය ආගමික නායකකාරකාදීන්ගේ පමණක් නොව රාජ්‍ය නායකයන් ගේද අධි අවධානයට පාත්‍ර විය යුතුය.

රටේ අපරාධ රැල්ල එන්ට එන්ටම වර්ධනය වන්නේ ඇයි දැයි ආගමික නායකයන් ද හවුල් කරගෙන රාජ්‍ය හා ආගමික මට්ටමේ විධිමත්, එලදායී හැදෑරීමක අවශ්‍යතාවය බෙහෙවින්ම ඇති බව අපි දකිමු. රටට, දැයට, සමයට හිතැති කවුරුත් 'ලස්සන රටක් - දේශයක්' දකින්නට ඒකාන්තයෙන්ම කැමැතිය. ඒ සඳහා හැකි සෑම අයුරකින්ම දායකත්වය දැක්වීම කතෝලික අප කාගෙත් යුතුකම ය; වගකීමය. ප්‍රාර්ථනයය.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද

# ජීවිතය සුන්දරද කෙතරම්?

කතුතුමනි,

නූතන ලෝකය අති තරඟකාරීවේ. එම නිසාමෙන් තවදුරටත් මිනිස් ජීවිතය රෝස මල් යහනාවක් නොවේ. සෑම ජීවිත සිදුවීමක් හරහාම බොහෝවිට මිනිසා උත්සුක වන්නේ කෙසේ හෝ අනිකා පරයා යාමටය. එසේ තරගයේ නොයෙදනහොත් තමනට බොහෝ ජීවිත අවස්ථාවක් නැති වෙතැයි යන බිය සංකාවක් ද මිනිසා තුළ පවතිනු ලබයි. ඒ හෙයින් මිනිස් ජීවිතය එදාට වඩා අද සංකීර්ණ වී ඇත.

නූතන මිනිසා භාණ්ඩ හා සේවා ලෙස පරිභෝජනය කිරීමට බලාපොරොත්තු වන දේ බොහෝය. ඒවා කරපින්නා ගෙන දිවි ගෙවන මිනිසා ලදයෙයින් සෑහීමට පත් නොවේ. මෙම වැඩි පරිභෝජන අවස්ථා ඉෂ්ට සිද්ධ කරගැනීමේදී ඇතිවන අපහසුතා හා බලාපොරොත්තු කඩවීම් මිනිසා අසහනයට පත්කරවයි. මෙබඳු වූ අසහනයක් ඇතිව ජීවත් වන මිනිසාගේ මනෝභාවයන් බොහෝවිට මානසික අවපීඩන තත්ත්වයන් කරා වැඩි වර්ධනය වේ. කරුණු කාරනා එසේ සිදුවන බැවින් නූතන ලෝකයේ ජීවත්වන බොහෝ මිනිසුන් අසාමාන්‍ය ජීවන රටාවට හුරුවන මන්ද මානසික චර්යාවන් පෙන්නුම් කරවයි. මෙය පුද්ගල හා සමාජ මානව සම්බන්ධතා පලුදු කරවයි. ඒවා පුද්ගල හා සමාජ ප්‍රගමනයටද විශාල බලපෑමක් එල්ල කරයි. එවන් වූ ප්‍රගමනයන් අවම කොට ලබාගත හැකි. අධ්‍යාත්මික, මානසික, ශාරීරික, සමාජ, ආර්ථික හා දේශපාලනික අභිවෘද්ධිය කුමක්ද? එම පුද්ගල හා සමාජ සංවේදිතාවයන් අසංවේදී වූ යාන්ත්‍රික මිනිසුන් හා යාන්ත්‍රික සමාජයක් පමණක් ඉතිරි කරවයි. එවන් වූ අසංවේදිතාවයන් ඇතිව කටයුතු කරනාවූ මිනිසා සිටුපා ඇති එවුන් බවට පත්නොවී සිටිනු ඇතැයි කාහට නම් වගකීමෙන් ප්‍රකාශ කළහැකිද? මෙලොව සදාකාලික ජීවිතයකට පෙරුම් පුරන්නා ජරාජීරණ මිනිසාගේ දිවිය මුළු මහත් සමාජයම දුර්ග න්දයකට හෙලනු ලබයි.

එනමුත් උදේ සවස මරණයේ නියත බව සිහිපත් කරලයි නම් මිනිස් ජීවිතයේ අරුත පුළුල් පරාසයකට අප කැඳවාලයි. මෙම පරාසය එලොවට පමණක් නොව මෙලොවටද කෙතරම් වැදගත් යන්න කාහට වුවද පසක් වන බව සක්සුදක් සේ පැහැදිලිය. එනම් වැරදි මාවත් වලින් මිනිසා ඈත්වීම නිසා මිනිස් ජීවිතය ශුද්ධවත් වීම බහුතර සමාජයද ශුද්ධවත් කරවයි. මෙය මරණින් පසු අප බලාපොරොත්තු වන සදාකාලික දිවිය මෙලොවදීම අත්විඳීමට හැකිවීම කෙතරම් භාග්‍යයක්ද? එබැවින් මිනිස් දිවිය එතරම්ම සුන්දර වේ.

**ප්‍රදීප් රවී රුෂාලික ප්‍රනාන්දු**
දංකොටුව

# අප සැබවින්ම තෝරාගත් ජනතාවක් ද ?

කතුතුමනි,

කුඩා දරුවකු ඉපදුන විගස තම මව අඳුනාගන්නේ නැත. නමුත් මව, තම කුසින් බිහිකළ දරුවාව හොඳින් හඳුනන්නීයය. දරුවා උපදින්ට පෙර තම මව පියා කව්රෙක්ද යන්න තෝරා ගන්නේ නැත.

මව තම කුස දරුවකු පිළිසිඳගත් දවසේ සිට තම දරුවාට ආදරය කරන්නේය. තම දරුවා මව අඳුනා නොගත්තද එයා උපදින්නටත් පෙර තම දරුවාව දැන ගන්නා සේම අප ආදර දෙවිපියාණෝ අප උපදින්නටත් පෙර අපව දන්නාහ. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දෙවිපියාණන් වහන්සේ මහිමයට පත් කරන පිණිස අපව තෝරා පත්කරගෙන ඇත. අපි උන්වහන්සේව හඳුනා නොගත්තද. උන්වහන්සේ අප එකිනෙක්කෙනා උන්වහන්සේගේ ප්‍රේමයේ පවතින පිණිස ශුද්ධාත්මයාණන් තුළින් අප තෝරාපත්කර ඇති බව රහසක් නොවේ. අප සෑම පුද්ගලයකු ගැනම දෙවිඳුන්ට සිහිනයක් ඇත. අප සියලු දෙනාටම ඉටු කිරීමට කාර්යයක් ඇත.

අප මේ ලෝකයට බිහිවූයේ දෙවිඳුන්ගේ සැලසුම අනුවය. එම නිසා අපි ජීවත් වන්නේ ඇයිද යන්න දෙවියන් වහන්සේ තුළ සිහිනයක් ඇත. අප සියලු දෙනාටම දෙවිඳුන් වෙනුවෙන් ඉටුකිරීමට කාර්යයක් ඇත. අපි දෙවිඳුන්ගේ කැමැත්ත ඉටුකිරීමට පෙළඹිය යුතුය. සියල්ලේදීම උන්වහන්සේගේ කැමැත්ත විමසිය යුතුය. දෙවිඳුන්ගේ කැමැත්ත ඉටුකිරීමේදී සමහර අවස්ථාවලදී එය අපට අපහසු, වේදනාත්මක දෙයක් වන්නට පුළුවන. සැබවින්ම එය කුරුසියක් වන්නට පුළුවන. නමුත් ඒ සියලුම කුරුසියන් අපට ලැබෙන්නේ දෙවිඳුන්ගේ කැමැත්ත තුළය. ස්ථිරව පැවතීමටය. සියල්ලේදීම උන්වහන්සේ අපගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපගේ විශ්වාසය විය යුතුය.

දෙවි පියාණන් අප සියලු දෙනාට නිදහස් කැමැත්ත ලබා දුන්නද, ඒ නිදහස් කැමැත්ත දෙවිඳුන් මහිමයට පැමිණවීම සඳහා ශුද්ධාත්මයාණන්ව අපට දායාද කර ඇත. අපගේ නිදහස් කැමැත්ත ශුද්ධාත්මයාණන්ට ඉඩදීමෙන්, දෙවිඳුන්ව මහිමයට පමුණුවන අදහසින් අප භාවිත කළහොත් අපගේ ජීවිතයේ දෙවියන් වහන්සේ කරන සියලු ප්‍රාතිහාර්යයන් ව අපයෙහු අත්දැකීමක් වනු නොඅනුමානය. මා පෙර සඳහන් කළ ආකාරයට අප සියලුම දෙනාට කැඳවීමක් ඇත. එමෙන්ම අප සියලු දෙනාවම ජීවමාන ජේසු සමිඳුන්ගේ ස්වරූපයට සමාන වන පිණිස කල්තියාම වෙන්කරගත් ජනතාවක් වන්නාහ. (ශු. පාවුළු තුමා විසින් රෝමවරුන්ට ලියන ලද ලිපියේ 8:28-30).

අප ක්‍රිස්තුස්වහන්සේට සමානව පවතින්නේ නම් සියලු දෙනාම උන්වහන්සේගේ ප්‍රේමයේ පංගුකාරයන්ය. උන්වහන්සේගේ ප්‍රේමය තුළ අපි සියලු දෙනාම දෙවියන් වහන්සේ හා සම්බන්ධ වූ ජනතාවක් බව අපට ශු. පාවුළු තුමා රෝම ලිපියේදු පෙන්වා දෙන සේක. අපි සියලු දෙනා දෙවියන් වහන්සේ හා සම්බන්ධ ජනතාවක්ද යන්න අපි අපගේ හෘද සාක්ෂියෙන් විමසිය යුතුය. අප දෙවිඳුන්ගේ තෝරාගත් ජනතාවක් ලෙස උන්වහන්සේගේ කැමැත්ත ඉටුකරන උන්වහන්සේගේ ප්‍රේමයේ ආශ්‍රව පිළිපදින ජනතාවක්ද යන්න අපි අපගෙ න්ම විමසිය යුතු නොවේද? අපි දෙවිඳුන් හා සම්බන්ධ ජනතාවක් නම් අපි සියල්ලේදී උන්වහන්සේව මහිමයට පැමිණිය යුතුය. මන්ද උන්වහන්සේ අපි සියලු දෙනා අතරේ ජ්‍යෙෂ්ඨයාණන් වන ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපට ගැලවීම උදාකර දී ඇති බැවිනි.

**පී. ඉරෝෂ් චන්දිමාල් ප්‍රනාන්දු**
මග්ගොන

# විනාශ වන තරුණ පරපුර බේරා ගනිමු!

කතුතුමනි,

වත්මන් සමාජය තුළ සියදිවි නසාගැනීමේ හා කුඩු උවදුරද ඉතා සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. මේවා සඳහා වැඩි වශයෙන් යොමුවී සිටින්නේ අනාගතය භාර ගැනීමට සිටින අප තරුණ පරපුරයි. මෙය ඉතා ඛේදනීය කරුණකි.

පසුගියදා ඉතා ඝාන්දෝලනාත්මක සියදිවි නසාගැනීම් කිපයක් වාර්තාවූයේද තරුණ පිරිස අතරිනි. ඒ පරිගණක ෆේස් බුක් හරහාය. ඒ අතරම නුවරද දිනයක දුම්රියට පැනීමට පැමිණි තරුණියක් අවට සිටි ජනතාවගේ කෑකෝ ගැසීම නිසාත්, දුම්රිය රියදුරුගේ දක්ෂතාවය නිසාත් බේරාගෙන ඇගේ දෙමව්පියන්ට භාරදීමට හැකිවී ඇත. ඒ සියදිවි නසා ගැනීම පිළිබඳවය. එහෙත් තරුණ පරපුර එයටද වඩා සීඝ්‍රයෙන් විනාශය කරා යන අනෙක් කරුණ වන්නේ කුඩු උවදුරය.

මෑතකදී කළ සමීක්ෂණයකට අනුව වයඹ පළාතේ එක්තරා මුදුබඩ පළාතක පමණක් තරුණ තරුණියන් 1000 ක් පමණ කුඩුවලට ඇබ්බැහිවී විනාශය කරා යමින් සිටින බව වාර්තා වී ඇත. ඔවුන් දිනකට එක් අයකු ඒ සඳහා රුපියල් දහසක් පමණ අවම වශයෙන් වැය කරන බවද තම නිවෙස්වල මුදල් භාණ්ඩ රන් භාණ්ඩ යනාදිය සොරාගෙන ඒවා සඳහා මුදල් ලබාගැනීම හේතුවෙන් තම නිවැසියන්ද ඒ හේතුවෙන් අන්ත පරිහානිය කරා යන බවද වාර්තා වී ඇත.

මේ තත්ත්වයෙන් තරුණ පරපුර බේරාගත හැක්කේ ගිහිදූත නායකයින් ඇතුළු සභා ශ්‍රේෂ්ඨයින්ට පමණි. ඒ හැර වෙනත් නායකයින් නැත. කිතුනු සභා ශ්‍රේෂ්ඨයිනි, ගිහි දූත නායකයිනි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබගේ සේවය දස දෙස පැතිර වීමේ කාලය පැමිණ ඇත. අප තරුණ පරපුර සුමඟට හැරවීමේ වැඩ සටහන් දියත් කරන්න. හලාවත පදවිය දැනටමත් ඒ සඳහා වැඩ සටහන් දියත් කර ඇත. එසේම 2014 වසර තරුණ වසර යනුවෙන් නම්කර ඇත.

මුළු ශ්‍රී ලංකාව පුරා පැතිර සිටින අප තරුණ පරපුර මෙම කුඩු උවදුරින් හා සියදිවි නසාගැනීමෙන් හා වෙනි මානසික පීඩන තත්ත්වයන්ගෙන් බේරා ගැනීමට අවැසි ක්‍රියා මාර්ග ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත

# ජීවිතාවබෝධය තුළ සැබෑ ක්‍රිස්තියානි බව අත්දකිමු

කතුතුමනි,

රටක ඇයක පැවැත්ම වනුයේ ඒ රටෙහි දරු පිරිසය. රටක දරුවන් නිසි අධ්‍යාපනයෙන්, යහපත් සාරධර්මයන්ගෙන්, නිවැරදි චර්යාවෙන් දිවි ගෙවයි නම් එවැනි දරු පිරිසකගෙන් සුසැදෙන සමාජය, රට-දැය පිළිබඳ අන් කවර කථා ද?

අධ්‍යාපනය ලැබූ පමණින් දරුවකු සැබෑ මිනිසකු නොවේ. ඔහුට හෝ ඇයට වැඩිහිටි ඔවදන්, අනුශාසනා උවමනාය. විශේෂයෙන් දෙමව්පියන් තම දරුවන් ඇසුරේ වැඩි කාලයක් ගෙවිය යුතු වන්නේ, පසු ගිය දිනවල අසන්නට දකින්නට ලැබූ අවසානාවත්, ශෝචනීය සිදුවීම් නිසාය. ගුරුවරයෙක්, විදුහල්පතිවරයෙක්, මවක්, පියෙක් ඔවදනක් අනුශාසනාවක් දුන් පමණින් ඔවුන් මට්ටු කිරීමට සිතා තම දිවිය උපයෝගී කොට ගනියි නම්, ඔවුන් ලබා ඇති ජීවිතාවබෝධය කෙබඳුද?

ජීවිතාවබෝධය නොමැති දරුවන් මුහුදේ බෙලිකටු සේය. මුහුදේ බෙලිකටු බොහෝ සුලබය. නමුදු ප්‍රයෝජනයක් නැත. කිසිදු වටිනාකමක් ද නැත. ජීවිතාවබෝධය ලත් දරුවා සැබෑ ක්‍රිස්තියානිකාරයෙකි. ඔහුගේ කිතුනු බව වචනයෙන් හැසිරීමෙන් පවා විශද වේ. "ඔබ පොළොවේ ලුණුය. ලුණුවෙහි ලුණු ගතිය නැති වුවහොත් එයට ලුණු රස කවන්නේ කුමකින් ද? රටෙහි පෙරගමන්කරු වන දරුවා නිසිමඟ මෙහෙයවීමේ වගකීම හා යුතුකම සෑම වැඩිහිටියෙක් හා සතුය. වැඩිහිටි ඔවදන් නිහතමානී ලෙස පිළිගැනීමට සෑම දරුවෙකුගේම සිත නම්‍යශීලී විය යුතුය. මුළු ලොවම රස ගන්වන්නටත් ලුණක් වන්නටත්, ඒ ලවණ තුළින් නිසි රසය ලොවට බෙදන්නටත්, වගකීමක් හා යුතුකමක් සෑම කිතුනු දරුවෙකුටම බෞතිස්ම ස්නාපනය මඟින් උරුම වී ඇත.

**පූර්ණිකා කිරුෂි ප්‍රනාන්දු**
කොරළවැල්ල

අත්තාවී ලොක්කා ඇබ්ඩන් මිහිඳු දිසානායක ගෙන්



**ශිරාන් මෛත්‍රී**

# ලංකාරක්ෂක ස්මාරකයේ ජයන්ති ජනෝදයට ඇරියුමක්

හිට්ලර් විසින් දෙවෙනි ලෝක මහා යුද්ධය අරඹා 75 වසරක් පිරෙන්නේ ඉදිරි සැප්තැම්බර් මාසයේ ය. ඊට වසරකට පමණ පසු ඉතාලියත් ජපානයත් ජර්මනියට එකතු විය. යුධ සමයේ ඉංග්‍රීසින්ගේ යටත් විජිතයක් වූ අප මව්බිමත් එම මහා විපතට ගොදුරු වූයේ නිරායාසයෙනි.

එවන් විපතක් හමුවේ රටේ සහ ජනතාවගේ ආරක්ෂාව ගැන නිතර කම්පා වූ නායකයෙකි එකල කොළඹ අගරදගුරු වූ අති උතුම් ජේ. එම්. මසෝන් හිමි. යුද්ධය ඉක්මනින් නිමවන ලකුණක් දක්නට නොතිබුණි. ඒ හේතුවෙන් ඇති විය හැකි අනතුරු හමුවේ ජනතාවගේ සුබ සෙත පතා දෙව්ඳුන් යැදීමට මෙම නායකයා විසින් ගිහි, පැවිදි හා පූජක පිරිස් උනන්දු කරවන ලදි.

## හිට්ලර් යුද්ධය අරඹා සමසකින්

යුද්ධය පටන් ගෙන සමසක් ගත වූ කල, 1940 මාර්තු 26 වැනිදා, මසොන් හිමි තිසොල්මනේ වන්දනා ගමනක යෙදුනි. එදා එතුමා වැඩියේ තේවත්තේ පිහිටි කුඩා දෙව්මැඳුර වෙතයි. එතැන ලූර්දු ගුහාවේ වූ දේවමාතා ප්‍රතිමාව ඉදිරියේ දණින් වැටී එතුමා දැහැන් වැදුණි.

ලංකාවත් ලක් ජනතාවත් යුද උවදුරින් මුදා දෙන ලෙස දෙව් මවුන් අමතා යාදිනි කළ කතෝලික නායකයා, එම රැකවරණයට උපහාර වශයෙන් මරියෝත්තමාව නමින් බැසිලිකා දෙව් විමනක් තැනීමට ප්‍රතිඥා දුනි. ශ්‍රී ලංකාවේ ජාත්‍යාරක්ෂාව පතා මසොන් හිමි බාර වීමේ 75 වැනි ජයන්තිය 2015 වසරට යෙදේ.

## ජාතිකාරක්ෂාවට කිතුනු ප්‍රතිඥා

එම බාරය ඉටු කරමින් අති පූජ්‍ය තෝමස් කුරේ කාදිනල් හිමිපාණන් විසින් බැසිලිකාව ඉදි කරන ලදි. එම ජාතිකෝපහාර දෙව් විමන එතුමන් විසින් ඉමහත් බැති අදරින් 1974 පෙබරවාරි 06දා කැප කරන ලදි. සතුරු උවදුරින් අප මව්බිම මිදීමේ සමරුවට බැසිලිකා දෙව් විමන කැප කර 40 වසරක් පිරුනේ පසු ගිය පෙබරවාරි මස 06 වැනි දා ය.

ඉකුත් 40 වසර තුළ ලක්දිව කතෝලික ජනතාවගේ පූජෝපහාරයට ලක් වූ බැසිලිකාව ජාතික වන්දනා සිද්ධස්ථානයක් බවට පත්වීමේ පුරාණය 1940 ගණන් දක්වා ඈතට දිවෙන කතාවකි.

සතුරු උවදුරින් රට මුදා ගැනීමට දේව මාතාවන්ගේ සරණ නිසැකයෙන්ම ලැබෙන වග අති උතුම් මසෝන් හිමියන්ගේ තිර විශ්වාසය විය. එබැවින් බාර වූ දෙව්මැඳුර අංග සම්පූර්ණව සපුරාලීමට සුදුසු වාතාවරණයක් සෙමින් සෙමින් ඇති කිරීමට එතුමා ඉටා ගත්තේ ය.

## සෙත් වඩන සුවදාන මෙහෙය

බැසිලිකාව ජාත්‍යාරක්ෂාවේ ශ්‍රද්ධා ස්මාරක විජය සමරුවක් වන්නාසේම ජන සෙත සුව සලසන නිවහනක් වනු දැකීම එතුමාගේ පැතුම විය. නන් අයුරින් රෝගීව සිටින සමාජයට සුව සෙත සැලසීමේ සුව මෙහෙයක් කල් තියාම තේවත්තේ පරණ දෙව්මැඳුරු බිමේ අරඹන ලද්දේ ඒ හේතුවෙනි.

දැන් අවුරුදු පතා අගෝස්තු අග පැවැත්වෙන එම මෙහෙය ප්‍රථම වරට පවත්වන ලද්දේ 1941 දීය. ගිලනුන් ආසිරි ගැන්වීමේ මෙහෙයේ 75 වැනි ජයන්තිය 2016 වසරට යෙදේ.

යුද උවදුරින් විඩාපත් සැදැහැ සංඝයට එවන් සුවදානයේ ශාන්තිකර්මයකට මඟ සැලැසීමෙන් ඉක්බිතිව යි සසුන් නායකයා තමන් වූ බාරය අනාවරණය කළේ. 1942 පෙබරවාරි 15 වැනි දා තේවත්තේ ලූර්දු මංගල්‍ය මෙහෙයේ දී අගරදගුරු හිමි ඒ ගැන ඉඟියක් කළේ ය. එනමුත් තම බාරය ගැන එතුමා ප්‍රථම වරට සවිස්තරව අනාවරණය කළේ කතෝලික දරුවන් අමතා ලියූ ලිපියකිනි.

1942 මාර්තු 16 වැනිදා ලියන ලද එම ලිපිය කතෝලික පුවත්පත් මඟින් පළ කරන ලදි. ළමුන් අමතා තම බාරය ගැන විස්තර කළ අගරදගුරු හිමි, රටත් ජනතාවත් වෙනුවෙන් දේවමාතා සරණ පතා නිරතුරු නමෝ මරිය යදින ලෙස ළමුන් වෙතින් ඉල්ලා සිටියේ ය. මෙලෙසින් බාරය අනාවරණය කිරීමේ 75 වැනි ජයන්තිය 2017 වසරට යෙදේ.

## බෝම්බ ප්‍රහාරයයි යැදුම් පෙළහරයි

සසුන් නායකයා එම ඉල්ලීම කර මසක් ගෙවෙන්නට මත්තෙන් ජපනුන් විසින් කොළඹට බෝම්බ හෙළන ලදි. බ්‍රිතාන්‍ය හමුදා වැඩි සූදානමකින් නොසිටි එදා පහසුවෙන් කොළඹ අල්ලා ගැනීමට ඉඩ තිබුණද, බෝම්බ කිහිපයක් පමණක් හෙලා ජපන් ගුවන් යානා ආපසු හැරී ගියේ කඩිනමිනි. හරියටම 1942 පාස්කු ඉරිදා එම ප්‍රහාරය සිදුවූයේ අගරදගුරු හිමියන්ගේ බාරයට අභියෝගයක් වශයෙන් දැයි සමහරුනට සිතිණි. එනමුත් ජපනුන් හදිසියේ පළා ගියේ කවර හේතුවක් නිසාදැ යි සිතා ගැනීමට තරම් විශ්වාසයක් ඔවුන්ට නොතිබුණි.

එවැනි ප්‍රහාර යළි සිදුවේය යන බියෙන් බොහෝ දෙනා කොළඹ හැර පියා ගම්බදට පලා ගියේ තම දරු පවුල් ද සමඟ යි. ඔවුන්ගේ දරුවන් ඉගෙන ගත් ඇතැම් කතෝලික පාසල් පවා අවට ගම් වලට ගෙනියන ලදි. එනමුත් මසෝන් අගරදගුරු හිමි බොරැල්ලේ පිහිටි අගරදගුරු නිවස හැර දමා පලා ගියේ නැත. ජපනුන් යළි එන්නේ නැතැයි පුන පුනා කී එතුමා තම ජනතා යාතිකා ව්‍යාපාරය වඩ වඩාත් තර කළේය.

## තුන් ගිව්සුම් මණ්ඩපයක්

ලක් ජනතාවගේ සුබ සෙත පතා ඉමහත් සැදැහැවකින් යුතුව මසෝන් අගරදගුරු හිමි විසින් මරියෝත්තමාවන්ට දෙන ලද ප්‍රතිඥාව ඉමහත් බැති අදරින් සපුරන ලද්දේ අති පූජ්‍ය තෝමස් කුරේ කාදිනල් හිමිපාණන් විසිනි. යුද උවදුරින් රටත් ජනතාවත් බේරාදීමට දේවාසිරි ලබා දුන් දේව මාතාවනට උපහාර වශයෙන් ලංකාවේ අප ස්වාමිදූ යන විරුදාවලියෙන් දේව මාතාවනට කැපවූ බැසිලිකාව ජාතිකාරක්ෂක ස්මාරකයකි.

එම දෙව් විමන ඉදිකිරීමෙහි ලා ජාතික කලාවටත් පෙරදිග ගෘහ නිර්මාණ ශිල්පයටත් තමා මුල්තැන දුන් වග කාදිනල් කුරේ හිමි මට විස්තර කළේ බැසිලිකාව කැප කිරීමට සති කිහිපයකට පෙර යි. බැසිලිකා අබිසෙස් සමරු ප්‍රකාශනයට එතුමන් නමින් ලිපියක් සැකසීම පිණිස එතුමන් බැහැ දුටු දා එතුමා අනාවරණය කළ තොරතුරු අතරින් සුවිශේෂී කරුණක් මට සිහිපත් වේ.

## මතු ලංකාරක්ෂාවේ සාම සමරුව

බැසිලිකාවේ හදවත වන දිව්‍ය සත්ප්‍රසාද මණ්ඩපය තමන් විසින් සැලසුම් කෙරෙනුයේ පුරාණ ගිව්සුමේ සඳහන් වන ගිව්සුම් මණ්ඩපයේ ආකෘතියට බව එතුමා එදා කී අයුරු මට මතකයි. වහල් මෙහෙවරින් හා පීඩනයෙන් බැට කෑ එදා දේව ජනතාව විප්‍රවාසීව නන්නත්තාරව යන යන තැන ඔවුනගේ එකම රැකවරණය වූයේ එම ගිව්සුම් මණ්ඩපය බව කාදිනල් හිමි එදා කීවේ මතු කල් දිවැසින් බලා දැයි මට අද සිතේ. තම සැදැහැ සංඝයටත් දේව ආරක්ෂාවේ මණ්ඩපයක් බවට පත්වන බැසිලිකාව මතු කලක් ලංකාරක්ෂාවේ සාම සමරුවක් වේවා යන පැතුම එතුමාගේ වදන් වලින් ධ්වනිත විය.

## තෙජයන්තියෙන් ජනෝදයට


අප ජනතාව අද විවිධ වූ දිසි අදිසි වහල් බැමි හමුවේ දිසි අදිසි පීඩන හමුවේ අතරමංව අසරණව සිටිති. එසේ තැවෙන සැමට සාධාරණයේ සහ සහජීවනයේ සාම සමාධියෙහි ගිව්සුම් මණ්ඩපයක් බවට බැසිලිකා විමානය යොමු කිරීම බාර දෙව්මැඳුරක් වශයෙන් එහි මූලික අරමුණට සැමතින් යුක්ති යුක්ත වේ. එම දෙවොලේ ලංකා අප ස්වාමිදූගේ සිරි පා මුදුනත් යටි මලුවේ කුරේ දාගැබත් අතර වූ දිව්‍ය සත්ප්‍රසාදීය මණ්ඩපය සැදැහැ ජනයා දෙවොසිරින් පොහොනි කරන ආසිරි විමනකි.

ඉදිරි 2015-2017 තෙවසරට යෙදෙන බැසිලිකාවේ ත්‍රිවිධ වජ්‍ර ජයන්ති සමය මෙම ජන පූජිත ජාතික සිද්ධස්ථානය සියලු වාද භේද වලින් තොරව කාටත් පොදුවේ සෙත් වඩන සාම සමාධියක් බවට පත් කිරීමේ ධර්මෝදය ජනෝදයටම අවස්ථාවක් කරගනිමු. එවිට බැසිලිකාව එදා මෙන් අදත්, අද මෙන් හෙටත් සැමතින්ම ලංකාරක්ෂාවේ සජීවී සනාතන ස්මාරකයක් වනු ඇත.

ඥානාර්ථ ප්‍රදීපය
හිටපු කර්තෘ

**හෙක්ට වෙල්ගම්පල**

# ක්‍රි.ව. 1648 පැවති කතෝලික දෙව්මැඳුරු - 2




මාදම්පේ දෙව් මැඳුරයි. ශු. ක්ලාරා මුනිවරිය නමින් කැප කරන ලද මෙම දෙව්මැඳුර ඉතා අලංකාර විය. වෙරළට මුහුණලා මෙම දෙව්මැඳුර අවට කලපුවක පරිසරයක් ගත් ගම්මානයකි. මෙහි කුඩා දූපත් 5 ක් විය. ඉතාලියේ වෙනීසියට සමාන කළ හැකි මෙහි ඒ දූපත් තුළ කුඩා ගැමි පරිසරයක නිවෙස්වල ජීවත් වූ 1300 ට වැඩි පිරිස දෙව්මැඳුරට පැමිණියේ කුඩා දෝණි (ඔරු) වලය.

තවත් දුරකින් පිහිටි වැලිතර වාසය කළෝ රජය වහල්ලු සහ කුරුඳු වගා බාර නිලධරයෝ ය. මෙහි රජ තුන් කට්ටුව නමින් කැපවුණු අලංකාර නව දෙව්මැඳුරකි. මෙහි 2000 ට වැඩි කතෝලික පිරිසක් ජීවත් වූහ.

මෙතැන් සිට ගව් එකහමාරක් පමණ දුරින් වූ කොස්ගොඩ පිහිටි තවත් අලංකාර දෙව්මැඳුරකි. එය කැප කර තිබුණේ සින්දාත්‍රි දෙව් මව් නමින් ය. මෙහි කතෝලික ජනගහනය 500 ට අධික වූහ.

අලුත්ගම දෙව්මැඳුර කැපකොට තිබුණේ ශු. අන්තෝනි මුනිඳුන් නමින් ය. අලුත්ගම වරාය නගරයක් විය. ගඟකට යාව සැදුනු අලංකාර ගම්මාන කිහිපයක් පිහිටි

මෙහි ධීවර කටයුතු ඉතා සාර්ථකව කෙරුණි. රජතුමා විසින් පත් කරන ලද පෘතුගීසි කපිතාන්වරයා ද වාසය කළේ මෙහිය. කතෝලික ජනගහනය 2500 ට අධිකය.

අලුත්ගම සිට ගව් එකහමාරක දුරින් කොළඹ දෙසට වූ මග්ගොන දෙව්මැඳුර ශු. පේදුරු තුමන් නමින් කැපවී තිබිණි. මෙහි කතෝලික ජනගහනය 600 ක් පමණ වූහ.

කළුතර නැව් තොටේ බලකොටුව අසළ පුනීල මෝය ළඟ පිහිටියේ ශු. ෆ්‍රැන්සිස් මුනිඳුන්ගේ ශ්‍රී කැළැල් නමින් කැප කරන ලද දෙව්මැඳුරයි.

මෙය ශක්තිමත්ව නිම කරන ලද අලංකාර ගොඩනැගිල්ලකි. මෙහි 1300 ට අධික කතෝලික ජනගහනයකි.

(කළු) ගඟෙන් එගොඩ උතුරු කළුතර පිහිටියේ ආරෝග්‍ය මාතා දෙව්මැඳුරයි. මෙහි ද කතෝලිකයෝ 1300 වැඩි ගණනක් විසූහ.

ගඟෙන් උඩහට ගව් දෙකක් පමණ දුරින් ගලපාත ග්‍රාමයේ ශුද්ධවූ ස්නාවක ජුවාම් තුමන් නමින් වූ දෙව්මැඳුර පිහිටියේ ය. මෙයට අයත් කතෝලිකයෝ සියයක් පමණ වූහ. තවත් ගව් දෙකක් උඩහට උඩුවර ග්‍රාමයේ පිහිටි දෙව්මැඳුර ශු. ලූක් තුමාගේ දේවමාතා නමින් විය. මෙහි කතෝලික ජනගහනය 500 ක් පමණ විය.

ගලපාත සිට ගව් හයක් පමණ දුරින්, පෘතුගීසින් සොෆ්‍රගාම් නමින් හැඳින් වූ සබරග මුවේ ගැලවුම්කරු ගේ දෙව්මැඳුර පිහිටියේ ය. මෙහි ලාංකිකයන් මෙන් ම පෘතුගීසින් ද වාසය කළ අතර කතෝලික ජනගහනය 500 ට වැඩි විය.

කළුතර සිට ගව් දෙකක් දුරකින් පානදුරා ගඟ අසළ ශු. මරිය මග්දලේනා දෙව්මැඳුර තනා තිබුණු අතර එයට අයත්ව කතෝලිකයෝ 1200 ක් විසූහ.

පානදුරා ගඟ දිගේ උඩහට ගව්වක පමණ දුරින් දූව යනුවෙන් හඳුන්වනු ලැබූ දූපතක ගොරකානට මුහුණලා පිහිටියේ බොන් ජේසු (ජේසු බිළිඳා) දෙව්මැඳුරයි. මෙහි කතෝලික සංඛ්‍යාව 400 කි.

රයිගම කෝරළයට අයත් වීදාගම ප්‍රාතිහාර්ය අප ස්වාමිදූ නමින් වූ දෙව්මැඳුර විය. මෙහි 1300 ට වැඩි කතෝලික පිරිසක් විසූහ.

ගොරකානේ සිට ගව්වක් දුරින් මුහුදුබඩ පිහිටි මොරටුවේ, මුහුදේ සිට වෙඩි පහරක් වදින දුරින් සිරි කුරුස දෙව්මැඳුර පිහිටා තිබිණි. එයට අයත් කතෝලිකයෝ 1450 ක් වූහ.

මෙ තැන සිට ගව්වක් දුරින් ඇතුළතට පිහිටියේ වෙරළ ගම්මානය යි. එහි දේවමාතා දෙව්මැඳුරට අයත්ව සිටියෝ 500 ක පමණ නවක කතෝලික පිරිසකි.

මෙම දෙව්මැඳුරු ලේඛන ගතකර ඇත්තේ ඉතිහාසඥ පාවුලෝ ඩ ට්‍රිනිඩාඩේ නමැත්තාය. මෙය ක්‍රි.ව. 1628 කෝට්ටේ රාජධානිය තුළ පිහිටි දෙව්මැඳුරු පිළිබඳ ලේඛනයකි. මෙහි ඉතිරි කොටස සඳහා මතු බලාපොරොත්තු වන්න.

## මාවතක කථාවක්

පෙර දිනයෙක මෙ මාවත
පිරී තිබිණි
ජය ගී නද - ජය සක් හඬ
පසතුරු නද - ප්‍රශස්ති ගී
සුවඳ තෙලට මුසුව නැගෙන
නෙක විසිතුරු රංගන මැද
පිළිගත්තෙමු රජෙකු ලෙසින්
මහ සක්විති රජෙකු ලෙසින්
අද දිනයේ
ඒ මාවත
පිරී තිබෙයි
විලාප ගී - වද බෙර හඬ
නෙක නින්දා අවමන් කවි
පුපුරයි කස සිරුර වැළඳ
දහදිය හා කඳුල මුසුව
ගලා හැලෙයි උනු රත් ලේ
පිළිගමු ඔහු සොරකු ලෙසින්
මං පහරන සොරකු ලෙසින්
බර කුරුසිය කර දරාන
මෙ නෙත්යුර
සමව විඳින
මහ කරුණා ඔහු නෙතු යුග
දිලී සැලෙයි - සැලී දිලෙයි
සැම වෙත සම මෙත් පාමින්

**ජෙරාඩ් එගොඩවත්ත**
සපුගස්කන්ද



## සුදුසුද මා?

එදා මා වෙනුවෙන් ජේසුනි
ඔබවහන්සේ ලේ කඳුළු හෙලද්දී
වෙරෝනිකාවන් බිය නොමවී
පිස දැමුවා ඔබවහන්සේගේ
ශ්‍රී මුව මඬල

එදා ඈ එම මොහොතේ
භාග්‍යවන්තියක වූවා සේ
මෙදා මා හට මේ මොහොතේ
වෙරෝනිකාවක් වන්නට
තිබුණානම්?

මෙදා මා සහෝදරයා
දුක් බර කඳුළු සලද්දී
ඔහුගේ ඒ දුක් කඳුලැලි පිසිනට
වෙරෝනිකාවක් වීමට
නොහැකිද?

**ශාමිලා ගීතානි**
බම්බුකුලිය

## ජේසුනි

කටු ඔටුන්නක් හිස දරා...
රිදුම් දිදී හද කකියද්දී...
ජේසුනී... ජේසුනී...
දැරුවේ කෙලෙසද
මෙ දුක් මෙතරම
ඔබ රහසේ...
ලය මඬලේ ... ඔබේ ...
රිදුම් දෙන හඬ
දෝංකාර දේ...
මා හදට සමිඳුනි....
තව තවත්...
නොවේ සමිඳුනි
මා හදට සැනසුමක්
ඔබ හදට දුන්
දුක්ගිනි... නිසා
මා පව්කාර වූ නිසා...

**ශිරෝමි නිර්මලා**
දළුගම

## චතාරිකය

කිතු සමිඳුගෙ ඇරියුමට
සවන් යොවමු විකසිතව
චතාරික සමය වෙතට
බැති සිතින්ම පා නගමු

අත හැරියා ද සියල්ල
නැවත අපි හැරී බලමු
ඇති හැම දේ පසෙකලා
යමු කිතු සමිඳු පසුපස

දහම ඇසුවා හැම දින
නැත්තෙ ඇයි ද වැටහිලා
මෙවර චතාරිකයෙ වත්
බෙදා ගනිමු අපි අතර

සතුටු වෙන හැම මොහොතක
දුක් දිවිය මෙනෙහි කරමු
සමරමු අපි පාස්කුව
ඇවිත් කුරුස යාගයට

**සිරිපාල චන්ද්‍රසෝම**
මීගමුව

## වඩින්න ජේසු සමිඳුනේ

අයුක්තිය රජ වී
ඇති අය නැති අයව පාගා දමන
ප්‍රේමය සාමය දුරස් කර
වෛරයෙන් ක්‍රෝධයෙන් පිරුණු
අදමිටු සිත් තුළට
වඩින්න ජේසු සමිඳුනේ
ඔවුන් සිත් වෙනස්කර
මෙදා පාස්කුව
අරුත් බර එකක් කෙරුමට

**ඩිලීෂියා තිලකරත්න**
කෑගල්ල

## දූවිල්ලෙන් සැදුනු නුඹ දූවිල්ලට හැරෙනවමයි

දූවිල්ලෙන් සැදුනු නුඹ
දූවිල්ලට හැරෙනවමයි
ලෝ පාලන දෙවිඳුන්ගේ
දේව වැකිය නම් එයමයි
හැමදාමත් ජීවත්වන
අප හට මතකය නැමයි
එය මතකෙට එනකොට නම්
ඇඟ හිරු ගඬු පිපෙනවමයි

දිනපතාම සිහිවන විට
මැරිල වගේ දැනෙනවමයි
ඒක මතක නැති කරන්න
මනසට රස ගන්නවමයි
ඒකත් බැලුවම ඇත්තයි
පණ්ඩිතයින් එහෙම කියයි
පව්කාර වූ අප උදෙසා
දෙවියන් කරුණාම කරයි

සැම ඉරුදිනකම ඔබ
සුපුරුදු ලෙස පල්ලිත් යයි
රුවට ඇඳන් සුවඳ දිදී
ඉදිරි පෙළේ අසුනෙ හිඳියි
ඉඳිකටු සිදුරක් ඇතුළින්
ඔටුවකු රිංගන තරමට
දේව රාජ්‍යයේ දොරගුළු
ඇරලන්නට අපහසුමයි

එදා ඔබේ ශ්‍රී මුඛයෙන්
වදහළ අනුහසම එයයි
අපගේ හදවත් හිස් කර
පොඩි දරුවන් වූ තරමට
හදවත අපගේ ඇතුළේ
දෙවියන් වැඩ සිටිනවමයි

**බලගල රෙක්සි ප්‍රෑන්ක්** - හැඳල

නදිය

# මව් මරියේ

ලොව ඇති ඉහළම
මව් පදවිය ලද
සෙනෙහස කැටි කළ
දයා ගුණෙන් පිරි
අති නිර්මල වූ
මව් මරියේ

මහමෙර සේ
දුක්බර ඉසිළූ
දරු පෙම හදේ නිදන් කළ
සදාතනික වී ඇත
දෙව් පුතු බිහිකළ
මව් මරියේ

**මුණිදාස කඹුරාවල**
පයාගල

# මොක් උපත ලද නුඹට

නෙතුපියන් වසාගෙන
දෑත් ළැම මත බැඳන්
නිසසලයි සිතුවිලිත්
නොපෙනේය නොදැනේය
පියඹගේ වියෝගිනි
අසරණවූ සිඟිති පුතු
හා නුඹේ සොයුරියන්
ලය පැලී නොගිය මුත්
වැලපෙනා මා පියන්
හැරදමා මේ ලොවම
තනිව සග සැප සොයන්
දෙව් පුතුන් වෙත ගියෙද
ලබනු වස් මොක් උපත

**රෝස් ලාලනි**
වෙන්නප්පුව

# මරිය හමුදාවට එන්න ආසයි

නෙලුම් විලෙන් නෙලුමක් ගෙන සරසන්න
ජපමාලය දෝතින් ගෙන නමදින්න
දෙව්මව් සමග ජන සේවය පතුරන්න
ආසයි මටත් මරිය හමුදාවට එක් වන්න

නිවසින් නිවස ගොස් ජනසේවය සලසන්න
පාලුව තනිකම ඇති සැම දෙන සනසන්න
දෙව්මව් සේවය ගැන සැමටම පවසන්න
ආසයි මටත් මරිය හමුදාවට එක් වන්න

මහලුව සිටින අයට සැනසිලි බස් දෙන්න
ලස්සන සිතුවිලි ඔවුනට පවසන්න
සුවදානය සඳහා නිති දෙවිඳුන් නමදින්න
ආසයි මටත් මරිය හමුදාවට එක්වන්න

පව්කරුවන් පාපයෙන් නිති ගලවන්න
අසල්වැසි සමගිය නිති ලැබදෙන්න
හොඳ ඔවදන් දරුවන් හට නිති දෙන්න
ආසයි මටත් මරිය හමුදාවට එක්වන්න

**බෙන්ජමින් කිරිහෙට්ටි**

# සැනැසීම

පණ දෙවැනි කොට සිතන සොහොයුරන් කැළකි මට
නෑසියන් මිතුරන්ද එකට ගත හැකිය මිට
ජීවිතේ දුකක් නැත සතුට ඇත අද ද හෙට
දස දහක් ලඟ සිටී දුකක් මට දැනෙන විට

දැන හැඳින ගත් අයද ලොව පුරා සැරි සරා
පින පුරන යහපතම හදවතින් ගෙන දරා
දෙන සහය අපමණය සුව බරය සිත පුරා
සැනසීම ලබා ගෙන ඇදෙමි අවසන කරා

පීන පීනා දහම් නසාගරේ හැම අතේ
දාන මානයෙන් පින් ලදිමි ඇති තෙක් හිතේ
සීන හැම ඉටුවෙලා ජීවිතේ දින පොතේ
වාන උතුරා ගලයි පැතුම් මල් මාවතේ

තබා යන්නට නොහැකි කිසිත් නැත මෙ ලොවේ
ලබා ගන්නට තවත් දෙයක් නැත මෙ බවේ
සොබා දහමට නතුව පහන දිනකදි නිවේ
නොබා ඉම් එතෙක් මා සිතෙහි සැක බිය නොවේ

**ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්**
තලාව

# මව්නි දයාබර




කුළුනු පෙමින් ලෝ සතහට
දයා පෑ සග ලොව සිට
සුරලොව මනුලොව යාකොට
වැජඹෙන දෙව් සිරියෙන් මව්නි දයාබර

ඔබ ගුණ ගයා නිම නැත දයා
සිහසුන දරා පුත් කුමරු හා
දෙව් මහිමෙටා නිති කැපවෙනා
දෙව් අණට සැම යටවෙනා මව්නි දයාබර

**මේරි ඇනස්ටින් මිහිඳුකුළ**
බෝලවලාන

# සමිඳු ප්‍රේමය



තැබූ කුරුසියෙ බර උරේ උසුලා
ගොල්ගොතා වේ වැටි වැටි
නැගෙමින් ගිය ගමනේ
පුරාවට තිබුණේ ප්‍රේමයයි සමිඳු

රිදි රිදී කස පහරින්
කටු ඔටුන්නට තද වූ හිසින්
පෑරෙමින් රුහිරු හෙලමින්
විදි වේදනා ඉවසුවේ සමිඳුන්
මුදන්නට ලෝ පාපයේ රුදු බවෙන්

සමිඳු හද පෙම පිරි
මෙදත් විඳිනා දුක් නිමනැති
ලෝ දනන්ගේ නේකවූ රුදු ගති
අඩුවකුදු නැති - වැඩිවෙයි.. අරුමෙකි!

**නීටා අයි. ප්‍රනාන්දු**
නාගොඩ

# සුපසන් මවේ

දැරියකි - වත කමල පිණිබර හිරුට හැරී
පහනකි - දිළිඳු ගෙපැලට මේ සිඟිති දැරී
පිරියකි - දෙගුරුනට ඇය ගුණ දමින් පිරී
සිරිතකි - දෙවිඳු නැමදුම නිති බැතින් පිරී

මවගෙනි - අකුරු කරනුයෙ ඇය සෙනේ පුරා
සියතිනි - නිවසෙ වැඩ කරනුයෙ දිරිය දරා
බැතියෙනි - මා පියන් හද ආදරය අරා
මුතුමිණි - විලස දිදුලයි ගම් දනව් පුරා

දෙවිඳුන් - කැමති ලෙස මා හට සිදුවේවා!
යනුවෙන් - පවසන්න ඇය බැහැපත් වූවා
සමිඳුන් - කුස දරණ වරමද හිමි වූවා
සුපසන් - මව්නි ඔබ මිහිකත සෙල වූවා

අම්මේ - ඔබේ තුරුළට අරගෙන ලොවම
පිම්මේ - දුවන මව්වරු එක්කොට සැවොම
දම්මේ - අනුව ඔබ සැදූ කුඩුවේ පෙම
අම්මේ - කියා දෙනු මැන අම්මලට සැම

**විනිප්‍රඩ් පාරිස්** - කටුකෙන්දේ

# සුරැකි පියේ!

නෙක උවදුරින් රැක ගෙන අප ජේසු පුතා
බෙත්ලෙහෙමයෙන් නාසරෙතට රැගෙන ඉතා
පරිස්සමින් ඇඩි කර දිවි රැකුම සිතා
සුරැකි පියාණන් යදිනෙමු පිහිට පතා

කම්කරුවනට ආදුරුසය දුන්න ඔබේ
ඒ වඩු මඩුව තුළ පුතුටත් සෙවන තිබේ
මරි මව් සමග ගතකළ දිවි සිතට එබේ
ඔබ ඉහළින්ය මුනි අතරේ කිතුනු සබේ

දහදිය හෙළන කම්කරු දන හට පිහිට
දෙන සුදු පියේ ඔබමය සරණය අපට
සුබ මරණයක් ලද පුතු - මව් අතර සිට
නිති ඔබ යදිමු වැතිරි පා සෙවන යට

**ලයනල් වර්ණකුල**
දළුගම

# නොසිතූ තරමට.....!

පොටෝ එකත් එක්ක මගේ විස්තරයක් ගෙවුණු දොහේ
ප්‍රදීපයේ පළවීමත් සමග මලක් පිපුණි ඉහේ
හමුවූයේ එය කියවූ අයමයි මට ගියත් කොහේ
සොම්නසකින් ඒ බව අපමණ නොකියා සිටිය නොහේ

සොයාගන්න හැකිවී නොමමරය එයින් දුර කථන
නොසිතූ තරමට හමුවිය රසික පිරිස සුබ පතන
කලින් කලට එකම ටොපිය කොළය වෙනස් කොට ඔතන
රට වෙත දිය යුතුයි කීය පණිවුඩ කවියෙන් ගොතන

විස්තරයද එහි සඳහන් මතකයි කළ අයුරු අගේ
හරිම හරි ලස්සනයිලූ ඉන්නවාලූ බබා වගේ
පන්හිඳ බිමනොතබන්නට දුරුකළ යුතු අඳුර යුගේ
තලෙන්තුවට ආසිරි දුන් සැමවෙත හිස නමමි මගේ

දැක්වූ ප්‍රතිචාරවලට සිටින විටදී සවන් අයා
වැටහුණ තව දෙයක් බොහොම සතුටින් මෙහි තබමි ලියා
සිතුවාටත් වැඩිය ප්‍රදීපය කියවනු ඇතැයි කියා
කියවන බව දැකගැන්මයි අද ඒ වැඩි දුරක නොයා

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව

# දිරිය උදව්ය

පාසල් යෑම හිටි හැටියේ කැඩුනාය
සුළු පඩියකට රස්සාවක් ලැබුනාය
පාරේ වැඩ පොළේ පාසල මැවුනාය
කොයි කවුරුනුත් ඇඳුරන් ලෙස පෙනුනාය

සීනි නැති කහට හිස් බඩ පෙවුනාය
දවල්ට යන්තමින් අහරක් ලැබුනාය
තෝසයකින් රෑ බඩගිනි නිවුනාය
බතක් කෑ දිනක් මතකෙහි නොවුනාය

වතුර කෝප්පෙන් තනිකම මැකුනාය
කුප්පි ලාම්පුව තෙල් නැති නිවුනාය
නිඳිමත ඔළුව පොත මතටම එබුනාය
මතු පැතුමන් එහෙත් සිත තුළ පිපුනාය

අසා මෙවැනි තතු නූතන ජනකාය
හිතලූ බොරු කතාවක් යයි පවසාය
මෙවගෙ දිරිය උදව්ය පෙර සිටියාය
විසිවන සියවසේ මුල හිඟ නොවුනාය

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**

# ගේ කුරුල්ලනේ



දොරකඩ උළුවස්සේ
සුදු හුණු ගෑ මුට්ටියේ
ගීත ගයන කුරුල්ලනේ
තනිකර අප යන්න එපා
දරුවන් ගියා මගේ
කොළොම් පුරේ දුර කතරට

ගත දැවටිලා හිටිය
පොඩි පැටව්
ඔවුන්ටම කියා කුඩු තනන්නට
ගියා ඉගිලිලා
මහළු අපි දැන්
පාළුවේ තනියෙන්
ඉගිල යන්න නම් එපා
ගේ කුරුල්ලනේ

**සුනිතා මාලනි විජේසිංහ**
මතුගම

## චතාරික පැතුම

ඉකිබිඳියි බඩසයින්
දුගී දන වැලපෙමින්
හේබා වූ දිවි'ගිරගෙ
ලසෝගිනි ඇවිලෙන්නේ
කැණිමඬල දෙදරලා
හිස මතට වැටීලා

වියපත් ඔත්පලවූ
පුලන්නන්ගේ
පෙලෙන්නන්ගේ
දුගී හද සනහන්න
මේ චතාරික සමය
අත් වැලක් කර ගමුද?

දූෂණ..... භීෂණය
රජවෙලා සකල දෙස
පිපෙන්නට පෙරාතුව
මල් කැකුළු හපකරන
නොමග ගිය සලෙළුදන
සුමඟ යාදෝ කෙදා.....!

සිත් සතන් පුරෝගෙන
දම් පවන් සලමින්න
කිතු සමිඳ නාමයෙන්
උන් සැමව සනසන්න....!
මේ චතාරික සමය.

**ෆ්‍රැන්සිස්කා ගුණතිලක**
වත්තේගම

# තෙවෙනි ගමන



සුරතල් වෙවී පොඩි අවධියේ සිටියෙ මින
රසවත් අහර පාන මුඛයටමත් ලැබින
සැමගෙන්ම නො අඩුව ආදරයත් එක ලෙස ලැබින
එහෙ මෙහෙ ගියෙත් අරගෙන 'අතපිට' ගමන

පාසල් විය පසුකරන් රැකියාවට ගිය ගමන
ලොකු පොඩි ප්‍රශ්න හරිම දුෂ්කරයි මේ ගමන
සදා මනින්නට මිනුම් ඇඬු නැත යන එන ගමන
නියමිත දින දක්වා යා යුතුවෙයි 'මිහිපිට' ගමන

වයසට ගිහින් කල් ගෙවනා කල නිසොල්මන
දෙනදේ කන්න බැහැ අය්යෝ අතට ගෙන
හිත මිතුරන් නැහැ එන්නේ ඉන්නේ බලාගෙන
සැමගෙන් සමු අරන් යන්නට 'කරපිට' ගමන්

**බැසිල් එල්. කාරියවසම්**
වැලිවිට

# මරියා නම් වූ ළඳ

දෙව් ලොවින් පහලවූ දෙව් ලියක් නොවේ ඇය
මිහිලොවේ යස ඉසුරු මාලිගා නොමැති ඇය
දැසි දසුන් පිරිවැරූ කුමරියක් නොවූ ඇය
ජුදයාවේ දිවිගෙවූ නමින් මරියාය ඇය

දෙමව්පිය රැකවරණෙ දහමින් වැඩුන ඇය
යොවුන් විය යහ ගුණෙන් පිරිපුන්ව සිටිය ඇය
දෙවිඳුන්ගෙ හදවතේ ලියැවී තිබුණ ඇය
දෙව්ඳුතු පණිවුඩෙන් සලිත වූවාය ඇය

මොහොතකට හදවතින් සලිත වුවත් ඇය
පිරී සුදතුම් බෙලෙන් ඒ මොහොතෙදිම ඇය
දෙව්පියගෙ කැමැත්තට එහෙයි කියමින් ඇය
දෙව් පුතුට තම කුසය පුද දුන්නාය ඇය

මුළු ලොවේ විමුක්තියෙ මග සදන්නට ඇය
කැපකළා මුළු දිවිය දෙව් අභිමතට ඇය
කරදර කම්කටොලු හමුවෙ පසු නොබැස ඇය
කුරුස පාමුල තෙක්ම නොනැවතී ගියාය ඇය

**බෙනී ජයමාන්න**
අගරදගුරු පදවි මරිය හමුදා කොමිටිසියම

# ලෙබනනයේ කිතුනුවන් ද ඉස්ලාම් වරුන් ද මරිය බැතියට එක්වෙති

වර්ෂ 2008 සිට, ලෙබනනයේ මරිය තුමියට මංගලම් කීමේ මංගල්‍ය දිනය වන මාර්තු 25 වෙනිදා ජාතික නිවාඩු දිනයකි. මේ වසරේ එදින කිතුනුවෝ ද ඉස්ලාම් වරු ද එකට එක්ව, "අපේ ස්වාමි දියණිය වන මරිය තුමී වටා එක් වෙමු" යන තේමාව යටතේ වන්දනීය යැදුම් මෙහෙයක් ද පැවැත්වූහ.

යැදුම් මෙහෙය අවස්ථාවේදී, ශුද්ධාසනයේ අන්තර් ආගම් කතිකාව පිළිබඳ ලේකම් මිගෙල් ආන්ජල් අයේසෝ පියතුමා මෙලෙසින් ද අනුශාසනාවක් කළේය. "මරිය තුමිය කෙරෙහි කිතුනුවන් හා ඉස්ලාම් වරුන් විසින් ගෞරව දැක්වීමේ හේතුවෙන් මිත්‍ර සම්බන්ධයක් බිහිවී තිබෙනවා. ඒ අනුව කිතුනුවන් හා ඉස්ලාම් වරුන්ට ඇදැහිල්ලේ ද, අධ්‍යයනයේ ද, බෙදා හදා ගැනීමේ ද පරමාදර්ශයක් බිහිවී තිබෙනවා."

දේව මාතාවන්ට මංගලම් කීමේ මංගල්‍යයන් දිනැ ලෙබනනයේ ජාතික නිවාඩු දිනයක් බවට ප්‍රකාශ කිරීමෙන්, කිතුනුවන් හා ඉස්ලාම් වරුන් සහෝදරත්වයෙන් ජීවත් වීම පිළිබඳ මහරු සාක්ෂියක් ලොවට ප්‍රකාශ කරනු ලබන අතර, එය මෙම ආගමික දෙපාර්ශවය ජීවත් වන්නාවූ ආකාරය ලොවැ අනෙකුත් රටවලට ආදර්ශයක්" යයි ද එතුමා විසින් අවධාරණය කරනු ලැබීය.

## ඉරාකයේ කිතුනු නායකයෝ ඡන්දය පාවිච්චි කරන්නැයි කිතුනුවන්ගෙන් ඉල්ලති



ඉරාකයේ ජාතික මැතිවරණය අප්‍රේල් මස 30 වෙනිදා පැවැත්වීමට නියමිතය. එම මැතිවරණයේදී දේශයේ ජාතික කවුන්සලය සඳහා නියෝජිතයන් 320 දෙනෙක් පත් කරනු ලබයි. තවත් ආසන පහක් වෙන් කොට ඇත්තේ, කිතුනු නියෝජනය සඳහාය. ඉරාක ව්‍යවස්ථාව අනුව, එරටේ ජනාධිපති හා අගමැති මහජන ඡන්දයෙන් තෝරා නොගන්නා අතර, ඔවුන් මහජන කවුන්සලය නොහොත් පාර්ලිමේන්තුව විසින් තෝරා පත්කරනු ලබයි.

ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයන් ප්‍රකාර මැතිවරණය පවත්වමින් මහජන කැමැත්ත ප්‍රකාශ වන අයුරින් මැතිවරණ සිදුවෙන ලෙසට මේ සමයේ නිරන්තර යැදුමේ යෙදෙනා ලෙස ඉරාකයේ කිතුනු ජනතාවගෙන් සුවිශේෂී ඉල්ලීම් කරමින්, සියළුදෙනා විසින් සිය ඡන්දය භාවිත කරනා ලෙසට, ඉරාකයේ කිතුනු නායකයෝ ඉල්ලා සිටිති.

## මරිය තුමියගේ නිරහංකාරය ගැළවුම් මග හෙළි දක්වයි

ප්‍රැන්සිස් සසුන් පියා, විසින් මරිය තුමියට මංගලම් කීමේ දිව්‍ය යාගයේදී කළ අනුශාසනය එතුමාගේ වදනින් මෙසේය. "ආදම්ගේ අකීකරු භාවයේ බැම්ම ලිහා දැමුවේ මරිය තුමිය විසින්ය. ආදම්ගේ පාපය ඔහුගේ උඩංගුවයි. ආදම්ගේ පාපයේ වරද මරිය තුමියගේ ජීවිතය තුළ තිබුනේ නැත. ඇදැහිලි වන්තයන්ට අහංකාරයට එරෙහිව සටන් කරන්නට සිදුව ඇත."

"මරිය තුමියගෙන් උගෙන ගත යුතු පාඩම කීකරු බව හා නිරහංකාර බවයි. ගැළවුම මිලයට ගැන්මට හෝ විකුණන්නට හැකි දෙයක් නොවේ. ගැළැවුම ත්‍යාගයකි. ගැළැවුම අපට ප්‍රදානය කොට ඇත. ඒ පිළිබඳ ගෙවීමක් නැත.

ගැළවීම අප විසින්ම ලබා ගත හැක්කක් නොවේ. ගැළවුම පූර්ණ ත්‍යාගයකි. එම ගැළවීමේ ත්‍යාගය ලබාගැනීම සඳහා, එය අපේ හැකියාවන් මත නොව. දෙවිඳුන් විසින් ප්‍රදානය කරනු ලැබීමෙන් බැව් පිළිගත යුතු වේ."

## සසුන් පියා මාෆියාවට ගොදුරු වූ පවුල් හමුවේ

මාර්තු මස 21 වෙනිදා, සසුන් පියා රෝමයේ සාන්ත ග්‍රෙගරි තුමාගේ දෙව් මැඳුරට පැමිණියේ එදිනැ පැවැති සර්ව රාත්‍රි මෙහෙයකට සහභාගි වීම සඳහාය. එහිදී එතුමා, හොර කල්ලි (මාෆියා) විසින් මරා දමනු ලැබූ පවුල් වලැ බිරින්දෑ ද දු දරුවන්ද පිතෘක සෙනෙහසින් හමුවූහ.

එතුමා එකිනෙකා හා කථා කරමින් ඔවුන් දිරිමත් කළෝය. මාෆියාවට එරෙහිව ක්‍රියා කරනු ලබන සියළු දෙනාගේ ක්‍රියා කලාපයන් ප්‍රශංසාවට ලක් කරමින් ඔවුන් වෙතැ දේවාරක්ෂාව ද ප්‍රාර්ථනා කළ සේක. හද පිරුණු සොවින් හා සමා ඉරියව්වෙන් උන්වහන්සේ කොහේ හෝ සිටිනා හොර කල්ලි මෙලෙස ඇමතූ සේක. "මම ඔබ ඉදිරියේ දෙපා නගා ආයාචනය කරන්නේ, ඔබේ මාෆියා රටාව වෙනස් කොට දෙවිඳුන් වෙතට හැරී එන ලෙසටයි. ඔබ විසින් සොරා ගනු ලබන කිසිදු ආකාරයේ වස්තුන්, ඊළඟ ජීවිතය කරා රැගෙන යෑමට නොහැකි බැව් සිතන්න. එම නිසා ඔබේ දිවි ගමන වෙනස් කර ගන්නට තවත් ප්‍රමාද නැහැ. එබැවින් ඔබේ හා ඔබේ ආදර දරු දැරියන්ගේ යහපත සඳහා සිත් හැරීමේ තීරණය මහඟු ලෙසින් එල දරුනු ඇත."

## තුවක්කු කරුවෝ දෙව් මැඳුරට පහර දී බැති මතුන් මරති

දකුණු කෙන්යාවේ ලිකෝනි නම් ප්‍රදේශයේ පිහිටි ප්‍රොතෙස්තන්ත දෙව් මැඳුරකට කඩා වැදුණු තුවක්කු කරුවෝ කීප දෙනෙක්, බැතිමතුන්ට වෙඩි තබා හය දෙනෙකු එතැනම මරා දමා, තවත් ගණනාවක් මාරාන්තික බවට පත් කළෝය.

ඇතැම් ප්‍රවෘත්ති ඒජන්සි විසින් වාර්තා කරනු ලැබ ඇත්තේ, දෙව් මැඳුර තුළ මෙම මරණ හානිය කර ඇත්තේ, සෝමාලි ජාතික ත්‍රස්ත කංඩායමක් විසින් බවයි.

අදාළ දේශය ඉස්ලාම් ත්‍රස්ත කංඩායම්ගෙන් පිරී ඇති බවත්, මධ්‍යස්ථ ඉස්ලාම් නායකයින්ට පවා මරණ තර්ජන එල්ල කරනා බවත් ප්‍රකාශ කරනු ලැබුවේ, කෙන්යාවේ මලින්දි ප්‍රදේශයේ එම්මානුවෙල් බාර්බරා රදගුරු තුමන් විසිනි.

තවද රදගුරු තුමා විසින් මෙලෙසින් ද දක්වා ඇත. "ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් අතර ද, විරුද්ධවාදිකම් උග්‍ර අන්දමින් පවතී.

ඔවුනොවුන්ගේ ව්‍යාපාර කටයුතු වර්ධනයෙහි ලා අනෙක් අය විනාශ කැරුමට ත්‍රස්ත කංඩායම් වලැ සහාය ලබා ගන්නේ ඔවුන් හට මුදල් ලබා දෙමිනි. එම ත්‍රස්ත කංඩායම් තරුණයන් ගෙන් සමන්විත වන අතර, ඉන් බොහෝ දෙනා සෝමාලියානු ජාතිකයන් බැව්ද හෙළි වී ඇත."

මෙම වාතාවරණය යටතේ කිතුනුවන්ටද ආරක්ෂා සහගත ලෙසින් ජීවත් වන ලෙසට ඉල්ලීමක්, සැමදෙනා වෙනුවෙන් දේවාරක්ෂාව ද ප්‍රාර්ථනා කළ සේක.

## ඉන්දුනීසියානු අධිකරණය ඉස්ලාම් ත්‍රස්තයන්ට හිස නමයි

ඉන්දුනීසියාවේ දකුනු ජාවා හී කතෝලික දෙව් මැඳුරක් තැනීමට බලධාරීන් විසින් අවසර දී තිබිණි. එසේ අවසර දී තිබුණේ, දිගු කලක් තිස්සේ කළ ඉල්ලීම ප්‍රකාර නියමිත කොන්දේසි සපුරා තිබීමෙන් පසුවය.

එසේ වුවද එම අවසරයට එරෙහිව, උසාවියේ පෙත්සමක් ගොනු කොට තිබුණි. එම විරෝධතා මෝසම විභාගයට ගනු ලැබූ දිනයේදී, උසාවි සංකීර්ණය, ඉස්ලාම් ත්‍රස්තවාදීන්ගෙන් පිරී තිබිණි. එපමණක් ද නොව එම විශාල ත්‍රස්ත පිරිස්, ලබා දී තුබූ අවසරය ඉවත් කරන්නැයි මහා ඝෝෂා කළහ. එම තත්ත්වය තවත් විශාල විනාශයකට මඟ පෑදී තිබිණි.

එම නිසාවෙන් තමන් යුක්තිය විසඳළීමේ නියුතුව සිටියත්,



ත්‍රස්ත කංඩායම් වලැ තර්ජනයට නතු වන්නට සිදුවූ බැව් වාර්තා වී ඇත. ඒ අනුව කතෝලික දෙව් මැඳුර ගොඩනැගීම සඳහා රජයේ බලධාරීන් විසින් දී ඇති අවසරය, ගැටුම් නිර්මාණය වේයයි යන තර්කය මත අධිකරණය විසින් අවලංගු කරනු ලැබීය.

සිද්ධිය පිළිබඳව කතෝලික ජනතාවගේ දේව සේවක රුඩියන්තෝ පියතුමා විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, කාලාන්තරයක් එම කතෝලිකයන් විසින් අදාළ සියළු නියමයන් සපුරා තිබියදීත් ත්‍රස්තවාදී කල්ලියේ බලපෑම නිසා අධිකරණය විසින් දෙව් මැඳුර ඉදිකරනු ලැබීමට අවසර නොදීම.

ආගමික හා මිනිස් අයිතිවාසිකම් අමු අමුවේ විනාශ කිරීමක් බවය.

## පාපොච්චාරණයේ අත්දැකීම වර්ධනය කැරෙනා වෙබ් අඩවියක්

"ආපසු හැරී එන්න." නම් කතෝලික ධර්මදාන කංඩායම විසින් පාපොච්චාරණයේ අතිශය වැදගත්කම හා සමිඳුන් හා නිරන්තර සම්බන්ධතාවය වර්ධනය කරවනු සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කරනු ලැබ ඇත.

"Goodconfession" නම් එම වෙබ් අඩවිය ඔබ සැමට ද ඇසුරු කළ හැක. පාපොච්චාරණයේ ප්‍රසාද නිධානය නිතර නිතර පාවිච්චි කරනා අයට මෙන්මැ ඉන් ඈත් වී සිටිනා අයටද මෙම වෙබ් අඩවිය ඔස්සේ අවස්ථාවක් ලබාදීමට මං සළසවනු බැව් "ආපසු හැරී එන්න." නම් සංවිධානයේ සාමාජිකයෝ පවසති.

එම ආයතනයේ සභාපති ටොම් පීටර්සන් මෙලෙසින් ද දක්වා සිටී. "අප එකිනෙකාගේ ජීවිත හා පොදු ජීවිත තුළ සැබෑ සංතුෂ්ටියක් හා ශුද්ධ භාවය උදාකර ගැන්මට. නිරන්තර පාපොච්චාරණය අවශ්‍ය අධ්‍යාත්මික අත්දැකීමකි. තවද, සිය කතෝලික ජීවිත පැවැත්මෙන් ඈත් වී සිටිනා අයට පමණක් නොව අන් කතෝලික අයට ද මෙම වෙබ් අඩවිය ඔස්සේ නව ජීවිත අත් දැකීමක් අයත් කර ගැන්මට හැකිවනු ඇත."

## හින්දු භක්තිකයන්ට පහරදීම කතෝලික සභාව හෙළා දකී



පකිස්තානයේ දකුණු පළාතේ ලක්නා හී පිහිටි "ධාරාම් පාලා" නම් සුප්‍රකට හින්දු කෝවිලකට, ඉස්ලාම් ත්‍රස්ත කංඩායමක් විනාශකාරී පහරක් එල්ල කළෝය. ඒ නිසාවෙන් කෝවිලේ පවත්නා ආගමික භාණ්ඩයන්ට ද දැඩි හානි සිදුවී තිබේ. 'හෝලි' නම් ආගමික පිළිවෙතට සහභාගි වෙමින් සිටි බොහෝදෙනා තුවාල ලදහ.

මෙ සිද්ධිය ද අළලා පකිස්තානයේ කතෝලික රදගුරු මංඩලය ප්‍රකාශයක් කරමින් එම සිද්ධිය අතිශය අමානුෂික ක්‍රියාදාමයක් ලෙසින් හෙළා දකිමින්, සියළු ආගමික ස්ථානයන් සුරකිනා ලෙසට රජයෙන් ද ඉල්ලීමක් කළේය. වරින් වර හින්දු භක්තිකයන්ට පහර දීමට හේතු වී ඇත්තේ, ඉස්ලාම් වරුන් විසින් හින්දු චාරිත්‍ර වාරිත්‍රයන්ට හා ඇදැහිල්ලට විවිධාකාර පරිභවයන් එල්ල කරනු ලැබීම බවයි.

කිතුනු හා හින්දු ආදී, ආගම් කෙරෙහි ඉස්ලාම් වරුන් විසින් දක්වනු ලබන වැරදි උගැන්වීම් හා විරෝධතාවයන් හේතුකොට ගෙන පකිස්තානයේ පවත්නා සුළුතර ආගම් පීඩනයන් හී කිසිදු අඩුවක් වේයයි ද සිතිය නොහැක. මන්දයත් ඉස්ලාම් විදුහල් වලැ සිසුසිසුවියන් අධ්‍යාපනය කරනා පත පොතෙහි පවා, සුළුතර ආගම් විරෝධි උගැන්වීම් සංගෘහිත වේ.


ආගමික නිදහස තහවුරු නොකිරීමෙන් ලෝ පුරා යුධ කෝලාහල වර්ධනය වෙමින් පවත්නා සමයේදී, "තරුණ සාම සමුළුවක්" බංජාබ් හී මුල්ටාන් ප්‍රදේශයේදී පසුගිය සතියේ පැවැත්විණි. එම සමුළුවේ මුඛ්‍ය අරමුණ වී තිබුණේ, ඉස්ලාම් වරුද, කිතුනුවන් ද හා හින්දු වරුන් ද සහභාගි කරවා ගනිමින් ආගමික හා ජාති භේදයන්ගෙන් තොර දේශයක් ගොඩනැංවීමට තරුණ දායකත්වය ලබාදීමයි. එම සියළු ආගමික තරුණ තරුණියෝ එකට එක්ව මුස්ලිම්, කිතුනු හා හින්දු ආගමික ස්ථාන කරා ගොස් ඒවායේ ලැගුම් ගෙන සමගි සහෝදරත්වය ප්‍රගුණ කළෝය. මෙම පියවර ආගමික සමඟිය සඳහා යහ මගක උදාවක් ලෙස කිතුනු පුවත් විසින් ද වාර්තා කොට ඇත.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

**ජේසු සමඟ දේව සේවයේ යෙදී සිටි වනිතාවන් අතර "මරියා" යන පොදු නමින් හඳුන්වන ලද මරියාවන් සත් දෙනෙකු වූහ. ඒ අතර විපුල ප්‍රසාද ලත් භාග්‍යවන්ත මාතාව වූ කන්‍යා මරිය තුමිය ද සිටියාහ. ස්ප්‍රීතු සාන්තු විසින් ගැබ බැස කන්‍යා මරිය තුමියගේ කුසින් ජේසුස් වහන්සේ උපන්නා හ.**

# "ගර්ජනා පුත්‍රයා" තම නිවසට ජේසු සමිඳුන්ගේ මෑණියන් පිළිගත්තේ මන්ද?



එක් දිනක් උන්වහන්සේ නාසරෙත් නුවර දී ප්‍රඥාව විදහා පාමින් හාස්කම් කරනු දුටු සමහරුන් මවිත වූහ. "මොහුට මේ ප්‍රඥාව හා හාස්කම් කිරීමේ බලය ලැබුනේ කොහෙන් ද? මොහු වඩුවාගේ පුතා නොවේ ද? මොහුගේ මවගේ නම මරියා නොවේ ද? මොහුගේ සහෝදරයෝ ජාකොබ්, ජෝසෙප්, සීමොන්, ජුදාස් නොවේ ද? යන්න, (මතෙව් 13:55 හා මාක් 6:3) කුමන මත අනුව නිගමනය කරන්න අදහස් කළත් අසන ලද සෑම ප්‍රශ්නයක් පාසාම, "නොවේ ද?" යන ප්‍රශ්නය ඇසු කල, උන්වහන්සේ කාගේ කවුද? උන්වහන්සේගේ මෑණියෝ කවුද? උන්වහන්සේගේ ඥාති සහෝදරයන් කාගේ කවුද? යනුවෙන් පැහැදිලිවම හඳුනා ගැනීමෙන් පසු අනන්‍යතාවය සනිටුහන් කළහ. එදා බොහෝ පරිසිවරු ද විනයධරයෝ ද උන් වහන්සේට විරුද්ධ අය වූහ. එම නිසා ඔවුන් හට එක් ගැටලුවක් විය. ඒ උන්වහන්සේගේ ප්‍රඥාව හා හාස්කම් කිරීමේ බලය ගැන ය. එහිදී එතැන සිටි ඥාති සොහොයුරන් සමඟ උන්වහන්සේ කළ හාස්කම් ගාම්භීර වී යැ"යි ද නැතහොත් ඥාති සහෝදරයන් හා එකතුව මදි පුංචි කමක් වී යැ' යි ද ඔවුන්ට සිතෙන්නට ඇත. එහෙත් අද මූලධර්මවාදීන්ට වාගේ සහෝදර සබඳතාවයන් ගැන මිථ්‍යා මත ගැටලුවක් එදා ඔවුන් හට මතු වූයේ නැත. එදා මුල් කිතුනුවන්ගේ ජීවිත පැවැත්මේ ලක්ෂණ ලෙස සහෝදරත්වය හඳුන්වා දී පෙන්නා දී තිබූ අතර එකිනෙකා සහෝදරයන් මෙන් පිළිගැනීමක් වැනි කිතුනු ගුණාංග ද බොහෝමයක් පැවතින.

**‘ මරණ ප්‍රාප්තියට අනතුරුව එතැන් සිට තම මවගේ වගවීමට, තමන් හට එක කුස උපන් සහෝදරයන් කිසිවකු නොමැති බැවින්, මරණ වේදනා විඳ, උකුත් වන්න මොහොතකට පෙර එම වගවීම ගර්ජනා පුත්‍රයකු වන උන්වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා වූ "ජොහාන්" වෙත තම මෑණියන්ව පිළිගැන්වීම, ගෞරවාන්විත හේතුව වූ සේක. ’**

## යථාර්ථවාදී නම්

එහෙත් මූලධර්මවාදින් තම ප්‍රචාර වලට රවටා ගන්න, සමහරුන්ගේ ගෙවල් ගෙවල් ගානේ ඇවිදලා කියන්නේ, ඇත්ත හෝ යථාර්ථය නොවේ. වෙනස් අදහස් මවා පෑමට මතයක් හදලා ඒ මතය ඇත්ත හෝ යථාර්ථ කරන්න වෙර දරා මුසාවාද පවසන්නෝ ය. එම මත තමන්ගේම තනි මත වේ. එවිට බොහෝ දෙනෙක් එය පිළිගන්නේ නැත. එබැවින් අප "නව ගිවිසුම" හරහා ඉදිරිපත් කරනු ලබන දෑ, උසස් ප්‍රතිචාර හරහා සිදු වන බැවින් කිසිදු සාධකයක් ප්‍රතික්ෂේප කරන්න හැකියාවක් කා හට හෝ ඇති වන්නේ නැත. එහෙත් කාගේ හෝ උවමනාවකට පවතින සත්‍ය සහ යථාර්ථය යටගිහින් තිබුණත්, යථා තත්ත්වය මතු කරන අව්‍යාජත්වය දකින්න, එතරම් අපහසු වන්නේ නැත්තේ, අභ්‍යන්තර බලවේග බලයෙන් සත්‍ය පහදා දෙනු ලබන හෙයින.

## සහෝදරයෝ නම්

කිතුනු ඇදහිල්ලට ගලීලයේ සිට පැමිණි කාන්තාවෝ බොහෝ දෙනෙක් තම දූ පුතුන් ද සමඟ උන්වහන්සේට ඇප උපස්ථාන කරන්න වෙහෙස වූවෝ ය. එම කාන්තාවන් අතරින් එක් කරුණාවන්ත මරියාවක් තම පුතුන් වන "කුඩා ජාකොබ් සහ ජෝසෙප්ව" උන්වහන්සේගේ කාර්යයන්ට දායක කර වූවාය. (මාක් 15:40, මතෙව් 27:56) එමෙන්ම වඩුවාගේ පුතා ළඟ සිටියා යැ'යි කියනු ලබන මෙම දෙදෙනා හැරුණු විට අනෙක් දෙදෙනාගෙන් එක් අයකු වූ "සීමොන්" නොහොත් අන්ත ජාතිවාදියා'යි නම් ලත් තම පුත්‍රයාව ද උන්වහන්සේගේ මෑණියන්ගේ සහෝදරියක් වූ" මරියා තම ස්වාමි පුරුෂයා වූ ක්ලෝපාස් හා එක්ව උන්වහන්සේගේ ගෝලයකු ලෙස පත් කළහ. (ජොහාන් 19:25) මේ පිළිබඳ කතෝලික විශ්ව කෝෂය ද යෝජනා කරන අන්දමට ජෙරුසලමේ සීමොන් යන නමින් ද අන්තජාතිවාදි සීමොන් යන නමින් ද හඳුන්වනු ලබන්නේ "අන්තජාතිවාදි සීමොන්" යන එකම පුද්ගලයා ය. එමෙන්ම මොහු මරියාවන් අතරින් තවත් එක් මරියාවක් සහ ක්ලෝපාස් යන යුවළකගේ පුතකු බවට ද "ජේසුගේ පාලක පෙළපත" නමැති කෘතියෙන් ජේම්ස් වෙබර් යෝජනා කරයි. මීට අමතරව එතැන සිටි "ජුදස් තද්දේවුස් ද අල්පේවුස් නමැති අයගේ මුණුබුරෙකි. ඔහු "සාධාරණ ජාකොබ්" ගේ පුතෙකි. (ලූක් 6:15,16; ක්‍රියා 1:3) ඔහු ද එතැන සිටි ලේ ඥාති සහෝදරයෙකි.

ඉහත කියන සත්‍ය සිද්ධාන්ත අනුව ජාකොබ්ලා තිදෙනෙක් සිටියහ. ඔවුන් අතරින් කුඩා ජාකොබ්,ජෝසෙප්, අන්තජාතිවාදි සීමොන් සහ ජුදස් තද්දේවුස් වන ඥාති සහෝදරයින් සමඟ එදා උන්වහන්සේ හාස්කම් කළ සේක. (මතෙව් 13:55 හා මාක් 6:3) එදා ජුදා පරම්පරාවෙන් එන ලේ ඥාතිත්වය; ආත්මිකව, ධාර්මිකව, සංකේතනාත්මකව උන්වහන්සේ අර්ථකථනය කළ සේක. මාගේ මෑණියෝ කවුරුන් ද? මාගේ සහෝදරයෝ කවුරුන් ද? පවසමින් සිය ශ්‍රාවකයින් දෙසට අත දිගු කොට, මෙන්න මාගේ මෑණියෝ සහ සහෝදරයෝ! ස්වර්ගයේ සිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන කවුරුන් වුවද ඔව්හු මාගේ සහෝදරයාත් සහෝදරිත් මාගේ මෑණියොත්ය"යි වදාළ සේක. (මතෙව් 12:48-50) මෙයින් අනාවරණය කරන සත්‍ය එකවරම තේරුම් ගැනීමට අපහසු නැත. ඒ සඳහා ඉතා අවංක, ඉතා නිහතමානී ගුණාංගයන් මඟින් ඉතා ගැඹුරට අර්ථකථනය කළ යුතුය.

## බෝවනර්ගස් නම්

එදා කුරුසිය ළඟ සිටි බොහෝ දෙනා අතර ලේ ඥාතින් ද සිටියහ. උන්වහන්සේ සුරතල් නමින් අමතනු ලැබූ "ගර්ජනා පුත්‍රයෝ" යන අර්ථය දෙන "බෝවනර්ගස්" යයි උන්වහන්සේ නම් කළ සහෝදරයන් දෙදෙනා ද එතැන වූහ. (මාක් 3:17) ඔවුන් දෙපළ නම් "උදාර ජාකොබ් සහ ජොහාන්" ද වූහ. ඔවුන් "සෙබදිගේ සහ සලෝමිගේ" පුතුන් බව ද සනාථ වේ. (මතෙව් 20:20; 27:56; මාක් 15:40; 16:1 සහ New compact Bible Dictionary - Edited by Alton Bryant. Page 516 ද පවසයි.)

එදා එවන් පරිසරයක, කුරුසිය අසළ උන්වහන්සේගේ මෑණියෝද සිටියාහ. එකල උන්වහන්සේ තම මෑණියන් අමතා "ස්ත්‍රිය, මෙන්න ඔබේ පුත්‍රයා ය" යි ද තමා ප්‍රේම කළ ශ්‍රාවකයා අමතා "මෙන්න ඔබේ මෑණියන් ය" යි ද වදාළ සේක. ඒ මොහොතේ සිට ඒ ශ්‍රාවකයා තම නිවසට ඇය පිළිගත්තේ ය. (ජොහාන් 19:26,27) එවන් දේව වචන මත පිහිටා තීරණාත්මක කාර්යයක් උන්වහන්සේ අතින් නියමාකාරයෙන් සිදු වූ සේක. "උන්වහන්සේගේ සුරකි පියාණන්ගේ අභාවයෙන් පසුව, තමන්ව වැදූ අම්මාව, ලාබාල කල සිට, එනම් උන්වහන්සේව ජුදෙව්වන් කුරුස ගසෙහි එල්ලනු ලබන්න තීරණය කළ මොහොත දක්වාම ආරක්ෂා කිරීම උන්වහන්සේ අතින් සිදුවූ සේක. එහෙත් මනුෂ්‍ය ස්වභාවයේ දී සිදුවන මරණ ප්‍රාප්තියට අනතුරුව එතැන් සිට තම මවගේ වගවීමට, තමන් හට එක කුස උපන් සහෝදරයන් කිසිවකු නොමැති බැවින්, මරණ වේදනා විඳ, උකුත් වන්න මොහොතකට පෙර එම වගවීම ගර්ජනා පුත්‍රයකු වන උන්වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා වූ "ජොහාන්" වෙත තම මෑණියන්ව පිළිගැන්වීම, ගෞරවාන්විත හේතුව වූ සේක." එදා ජුදෙව්වන් හට ද එම හේතුව අවබෝධ වූහ.

"එසේ හෙයින් මේ දේව ද්‍රෝහි, පාපිෂ්ඨ පරම්පරාවේදී යම් කෙනෙක් මා ගැනත්, මාගේ ධර්මය ගැනත් ලජ්ජා වන්නේ ද මනුෂ්‍ය පුත්‍රයාණන් පියාණන්ගේ තේජශ්‍රීයෙන් ශුද්ධ දූතයන් පිරිවරා වඩනා කල උන්වහන්සේ ඔහු ගැනත් ලජ්ජා වනු ඇත." (මාක් 8:38) මෙලෙස මිනිස් ජීවිත ගැන ගැඹුරු යථාර්ථයන් සත්‍යයන් අපට වැටහීමට, අවබෝධ වීමට පටන් ගන්නේ, දහම මෙනෙහි කිරීමේ දී ය. එබැවින් මිනිසුන් ළඟ තිබෙන ධර්මිෂ්ටකම, ආචාර ධර්ම පද්ධතිය, නීති රීති වැනි දේවල් අවප්‍රමාණය නොවනවිට, මිනිස්කමේ සීමාව ඉක්මවා නොයන විට, ඔළුවේ තිබෙන ඇත්ත යථාර්ථය ඔවුන් දකින්නාහ. එවැන්න ඉටු කර ගන්න අනිවාර්යයෙන්ම "නව ගිවිසුම" තේරුම් ගත යුත්තේ ය.

**බැසිල් ඇන්ටනී**
**දෙහිපිටිආරච්චි - මොරටුව**





# "අල්ප වුනට කරන සේවෙ සුළු වුවත් මට කළේ"

"උත්ථානය ද ජීවනය ද මම වෙමියි" කියා මොර ගැසූ බැටළු පෝතකයාණෝ තම පියාණන් එතුමාට දුන් කඩුර දුක්ප්‍රාප්තිය පානය කළේ දේව පුතකු ලෙස නොව මිනිස් පුතකු ලෙසය. රෝම අධිරාජ්‍ය සෙබළුන්ගේ නින්දිත ක්‍රියාවන් තුළින් හෙම්බත්ව කෲර වධ ගාවිනා වලින් මිරිකී ගොස් සිටි එතුමා එදා ගොල්ගොතා යන කපාල පිටියට තම බරවූ කුරුසිය ද රැගෙන නිහඬ ගමනක යෙදුනි. ඇට, මස්, නහර සිදුරු වී ලෙයින් ගත නැහැවී විරූපී වී සිටි එතුමාගේ හිසට කටු ඔටුන්නකුත්, දෑත් වලට බර වූ කුරුසියකුත් දීමට තරම් එදා සමාජය පාපිතර විය.

ජුදයාව නම් වූ දෙවියන් වහන්සේට කැප කරන ලද යැයි විරුදාවලිය ලත් භූමියෙහි කුහුඹුවකුට හිමි අයිතියක්වත් දේව පුත්‍රයාට එදින නොලැබිණි. තම ශ්‍රාවකයන් එතුමා හැරගොස් ය. තම දේව වාක්‍යයට පිපාසිත වූ ජනතාව එදින එතුමාට විරුද්ධව කැරලි ගැසූහ. මඩ වගුරක් වුවත් එහි පිපෙන එකදු නෙළුම් මලකින් වුවද මුළු පළාතම ආලෝකවත් කරන්නා සේ වෙරෝනිකා නම් භක්තිවන්ත ස්ත්‍රිය රෝම සෙබළුන්ගේ අවලාද මධ්‍යයේ ජේසුස් වහන්සේ ඉදිරියට අවුත් දහින් වැටී එතුමාගේ ලෙයින් නැහැවී විරූපී වී ගොස් තිබූ ශ්‍රී මුහුණ තම අත්ලෙහි රැඳි රෙදි කඩින් පිස දැමීමට තරම් එඩිතර වූවාය. එදා ජුදා කාන්තාව මුළු ගැන්වුණු දිවියකට හුරු වී සිටියත්, මෙම වෙරෝනිකා නම් ජුදා කාන්තාව ඊට අභියෝගයක් විය. ඇයගේ එම නිර්මල පිරිසිදු ක්‍රියාවට ප්‍රති උපකාර වශයෙන් එම රෙදි කඩෙහි ජේසුස් වහන්සේ තම ලෙයින් නැහැවුනු දුක්බර ශ්‍රී මුහුණ රැඳවූහ. එතුමා ඇයගේ සිත තුළ එමඟින් දේව ආදරය සජීවි කළහ. කිසිදු පිහිටක් නැතිව අන්ත අසරණව සිටි ජේසුස් ස්වාමිදරුවන් හට එදා වෙරෝනිකා නම් භක්තිවන්ත ස්ත්‍රිය කළ මෙහෙය මහ මෙරක් බඳු විය.

ඔබත්, මාත් ජීවත් වන අද සමාජයේ දෘශ්‍යමානව ජේසුස් වහන්සේ නොසිටියත් දිව්‍ය සත්ප්‍රසාදය තුළ එතුමා ජීවමාන වේ. එනමුදු අදෘශ්‍යමාන ව හෝ එතුමා විවිධ තරාතිරම්වල චරිත තුළින් ප්‍රත්‍යක්ෂ වේ. එහෙත් ගැටලුව වනුයේ එදා සිටි වෙරෝනිකා අදටත් සිටිනවාද යන්නය. එදා වෙරෝනිකා ස්ත්‍රියක වුවත් අද වෙරෝනිකා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම අයත් වේ. ඔබේත් මගේත් එදිනෙදා දිවිය දෙසටම හැරී බැලුවහොත් අපට ජේසුස් ස්වාමිදරුවන් විද්‍යමාන වූ අවස්ථා අපමණ වේ. මහමඟ වේලක් හෝ කෑමට නොමැතිව අන්ත අසරණව සිටින මිනිසුන් කොපමණ වේද? එසේම සිතන්න දිනකට අප කොපමණ ආහාර ප්‍රමාණයක් අනවශ්‍යය ලෙස නාස්ති කරන්නේ ද කියාත් ඔබ මඳකට හෝ සිතුවා ද එම අනවශ්‍ය ආහාර වේලක් හෝ එම අසරණ මිනිසෙකුට පරිත්‍යාග කිරීමට. ඔබ ඒ අත්හැරියේ යාචකයාව නොව ජේසුස් වහන්සේවය. ඔබ කොපමණ අසරණ ජනතාව තලා පෙලා තමන්ගේ දිවිය සශ්‍රීක කර ගැනීමට වෙහෙසෙන්නේ ද? ලද දෙයින් සතුටු නොවී අහස උසට මාලිගා තනන්නේ ඒ දුගී ජනයාගේ ශ්‍රමයෙනි. නමුත් ඔබ ඒ ලබා දෙන ශ්‍රමයට සාධාරණය වෙනවා ද? ඔබ ඒ අසාධාරණය කරන්නේ ශ්‍රමිකයන්ට නොව ජේසුස් ස්වාමිදරුවන්ට ය.

අද ලෝකයේ කොපමණ අම්මාවරුන් තම පව්කාරකම් මකාලීමට තම කුසින් උපදින කිරි දරුවාව මහමඟ අත්හරිනවාද? අම්මේ, ඔබ ඒ අත්හැරියේ ඒ කිරි කැටියාව නොව ජේසුස් වහන්සේවය. බීමත් කමට වහල් වී තමන් හරි හම්බ කරනා දෙය තමන්ගේ සුඛෝපභෝගී දිවියට පමණක් යොදා තම දරු පවුල බඩගින්නේ තබන, ඔවුන්ව තලන පෙලන පියවරුන් කොපමණ වේද?

තාත්තේ, ඔබ එසේ කළේ තම දරු පවුලට නොව ජේසුස් වහන්සේටය. තම දෙමාපියන්ව වයසට යත්ම මහලු නිවසට ඇතුල් කර තම අත හෝදාගන්නා පාපිතර දරුවන් මෙලොව කොපමණ වේද? දරුවනි, ඔබ ඒ අත සෝදන්නේ තම අසරණ දෙමාපියන් මතට නොව ජේසුස් වහන්සේ මතටය. තවද තම දෙමාපියන් දහඹිඳු හෙලමින් හරි හම්බ කරනා මුදල් අනවශ්‍ය ලෙස වියදම් කරනා දරුවන් කොපමණ වේද? දරුවෙනි, ඔබ ඒ වියදම් කරන්නේ ජේසුස් වහන්සේගේ අසීමිත ආදරයයි.

☛ 15 පිටුවට

**නිරෝධා ෆොන්සේකා - හපුගොඩ මීසම**

# ප්‍රීතිමත් විවාහයක විද්‍යානුකූල ස්වභාවය

ස්වභාවධර්මය අනුව ගැහැනිය සහ මිනිහා නිර්මාණය වී තිබෙන්නේ අවශ්‍යමෙන්ම එකිනෙකා වෙනුවෙන් නොවේ. එතැන් සිට මේ දක්වා එබඳු ගැහැනියට හා මිනිසාට ප්‍රීතිමත්ව ජීවත් වීම සඳහා ඔවුන්ගේ ජාන මෙතරම් දක්ෂ වූයේ කෙසේද? මෙලෙස අප අතර පවත්නා වෙනස්කම් දීර්ඝකාලීන විවාහයක් පවත්වාගෙන යෑම සඳහා සත්‍ය වශයෙන්ම පදනම් වී ඇත.

එහෙත් විවාහක ජෝඩුවකට තමන්ගෙ 'ම යහපත සඳහා වඩාත් සමීප විය හැකිද? එවැනි ඉතා කිට්ටු ආශ්‍රය තුළින් ඔවුන් අතර බිඳ වැටීමක් සිදු විය නොහැකිද? එය එසේ විය හැකි බව, නවීන මස්තිෂ්ක විද්‍යාවෙන් පෙන්වා දෙනු ලැබේ. විවාහ ජීවිතයක විටින් විට ඇති වන වෙනස්කම් පිළිබඳ මනා අවබෝධයක් එකී යුවලට නොමැත්තේ නම් බිඳ වැටීම ඉක්මන් වේ. මේ අනුව අපේ ජීවිත කාලය තුළ අප විසින් පවත්වාගෙන යනු, ලබන සබඳතා වලදී මිනිස් මොළය තුළ ප්‍රතික්‍රියා මාලාවක් ම හට ගැනෙන බැවින් එය කල්තියා නිරතුරුව හඳුනාගත හැකි වේ. මෙලෙස විවාහයක් පවතින නොපවතින අවස්ථා දැනගෙන, අප එය හසුරුවා ගන්නේ කෙසේද?

ජීවිත කාලයක් තුළ පවත්නා යුග දිවියක් කෙරෙහි ගැහැනුන්ගේ හා පිරිමින්ගේ පළමු ප්‍රේමාන්විත ආකර්ශනය ඔවුන්ගේ මනසට බලපාන ආකාරය ගැන අවුරුදු 20 ක් තිස්සේ මම අධ්‍යයනය කළෙමි. ඒ අනුව සාර්ථක විවාහ ජීවිතයක රහස විය හැක්කේ ස්වකීය බිරිඳගේ හෝ සැමියාගේ හෝ හැසිරීම් වල වෙනස්කම් හඳුනා ගැනීමට සමත්වන අවබෝධය යැයි මම විශ්වාස කරමි. එය පියවර 05 කින් සමන්විත වේ.

**1 වන පියවර : ප්‍රේමාන්විත ආකර්ශනය (ROMANCE)**

කිසියම් යුවළක් දැන හැඳින කුළුපග වූ විට ඔවුන්ගේ මොලය තුළ ආදරය නමැති චෛතසික ආවේගය හට ගනී. මෙවිට ඔවුන්ගේ හැඟීම් දනවන රසායනික ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පවතී. ඒ අනුව සුවඳ ආඝ්‍රහණය කරන විට හෝ එකිනෙකා දෙස බලා සිටින හෝ ගැහැනියගේ හා මිනිසාගේ සිත (මනස) එකක් බවට පත් වේ. මෙහිදී එකිනෙකා කෙරෙහි ඇල්මක් ඇති කෙරෙන ඔක්සිටෝසින් (OXYTOCIN) හෝමෝනය දෙදෙනා තුළම ගලා විත් ඇවිස්සෙන සුළු අමුතු හැසිරීමක් හොල්මන් කරන්නට පටන් ගනී. අවසානයේ දී ආදරවන්තයින්ගේ ප්‍රමෝදය (LOVERS BLIES) කෙළවර වී, සම්බන්ධතාවයේ අලුත් ජීවවිද්‍යාත්මක අවධියක් ආරම්භ වේ.

**2 වන පියවර : මායාවෙන් මිදීම (DISILLUSIONMENT)**

මාසයකින් දෙකකින් හෝ ඇතැම් විට අවුරුද්දකින් දෙකකින් හෝ අපගේ ශාරීරික හෝමෝන හා මස්තිෂ්ක රසායන වෙනස් වීම ඇරඹේ. මෙහිදී මොළයේ පිහිටි සිවිය (CEREBRAL CORTEX) ට නොහොත් අපගේ සිතුවිලි හටගන්නා සිත (THINKING BRAIN) ට, මෙතෙක් අප හඳුනාගෙන සිටි පාර්ශවකරු, අප බලාපොරොත්තුව සිටි කෙනා නොවන බව හැඟේ. එයින් අප දෙදනා තුළම එක්තරා නුරුස්න ගතියක් හා සමහර විට බියක් ද ඇති වේ. මේ අනුව අප පළමු පියවරේ දීම (ප්‍රේමාන්විත ආකර්ශනය) විවාහ වූයේ නම්, දෙවන පියවර (මායාවෙන් මිදීම) වන විට අපේ අදහස් වෙනස් වන්නට පටන් ගනී.

මේ අවස්ථාවේ දී බොහෝ විට බිරිඳ වික්ෂිප්ත භාවයට පත් වේ. ඔහු තනිවම කුමක් සිතනවා ඇත්ද? තමන් දෙසවත් නොබලා සුව අසුනකට බරවී. හෙතෙම රූපවාහිනියට ආකර්ශනය වී සිටින්නේ ඇයි? ඔහුට දැන්මම තමා එපා වී ඇත්ද? ආදී සිතුවිලි සමුදායක් තුළ ඕ අතරමං වන්නීය. මේ නිසා තම සිතේ තිබෙන දේ ඔහු ඇට නොපවසා සිටින විට ඈ ඉතා සුළු දේටත් ඔහුට දොස් පවරයි. නමුත් ඈ එසේ කරන්නේ කුමක් නිසා දැයි සිතා ගැනීමට දැයි ඔහු අපොහොසත් වෙයි.

වසර කීපයක් ඔවුන් සුහදව සිටියා විය හැක. දැන් ඔවුන්ට දරුවකු හෝ දෙදෙනෙකු ද සිටිනවා විය හැක. එබැවින් ඈට තව මොනවාද වුවමනා? තමා වරදක් කරන බව ඔහුට සිතේ. නමුත් එය නිවැරදි කරගන්නේ කෙසේදැයි ඔහුට අවබෝධ නොවේ. මෙලෙස ආදරය වසා කම්බිලියක් පෙරෙව්වා සේ, පෙම්බස් තෙපලූ මුල් පියවරේදී මොළය තුළ ගලා ගිය හෝමෝන මේ වන විට විසිරී ගොස් තිබේ. දෙදෙනා අතරම වැරදි වැටහීමක් තිබෙන බව දැන් ඉතා පැහැදිලිය. මේ අනුව දෙදෙනාටම සිය අප්‍රසාදය ප්‍රකාශ කළ හැකි වේ. මේ කී ව්‍යාකුල අවස්ථාව දෙදෙනාගේ මොළය තුළට රසායනික හෝමෝන ගලා එන සාමාන්‍ය අවධියකි. එසේම එය ජීවිතය තුළ දෙදෙනාගේම එකිනෙකට වෙනස්, එහෙත් අත්‍යවශ්‍ය මොළයේ ක්‍රියාකාරිත්වයක් එකවිට පැමිණෙන ඊළඟ පියවර වේ.

**3 වන පියවර : බල අරගලය (POWER STRUGGLE)**

තමන් දෙදෙනාම මායාවකට හසු වී සිටින බව අවබෝධ වූ විට ස්වභාවයෙන්ම ඔවුහු බල අරගලයට යොමු වෙති. මෙහිදී දෙදෙනා තුළම අදෘශ්‍යමාන රසායනිකයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් ඔවුහු සිය ප්‍රේමාන්විත අවධිය පිළිබඳ ආවර්ජනය කිරීමට පෙළැඹෙති. මෙලෙස ආදරයෙන් පසු වූ යුවළක් බල අරගලයට යොමු වී අපහසුතා රැසකට මුහුණ දෙති. මෙසේ වන්නේ ගැහැනියගේ මෙන්ම, පිරිමියාගේ ද නහර හෝ ස්නායු තුළ පරස්පර විරෝධි හෝමෝන ගලා යෑම හේතුවෙන් ඔවුන් අසාමාන්‍ය ලෙස සිතීමට හා හැසිරීමට යොමු කෙරෙන බැවිනි.

මෙය වේදනාකාරි කාල පරිච්ඡේදයකි. එහෙත් බලඅරගලයේ දී සිරවී සිටින යුවළකට දීර්ඝ කාලීන විවාහ ජීවිතයක රහස සැබැවින්ම රැඳී තිබෙන්නේ මොළය තුළ ඇති වන වෙනස් වීම් තුළය යන්න තේරුම් ගැනීම අපහසු වේ.

ප්‍රේමාන්විත කාලය අවසානවත්ම පිරිමියාට නිදහසේ කටයුතු කිරීමට ඇති අවශ්‍යතාවය වැඩි වේ. ඒ අනුව වැඩිපුර මිතුරු මිතුරියන් ඇසුරු කිරීමේ වුවමනාව ගැහැනිය තුළ වර්ධනය වේ. මෙම ප්‍රවනතාවය තුළ බුද්ධිමත් හැසිරීමක් හා ලිංගික ස්වභාවයක් ද රැඳී පවතී. මෙම වෙනස් වීම් කෙරෙහි ටෙස් ටෙසටරෝන් නමැති පුරුෂ හෝමෝනය හා ඊස්ට්‍රජන් නම් වූ ස්ත්‍රී හෝමෝනය ද ප්‍රේරකයක් වෙයි

එමඟින් විවාහයට ඇති වන බලපෑම කුමක්ද? මෙහි දී ප්‍රධාන කාරණය වන්නේ, බලඅරගලය පවත්නා අවධියේ දී වෛවාහික නිදහස කෙරෙහි බලපාන විරෝධතා ආකල්පයක් ඇති වීමයි. පුදුමයක් නොවන නමුදු පළමු විවාහයක් සාමාන්‍යයෙන් වසර 7 ක 8 ක දී දික්කසාදයෙන් කෙළවර වන්නේ බොහෝ විට අප විසින් අනෙක් පාර්ශවය වෙනස්කර වීමට උත්සහ කිරීම හේතුවෙනි. එසේ වුවද තවමත් රසායනික හා ස්නායුගත ක්‍රියාවලිය ආපසු හැරවීමට ස්වභාවධර්මය අපට ඉඩ නොදේ. වෛවාහික ආදරයේ අලුත් අවධිය අවසානයේ දී ජෝඩුව එකිනෙකා වටහා ගන්නා තුරු රැඳී සිටිති. දෙදෙනාම ආදරවන්තයින් වශයෙන් මෙන්ම අඹුසැමියන් වශයෙන් ද එසේ කරති. මෙහි දී මතු පිටට යටින් සැඟවී තිබුන කිසිවක් මතු වී දෙදෙනාටම හෝ එක්කෙනෙකුට ඉඩකඩ ලැබේ. ජීවන චක්‍රය පුරා ස්වභාධර්මය ඉදිරියටම ගමන් කරයි.

**මතු සම්බන්ධයි...**

මිකායෙල් ගුරින් විසින් රීඩර්ස්ට් ඩයිජස්ට් සඟරාවට ලියූ ලිපියක් ඇසුරින් සකස් කළේ

**ප්‍රියන්ත මෙන්ඩිස්**
**ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය තේවත්ත ශාඛාව**

විශේෂාංග

# මිලියන 8 ක ආම්පන්න ගින්නට බිලි !

# ධීවර පවුල් රාශියක් අනාථයි !

## හලාවත රදගුරු හිමි විපතට පත් ධීවරයින් බැලීමට පැමිණේ









**ගිනියම් වූ මද්දහනේ බුර බුරා නැග ආ ගිනිදැල් පරිසරය තව තවත් ගිනියම් කළේය. ධීවර පොල්අතු වාඩි 14 ක් එකවර ගිල දමා ලක්ෂ ගණනේ වටිනා ධීවර ආම්පන්න දවා අළු බවට පත් කළ ගිනි රකුසා අනුකම්පා විරහිතව ධීවරයා පීඩාවට පත් කළේය. පසුගිය 25 දා බලාපොරොත්තු රහිත ගින්නකින් තලවිල වැල්ල එකම ශෝකාලාපයක් බවට පත්විය.**

කණකර උකස් කර බැංකු ණය මත ගොඩනගා ගත් රැකියාව ගින්නෙන් විනාශ වෙද්දි කාටත් නිරුත්තරවීමට සිදුවිය. වාඩිවල ගබඩා කර තිබූ ඉන්ධන ගිනි රකුසාට ශක්තියක් වෙමින් ගිනිදැල් වර්ධනය කරද්දී ගිනි නිවීමට ළංවීම ජීවිත තර්ජනයක් බැවින් එලෙස පසුබැසීමට සිදුවිය. සැම දෙනා අසරණ වූහ. කෙසේ හෝ සියල්ල නිමා වී ගින්න නිවුණු පසු ඉතිරි වී ඇති අළු ගොඩවල් දෙස බලා සියල්ලෝ සුසුම් හෙළූහ. ඇතමෙක් විලාප නැගූහ. හදවත්හි නැගුනු දුක් අඳෝනා සෝ සුසුම් රහසිගතව වාතලයට එකතු විය.

දැවී ගිය භාණ්ඩ අතර ධීවර (යාත්‍රාවල පිටත සවිකරන) ඇන්ජින් 8 ක් ද ජෙනරේටර් 9 ක් ද ඉන්ධන ටැංකි 14 ක් ද සමග මාළු දැල් ඇතුළු රැකියාවේ එදිනෙදා පරිහරණය කරන ආම්පන්න රැසක් තිබූ බව සංඛ්‍යා ලේඛන ගතව ඇත. ලක්ෂ 80 කට නොඅඩු අලාභයක් සිදුවී ඇති බව තොරතුරු අනුව හෙළිවේ.

කල්පිටිය ප්‍රාදේශීය ලේකම් රංගන ප්‍රනාන්දු මහතා කඩිනමින් තාවකාලික පිළියමක් ලෙස වියළි සලාකයක් ලබාදීමට පියවර ගැනීම ප්‍රශංසනීයය. මෙම අවස්ථාවේ දී තලවිල බටහිර ග්‍රාමනිලධාරි, තලවිල නැගෙනහිර ග්‍රාම නිලධාරි සහ එත්තාලෙ කලාප සමෘද්ධි සංවර්ධන සහකාර කළමනාකරු, තලවිල බටහිර සහ තලවිල නැගෙනහිර සංවර්ධන නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින් නන් අයුරින් ආපදාවට පත් වූවන්ට සහනයක් ශක්තියක් සැනසුමක් වීමට කැපවීම ආදර්ශවත්ය. ආයතනයක් ලෙස වර්ල්ඩ්විෂන් ශ්‍රී ලංකා මැදිහත්වීමද බෙහෙවින් ම අගනේය.

කල්පිටිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් පෙරේරා මැතිතුමා ධීවර ජනතාව සමග අදාළ දේශපාලන බලධාරින් මුණගැසීමට පියවර ගත්තේය. කරුණු දක්වා උපදෙස් ලබාදී ඇත.

**තලවිල ධීවර සමුපකාර සමිතියේ සභාපති හෙන්රි කැමිලස් මහතා**

දැනට ඇණහිට ඇති රැකියාව ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කරදීම හානියට පත් වූ අයට ලොකුම සහනයක්. ඒ සඳහා ලක්ෂ 20 ක්වත් අවශ්‍ය වෙනවා. එමගින් ඇන්ජිම විනාශ වූ අයට ඇන්ජිමක් සහ එක පන්නයක් ලබාදීම පිළිබඳ කල්පනා කර ඇත. එම මුදල එකතු කිරීමට තලවිල අනෙක් ධීවරයින්ගේ එක් දින රැකියා ආදායම ලබා ගැනීමට හැකියි. නැතිනම් රු. 2000/= බැගින් එකතු කිරීම. ඒත් රැකියා ආදායම ප්‍රමාණවත් වේද සැකයි. මුහුදේ ආදායම පෙර මතින්න බැහැ. රු. 2000/= එකතු කළත් ඉලක්කයට යන්න අමාරුයි. මේ අතර තලවිල මීසමේ පියතුමා මේ ප්‍රශ්නෙ ගැන විශේෂ කැපවීමකින් කටයුතු කරනවා. විවිධ අය අමතමින් මේ ප්‍රශ්නෙ විසඳීමට ක්‍රියා කරනවා.

තවදුරටත් කරුණු දැක්වූ සභාපති තුමා රක්‍ෂණ වන්දි ලබාගැනීම සඳහා ද ඉල්ලුම් කර ඇති බව පැවසීය. පොල් අතු වාඩි වෙනුවට ගින්නෙන් විනාශවීමේ අවදානම අවම වන ගොඩනැගිලි ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍යබව පෙනෙන්නේ යයි අවසන් වශයෙන් පැවසීය.

**හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ එම ස්ථානයට පැමිණ කරුණු සොයා බැලූහ.**

මේ වනවිට විවිධ මට්ටමේ සාකච්ඡා පවත්වා ඇති බව දැනගන්නට ඇත. සියල්ල සාකච්ඡා මට්ටමේ පවතී. එහෙත් කාලය ඉක්ම යාමේදී අසරණ වූ ධීවරයෝ සැමතින්ම පීඩාවට පත් වෙති. එදිනෙදා ජීවත්වීම පිළිබඳ ප්‍රශ්නය බැරෑරුම් වන බැවින් රැකියාවේ බාධක ඉවත් කර ගැනීම ඔවුන්ගේ ප්‍රශ්නයයි. මානව හිතවාදී දොරටු වඩාත් විවර විය යුතුය. ප්‍රේමයේ දෑත් දිගු කිරීමට කාලය පැමිණ ඇත.

**ආපදාවට පත් ධීවරයෝ :**

1. බී. සී. රසල් ටයිටස් මහතා
2. බී. ඩී. චාමර අප්පු මහතා
3. බී. ඩී. මැල්කම් හියුබට් මහතා
4. ජේ. ඒ. නිව්ටන් අප්පුහාමි මහතා
5. ඩබ්. පී. ජූඩ් රංජිත් ප්‍රනාන්දු මහතා
6. යු. ඒ. චාමර අප්පු මහතා
7.එච්. එම්. නීල් ස්ටැන්ලි මහතා
8. එච්. එම්. නුවන් රෝහිත මහතා
9. ඩබ්. පී. නොයෙල් ජූඩ් මහතා
10. යු. ඒ. නුවන් රංග මහතා
11. ඩී. ඒ. දිනේශ් ප්‍රියංකර මහතා
12. බී. සී ප්‍රදීප් මදුරංග මහතා
13. රෝහිත ජූඩ් උදය කුමාර මහතා
14. ආර්. එම්. චන්දන මහතා

**ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු**
තලවිල

පහන්

# සංගීත විශාරද ගරු මයිකල් සිල්වා නි.ම.නි පියතුමා

"හෙළ කිතුනු දහම් කෙතේ ජනවන්දනාව වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටුකරමින්, සංගීතයට හෙළ කිතුනු දහම් කෙත අස්වැද්දීමේ කාර්යයේ නිරත වෙමින් මෙහෙවරක් ඉටුකළ එතුමා කුඩා අවධියේ සංගීතයට දැක්වූ ලැදියාව නිසාම පමණක් නොව, සංගීත භාණ්ඩ වැයීමේ නිපුණතාවයක් ලැබීමේ වාසනාවද හිමිකර ගත්තේය. ගීත පබැඳීම, තනු නිර්මාණය වැනි කාර්යයන්හි නිරත වීමට හැකිවූයේ කුඩා අවධියේ සංගීතය පිළිබඳව එතුමන් තුළ පැවැති ලැදියාව නිසාය. කැරොල් ගීත, පසම් ගීත වැනි හෙළ සිරිතට අනුකූලව ලියැවුණු ගීතයෙන් නිර්මාණය කරමින්, ජනවන්දනාවට මහගු මෙහෙවරක් ඉටුකළ ගරු මයිකල් සිල්වා පියතුමා සමග සුහද පිළිසඳරක යෙදෙන්නට අවස්ථාව ලැබුණි. ඒ පිළිබඳව අදහස් එකතුවකි මේ."

**පියතුමෙනි, ඔබතුමාගේ උපන් ගම, පාසල් ජීවිතය ගැන විස්තර සඳහන් කළොත්?**

මම ඉපදුනේ 1938.3.14 දින කටුනායක ගමෙයි. මගේ පියා ජෝන් ද සිල්වා, මව ඇම්. ජුලියට් ප්‍රනාන්දු, මම පවුලේ තුන්වැනියා. මා මූලික අධ්‍යාපනය ලැබුවේ කටුනායක රෝ. ක. පාසලෙන්. මා කුඩා කාලයේදීම මගේ පියා මියගියා. ගෙදර දොරේ වැඩ කටයුතු පවා නිසියාකාර කර ගැනීමට හැකියාවක් තිබුණේ නැහැ. සියළුම බර කරට අරගෙන ජීවන ගමන් මග යැමට අම්මාට පැවරුනා. එවකට මග්ගොන සා. විසෙන්ති ළමා නිවාසයේ ළමුන් බාරව සිටි ගරු හැරී ප්‍රනාන්දු නි.ම.නි පියතුමාව අම්මා තරමක් දන්නා බැවින්, එතුමාව හමුවීමට අම්මා මාව එක්කගෙන මග්ගොනට පැමිණියා. එවකට මගේ වයස අවුරුදු 6 යි. හැරී පියතුමා මගෙන් ඇසුවා පුතා මෙහි නතර වෙන්න කැමතිද කියලා. පියතුමාගේ කීම අහක දමන්න බැරිකමටත්, අම්මාගේ වචනයට අවනත වී මම කැමති වුනා. එම අවස්ථාවේ මා තුළ ඇතිවූයේ දැඩි වේදනාවක්. නමුත් පියතුමා මට දැක්වූ කරුණාව නිසා ඒ වේදනාව ක්‍රමයෙන් නැතිවී ගියා.

එතැන් සිට මගේ ජීවිතය ළමා නිවාසයෙන් ආරම්භ කළා. එහි සිටියේ මගේ සම වයසේ අයයි. බොහෝ දෙනෙක් මා සමග ඉතාමත් ලෙන්ගතු අන්දමින් සිටියා. අපි එකට පාසල් ගියා. එකට වැඩ කළා. එකට යාච්ඤා කළා. අපි සැමදාම සවසට කල්වාරිය පිහිටි ප්‍රදේශයට සෙල්ලම් කරන්න යනවා. ඒ සමග අවට තිබෙන බෝවිටියා ගස්වල ගෙඩි, අඹ ආදිය කඩාගෙන කාලා හරි සතුටින් සිටියා. දිනක් අසල තිබූ ගල් තලාවක් මත අපි ඇවිද ගෙන යද්දී මාව ලිස්සා වැටෙන්න යනකොට මාව කවුදෝ බදලා අල්ලා ගත්තා. මා දුටුවේ ඒ ජේසුතුමා වෙන්න ඇති කියලායි.

ප්‍රැන්සිස්කන් නිකායේ සහෝදරවරුන්ගේ පාලනය යටතේ තමයි, මග්ගොන සා. විසෙන්ති පාසල අයත්ව තිබුනේ. පාසල තිබුනේ පල්ලිය ඉස්සරහම. එහි විදුහල්පති තුමා ගරු පියුස් සහෝදරතුමායි එතුමා මගේ ඉගෙනීමේ කටයුතු වලට බොහෝ සෙයින් මට උදව් වුනා. ජ්‍යෙෂ්ඨ පන්තිය දක්වා මා එම පාසලෙන් අධ්‍යාපනය හැදැරුවා. අවසන් විභාගයත් සමත් වූ පසු, විදුහල්පති තුමාට අවශ්‍ය වුනා මාව එම පාසලේම ගුරුවරයෙක් ලෙස පත් කිරීමට. නමුත් එවකට අප සිටිය ළමා නිවාසය බාරව සිටියේ ගරු ජුලියස් විජේසූරිය නි.ම.නි පියතුමායි. එතුමන් දිනක් මගෙන් ඇසුවා, ඉදිරි අනාගතයට මොකද්ද කරන්න හිතාගෙන ඉන්නේ කියලා. එතුමාත් මට කීවේ ගුරුවරයෙක් වෙන්න කියලා. නමුත් මම එයට වැඩි කැමැත්තක් දැක්වූයේ නැහැ.

**පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු, දේව කැඳවීමට ඔබතුමා යොමුවීම සිදුවුණේ කොහොමද?**

ළමා නිවාසයෙන් අස්වී ගෙදර ගිය පසු, මගේ අම්මා අඳුනන අසල්වැසි ගුරුතුමෙක් මගින් මම ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගත්තා. ඒ මහතා මගෙන් මුදල් ගත්තේ නැහැ. ටික කලක් මම එය හොඳින් හැදැරුවා. පසුව මම හිතා ගත්තා මා මෙලොව සිටින කාලයේදී කුමක් හෝ හොඳ දෙයකට යෙදෙන්න ඕනැ කියලා. මා දෙවිඳුන්ට යාච්ඤා කළා. දිනක් මම අපේ පල්ලියේ පියතුමාව හමුවීමට ගියා. ඒ කාලේ මීසම් සේවක පියතුමා වූයේ ගරු ජෝසප් කබ්රාල් පියතුමායි. එතුමා මගේ ජීවිතයේ ප්‍රශ්න, ගැටලු පිළිබඳව සුහද සාකච්ඡාවක යෙදී සිටියා. පසුව එතුමා මගෙන් ඇසුවා පුතා ස්වාමි කෙනෙක් වෙන්න කැමති ද කියලා. මා පියතුමා හමුවීමට ගිය බවක් අම්මා දන්නේ නැහැ. පියතුමා අපේ පවුල ගැන සොයා බලා දිනක් අම්මාට එන්න කියලා පවුලේ විස්තර දැන ගත්තා. අම්මා ගෙදර ආපු වෙලාවේ මට කීවා පුතේ ස්වාමි මොනවා හරි ඇසුවොත් බැහැ කියන්න එපා කියලා. කෙසේ හෝ පියතුමා අයදුම් පතක් ගෙන්නා ගෙන මගේ විස්තර සඳහන් කරලා කොහුවල නි.ම.නි කනිටු දෙව්සත්හලේ එවකට අධ්‍යක්ෂ ධූරය දැරූ ගරු බැසිල් වීරතුංග පියතුමාට යවලා තිබුනා. ටික



දිනකින් පසු දෙව්සත්හලෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තිබුනා. එදින මා අම්මා සමග සම්මුඛ පරීක්ෂණයට ගියා. පසුව, එම පරීක්ෂණයෙන් සමත් වෙලා 1951.1.14 දින මා දෙව්සත්හලට ඇතුල්වුනා. අවාසනාවකට එම වසරේ අවසානයේදී මගේ අම්මා මියගියා.

**කනිටු දෙව්සත්හල් ජීවිතයෙන් පසුව, අම්පිටිය නි.ම.නි දෙව්සත්හල තුළ ගත කළ කාලය පිළිබඳව විස්තර කෙබඳුද?**

කනිටු දෙව්සත්හලෙන් පසුව, 1960 මැයි මස කළුතර පලාතොට දෙව්සත්හලට ඇතුල් වුනා. එහිදී මම ඉංග්‍රීසි, ලතින්, තර්ක විද්‍යාව, හැදැරුවා. පසුව 1961 දී අම්පිටිය නි.ම.නි දෙව්සත්හලට ඇතුල්වී අධ්‍යාපන කටයුතු කරමින් සිටින අතර, සංගීතය ඉගෙනීමට දැඩි ආශාවක් මා තුළ තිබුනා. ගරු පොලයිස් සහෝදර තුමාගෙන් මම ස.රි.ග.ම.ප.ද ඉගෙන ගත්තේ, එතුමා මගින් තවත් දැනීම වැඩිකර ගෙන පසුව මම ගීතිකාවක් හැදුවා. මම එය ප්‍රථම වතාවට 'භක්ති ප්‍රබෝධනය' සඟරාවට යැව්වා. එය පළවුනා. මේ අතරතුරදී ගරු යංවෝ පියතුමා මට සංගීතය පිළිබඳව බොහෝ කරුණු කාරනා කියා දුන්නා. දෙව්සත්හල් දිවියේ ඉගෙනීමේ කටයුතු අවසන් කර, 1965 අප්‍රේල් මස 19 දින මා පූජක වරය ලබා ගත්තා. එතැන් සිට කෝට්ටේ, දළුගම, කටාන, පමුණුගම. කැපුන්ගොඩ, තරාල, පිටිපන, රාවතාවත්ත, කටුනේරිය, හලාවත, කුරුණෑගල, තලවිල, අනුරාධපුරය, මග්ගොන, බුත්තල යන ස්ථානවල සේවය කරලා නැවතත් මග්ගොන සා. විසෙන්ති ආයතනයේ සේවය කරනවා

**දෙව්සත්හලේදී ඔබ සංගීතයට බොහෝ සෙයින් නැඹුරුවූ බව පැවසුවා. පූජකවරයෙන් පසුවත් සංගීතය වැඩිදුර හදාරා විශාරදයකු වීමට අවස්ථාව ලැබුනා නේද?**

ප්‍රථමයෙන් දෙව්සත්හලේදී මා ලියූ ගායනා පූජා පොත තමයි 'පිදෙයි සමිඳුනේ පිදෙන සමිඳනන්' මෙම පොත් 1000 ක් මම මුද්‍රණය කරලා සියල්ල අලෙවි කළා. එම පොතට හොඳ ප්‍රතිචාරයක් තිබුනා. දෙවැනි පොත තමයි. 'ස්වර රටාවෙන් ලියැවුන නාද රටා'.

හලාවත විශ්ව ලංකා කළා ආයතනයෙන්, මර්සි වර්ණකුල කලා ආයතනයෙන් මා වැඩිදුරටත් සංගීතය හැදැරුවා. පසුව හංවැල්ල බොස්කෝ ආයතනයේ ගාමිණී කස්තුරිආරච්චි මහතාගෙන් හා හොරණ එරන්දතී කලා ආයතනයේ මුදුන්කොටුව මහතාගෙන්ද, සංගීතය ඉගෙන ඉන්දියානු බාහාර් විශ්ව විද්‍යාල ඩිප්ලෝමාව දක්වා සංගීතය හැදැරුවා. මා නිර්මාණය කරන ලද සංගීත පොත් කිපයක් අතර, ලබැන්ද, සෙත්ශාන්ති, අමාශාන්ති, වර්ණ ස්වර, කිතුනු සත්ගායනා, විශේෂ තැනක් ගන්නා අතර, ගංඉවුරේ, සමිඳු පාමුල, සදහම් පවුරක්, මා ඇසින් දුටු ජේසුතුමා යන ගී ඇතුලත් කැසට් පට හා ඩී.වී.ඩී පට කීපයක් නිර්මාණය කළා.

වසර 2010 ඔක්තෝබර් මස 8 වැනි දින සංස්කෘතික අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද, ක්‍රිස්තියානි අංශයේ ජනවන්දනා සංගීතය පිළිබඳව දැක්වූ දක්ෂතා පිළිබඳව, ගරු මයිකල් සිල්වා පියතුමාට උපහාර උළෙලක් මරදාන සාන්ත ජෝශප් විදුහල් බොන්ජින් ශාලාවේදී පැවති අතර, එහිදී එතුමාට තිළිණ ප්‍රදානයක්ද කරන ලදී. එම මාසයේදීම මග්ගොන සා. විසෙන්ති ආයතනය මගින් සංවිධානය කරන ලද උපහාර උළෙලක් සමග තිළිණ ප්‍රදානය කිරීමක් නිමල මරිය නිකායේ ප්‍රාදේශාධිපති ගරු ක්ලෙමන්ට් වෛද්‍යසේකර, ආයතනයේ අධ්‍යක්ෂ ගරු ශ්‍රියාන් රණසිංහ යන පියතුමන්ලාද නි.ම.නි පැවිදි හවුල සමග ආයතනයේ සිසු දරුවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විනි.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# නීතිඥ ජෝ පෙරේරා වියෝවී වසර විසිපහක් සපිරෙයි

මහජන සේවය සඳහා ම කැප වූ රටෙත් ජනතාවගෙත් අවශ්‍යතාවය සපිරීමට ඉදිරිපත් වෙන්නන් තුළ තිබිය යුතු ගුණාංග නම්, උගත්කම, අවංකකම හැරුනු විට ගුණයහපත්කම, ශීලාචාරකම හා සේවයට කැපවීම ද වේ. සියලු ගුණාංගයන්ගෙන් පරිපූර්ණ ජ්‍යෙෂ්ඨ ලංකා පුත්‍රයකු මෙයට වසර විසිපහකට පෙර අපට අහිමිවී ගියේය. ඔහු අන්කවරෙකුවත් නොව ප්‍රමුඛ නීතිඥයකු වූ අවංක මහජන සේවකයකු වූ ද බස්නාහිර පළාත් සභාවේ හිටපු සභාපතිවරයාව සිටි නීතිඥ ජෝ පෙරේරා ශ්‍රීමතාණන්ය.

ඔහුගේ වියෝවෙන් අදට වසර 25 ක් සපිරෙයි. හිස් අතින් මහජන සේවයට පිවිසුනු බොහෝ අය පසු මහත් ධනකුවේරයින් බවට ප්‍රසිද්ධ ව්‍යාපාරිකයන් බවට පත්වන යුගයක ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ඔටුවෙකුට ඉඳිකටු මල තුළින් රිංගා යත හැකි වුවත් ධනපතියකුට ස්වර්ග රාජ්‍යයකට යන්නට නොලැබෙන්නේය යන ආගමික ඉගැන්වීම දිවි හිමියෙන් විශ්වාස කළ එතුමා ඒ අනුව සිය දිවි පෙවෙත සකස් කර ගත්තේය. ධනය සහ බලය ලැබෙන්නට ලැබෙන්නට ඒ සියල්ල එතුමා දුගී දුප්පත් ජනතාවගේ සේවය සඳහාම කැප කළ, පූජා කළ බව ඔහු ලඟින් ඇසුරු කළ අප පමණක් නොව එතුමාගෙන් කිසිම හවුහරණයක් ලබානොගත් අය පවා දැන සිටි කරුණකි.

ජෝ පෙරේරා වැන්නවුන් තුළ තිබූ උදාර ගුණාංග වලින් එකක්වත් නොමැති කිසිත් සුදුසුකමක් නොමැති අය පරාර්ථ සේවයට පිවිසීමෙන් ඇතිවෙන භයානක තත්ත්වය මෙනෙහි කරමින් ඒ ලංකා පුත්‍රයාගේ ගුණ බිඳක් මෙනෙහි කිරීම මේ ලිපියේ අරමුණයි.

**දේශපාලනමය සේවය**

මෝදර ලුණුපොකුණ ග්‍රාමයේ වර්ෂ 1933 උපත ලැබූ මෙතුමා තුළ දේශපාලකයකු තුළ තිබිය යුතු විශිෂ්ටතම ගුණාංගය වන අවංකකම දක්නට ලැබුණි.

එය වඩාත් අර්ථවත් ලෙස දක්නට ලැබුණේ බුද්ධිය හැකියාව සමග ජනතාවගේ අවශ්‍යතා ගැන හැඟීමෙන් යුතුව කටයුතු කළ බැවිනි. වර්ෂ 1961 දී කතෝලික පාසල් රජයට පවරා ගැනීමේ දී එයට විරුද්ධව නැගී සිටි නිසා එතුමා ජනතා ප්‍රසාදය මත දේශපාලනයට අවතීර්ණ විය. උපන් ප්‍රදේශය නියෝජනය කොට වර්ෂ 1962 දී කොළඹ මහ නගර සභාවට විශාල ජන මතයකින් තේරී පත්වී මුළු කොළඹ නගරයට පොදු වූ යෝජනා රැසක් නගර සභාවට ඉදිරිපත් කළේය. පළාත් පාලනයේ දී ලද දේශපාලන අත්දැකීම් නිසා ඉතා කෙටි කලකින් වර්ෂ 1966 දී කොළඹ නගර සභාවේ උප නගරාධිපති ධූරය හෙබවීමේ හැකියාව ද ලද්දේය.

නගර සභාව තුළ විවිධ කාරක සභාවල සභාපති තනතුරු වල කටයුතු කළ අතර පුවත්පත් නිදහස අගය කළ එතුමා පුවත්පත් නිදහස වෙනුවෙන් නගර සභාව තුළ වේගවත් දීර්ග විවාද කොට ඒ සඳහා සියලු දෙනාගේම සහයෝගය ලබා ගෙන ඉදිරිපත් කළ යෝජනා සම්මත කර ගත්තේ තමා වෙත එල්ල වූ ගල්මුල් මල් බවට පත්කරමින්ය. කොටහේනේ ගුණානන්ද මාවතේ නිවාස 28 කින් යුත් තට්ටු නිවාසයක් ද ජනතාවට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන ආයුර්වේද බෙහෙත් ශාලාවක් ද පවිත්‍රතා මධ්‍යස්ථානයක්, වැසිකිලි හා නාන කාමර ස්ථාන මංමාවත් හා තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට රැකියා ලබා දීමත් බොරැල්ලේ ඥානාර්ථ ප්‍රදීප මාවත නම් කිරීම වැනි අගනා කටයුතු රැසක් කෙටි කාලයක් තුළ දී සිදු කළ එතුමා වර්ෂ 1977 දී දේශපාලන භූමියෙන් ටික කලකට ඉවත් විය.

කවදත් දේශපාලනය ජනතාව මුලා කරලා කරන්න බැහැ. ඇත්ත ඇති සැටියෙන්ම ප්‍රකාශ කිරීම අවංකකම මහත්මා ගතියක්, එතුමා තමන් නිතරම ඇසුරු කළ හැම දෙනාටම ආදර්ශයක් විය. සත්‍යයට ගරු කර අසත්‍යට



විරුද්ධව කටයුතු කළ ජෝ පෙරේරා ආඩම්බරයෙන් තොර සේවයේම කැප වූ පුද්ගලයෙකි. වැරදි දේ කිරීමට පමණක් බිය වූ එතුමා දෙවිපියාණන් වහන්සේට ගරු කළේය.

1977 දේශපාලනයෙන් කෙටි කලකින් පසු නැවතත් වර්ෂ 1988 ජූනි මස 02 වන දින බස්නාහිර පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වී වැඩි ඡන්ද ප්‍රමාණයකින් ජයගෙන බස්නාහිර පළාත් සභාවේ සභාපති වශයෙන් ද ආණ්ඩුකාර තැන්පත් එස්. සර්වානන්දන් මැතිතුමා ඉදිරියේ දී වර්ෂ 1988 ජූනි මාසයේ 22 වන දින දිවුරුම් දුන්නේය. එතුමාගේ කාර්යක්ෂමතාවය මත මැනවින් කැපී පෙනෙන්නේ නායකත්වය සඳහා තුබූ සුදුසුකමමය.

මෙවැනි උදාර සේවයක නිරත වූ ජෝ පෙරේරා මැතිතුමා අප හට රටට අහිමි වූයේ එතුමාගේ සේවය අත්‍යවශ්‍යව තිබූ යුගයකදීය. ඔහු දේශපාලන පක්ෂයක් නියෝජනය කළ ද දේශපාලන භේද නොසලකා පොදුවේ සැම ජන කොටසකටම සේවය කරන්නට නව පාලනයක් යටතේ එතුමා රස්සාව ඇරඹුවා පමණකි.

**නීතිඥ වෘත්තිය තුළ සේවාවන්**

පීඩනයට ගොදුරු වූ වේලාවේ කටයුතු නොකළ සාධාරණය හොඳ මිත්‍රත්වයකින් නිත්‍යානුකූලව වැඩ කරන්න සාධාරණ අදහස් ප්‍රකාශ කළ එතුමා වෘත්තියෙන් නීතිඥයකු වශයෙන් 1958 වර්ෂයේ දී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ දී දිවුරුම් දුන්නේය. එවකට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ සිටි ප්‍රසිද්ධ නීතිඥවරුන් වන මෙරිල් පෙරේරා මහතා සහ එල්. ඩී. එස්. ගුණසේකර යන නීතිඥවරුන් දෙපළගේ සහය එතුමාට නොඅඩුව ලැබුණි.

දේශපාලකයෙකු වශයෙන් අත්දැකීම් ද පරිනත බුද්ධිය හා හැකියාව ද නායකත්වයේ තිබූ දක්ෂකම මතම 1985 වර්ෂයේදී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නීතිඥ සංගමයේ සභාපති තනතුරට තෝරා පත් කර ගනු ලැබූ ජෝ පෙරේරා මහතා එහි වගකීම මැනවින් අවබෝධ කර ගෙන ඒ පදවියේ ගරුත්වය යථා අන්දමින් රැකගත්තේ ඒ සඳහා කළයුතු වැඩ කොටස ඉටුකරමින්ය.

අධිකරණයේ විශාල අඩුපාඩු එවකට තිබුණේය. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කොට උසාවි සංකීර්ණය 1985.08.26 වන දින හිටපු ජනාධිපති ගරු ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා අතින් උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී.

ඒ පිළිබඳ කෘතඥ පූර්වකව ඒ අවස්ථාව සිහිපත් කරනුයේ කළ සේවයට උපහාරයක් වශයෙන් නීති සංගමයේ අනුමැතිය පරිදි මහේස්ත්‍රාත් අධිකරණයේ ගොඩනැගිල්ලේ ජෝ පෙරේරා මැතිතුමාගේ ඡායා රූපයක් එවකට අධිකරණ ඇමැතිව සිටි ආචාර්ය නිශ්ශංක විජේරත්න මැතිතුමාගේ අතින් විවෘත කිරීම ද සිදු විය.

**කතෝලික සභාවට කළ සේවය**

එතුමා, නීතිඥ වෘත්තියේ හා දේශපාලනයේ නියැලි සිටියද කතෝලික සභාවට ඇති ලැදියාව ඒවාට නොදෙවෙනි විය. ලුණුපොකුණ සා. අන්ද්‍රේ මීසමට දැඩි භක්තියක් හා කැපවීමක් දැක්වූ අතර, කොළඹ පදවියට මෙන්ම ලාංකික කතෝලික සභාවට නොමඳ සේවයක් ඉටු කළේය. වාර්ෂිකව මෝදර ග්‍රාමයේ ලුණුපොකුන මීසම ප්‍රමුඛව පවත්වන තලවිල සා. ආනා මුනිශ්වරියගේ මංගල්‍ය සංවිධානය කිරීමේ ප්‍රමුඛතා වූයේ එතුමාය. එහෙත් එය සිදු කළේ ඉතා නිහතමානිවය.

මෝදර පළාතට ගෞරවයක් ගෙන දුන්, ලංකාවේ පළමු කාදිනල් තුමාණන් බිහිකළ ද ලාසාල් විදුහලට ජෝ පෙරේරාද අතිශයින් ආදරය කළේය. විදුහලට විශාල අඩුපාඩුවක් පැවැති සෙල්ලම් පිට්ටනිය හා පංති කාමර ව්‍යාපෘතියට අවශ්‍ය ඉඩම ක්ලිෆ්ටන් සමාගමෙන් රජයේ මැදිහත්කමින් පාසලට පවරා දීමට උදාර සේවයක් කළේද එතුමාය.

**ශ්‍රී ලාල් පෙරේරා මහතා**

කොළඹ නගර සභාවේ නාගරික මන්ත්‍රී ශ්‍රී ලාල් පෙරේරා 1994 ඔක්තෝබර් මස 24 වන දින ජනාධිපති අපේක්ෂක ගාමිණී දිසානායක මහතාගේ සහයෝගය සඳහා කොළොඹ තොටලග අන්තිම රැස්වීමේ දී කොටි බෝම්බයකට ජීවිතය පූජා කරන ලදී.

මේ උත්තරීතර පුද්ගලයන් දෙපළට සදා ස්වර්ග සැපත ලැබේවායි අප සැම යාච්ඤා කරමු.

අප්‍රේල් 27... 1 පිටුවෙන්

දේවස්ථාන එකොලහක විවිධ භාෂාවලින් ජනවන්දනා මෙහෙයන් පැවැත්වෙන අතර දැනටමත් විවිධ සමාජ ජාලයන් ඔස්සේ තරුණ පරපුර සම්බන්ධ කරගනිමින් සිටී.

**www.2papisaints.org** වෙබ් අඩවිය විවිධ භාෂාවලින් ලබා ගත හැකි අතර ටුවිටර් භාවිත කරන්නන්ට **@2 popesaints** ඔස්සේ නිර්මාණය කර ඇති විශේෂ ගිණුමට යා හැකිය. යූ ටියුබ් හා මුහුණු පොත ද සාන්තුවරය අලළා විශේෂ ආවරණ සකසමින් සිටින අතර භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු සසුන් පියාට කැප කළ සැන්ටෝ සුබිටෝ විශේෂ ඇප් මෙවලමක් ඇන්ඩ්‍රොයිඩ හා අයි. ඕ. එස්. හරහා ලබා ගත හැකිය.

මේ අතර අති උත්තම විසිතුන්වන ජුවාම් සසුන් පියා උපත ලද බර්ගාමෝ රදගුරු වසම මේ නිමිත්තෙන් දයා සේවා ගිණුම් තුනක් අරඹා ඇති අතර යුරෝ අට ලක්ෂයක් හයිටි හි විසිතුන්වන ජුවාම් සසුන් පිය පාසලේ තුන් වසරක අධ්‍යාපන කටයුතු වලට එය යොදා ගැනේ. පදවියේ පියතුමන් සිය මසක දීමනාව අරමුදලට පිරිනමා ඇති අතර විවිධ ජනතා කණ්ඩායම් එකතු කළ ආධාර ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් පවුල් වලටත්, වයස අවුරුදු 18 හා 35 අතර තරුණ පරපුරටත් පිරිනැමීමට නියමිතය.

ත්‍රිකුණාමලය... 1 පිටුවෙන්

මෙම මහා පාද නමස්කාරය ත්‍රිකුණාමල පදවි එඩේරාණන් වන අති උතුම් ජෝසප් කිංස්ලි ස්වාමිපිල්ලෙයි රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිව්‍ය යාගයෙන් අවසන් වේ. "මනුෂ්‍යත්වයේ අභිමානය පවුලයි" යන තේමාව මූලික කොටගෙන කැප කළ මේ වසරේ එක පවුලක් ලෙස චතාරික සමයේ දී අප අපගේ ආත්ම සෝදිසි කිරීමෙන් දුක් මනස්ථාපනය වී මෙම මහඟු අවස්ථාවට සහභාගි වී සියලු දෙනාම දේවාශිර්වාදය ලබා ගන්න.

චතාරික සමය... 5 පිටුවෙන්

එසේ වෙනස් වන අප ඒ වෙනස් වීම කාල සීමාවකට පමණක් සීමා නොකර, අප ජීවිතය අවසානය දක්වා අප ජීවිත ගමනට මුසුකර ගැනීමට අප උත්සාහ කළ යුතුය.

මනුෂ්‍යා දුර්වල බවත්, යක්ෂයා, ලෝකයා සහ මාංශයා යන සතුරු බලවේග අපව නපුරට ඇද ගැනීමට උත්සාහ කරන බවත් හොඳින් තේරුම් ගෙන මර්ධන ක්‍රියා, යාච්ඤා සහ සැබෑ පසුතැවිල්ලක් තුළ දිවි ගෙවමින් දිව්‍ය පූජාවට සහභාගි වෙමින් හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගෙන, දේව ශක්තිය හා දේවාශිර්වාදය තුළ නපුරු බලවේග වලින් ජය ගැනීමට හැකි බවත් අපගේ අරමුණ හා විශ්වාසය විය යුතුය.

අල්ප වුනට... 12 පිටුවෙන්

ඔබ එවිට දේව ආදරයෙන් හිස් බවකට ලක් වේ. තවද නූතන සමාජයේ ප්‍රබලතම ආන්දෝලනයකට ලක්ව තිබෙන ගැටලු ලෙස ගබ්සාව, ස්ත්‍රී දූෂණය හා ළමා අපචාරය මූලිකත්වය දරයි. ඔබ කවදාද ගබ්සාවට ලක්වන කිරිකැටියාගේ නිහඬ හඬට හඬක් වූයේ, දූෂණයට ලක්වන ස්ත්‍රීන්ට හඬක් වූයේ සහ අපචාරයට ලක් වන ළමුන්ට සෙවණක් වූයේ. මෙය ද වෙරෝනිකා එදා ජේසුස් වහන්සේට කළ සේවය? නැත. ඔබත් මාත් ඇය ඒ කළ සේවයට අවමානයක් පමණි.

මෙම චතාරික සමය ආරම්භ වූ අළු බදාදා දින "දූවිල්ලෙන් සෑදුනු මිනිසා දූවිල්ලටම හැරෙන බව" මතක් කර දුන්නා සේම එය අවසන් දින වන පාස්කු ඉරුදින තුළින් පාපී බවින් උත්ථාන වූ නවමු දිවියකට අපට ආරාධනා කරයි. සඟලොවටත් මනු ලොවටත් අධිපති වූ දෙවිපියාණන් වහන්සේ අපට තිබෙන අසීමිත ප්‍රේමය නිසා තම එකම පුත්‍රයාව කුරුසියේ යාගයකින් ඔප්පු කර අපව ගැලෙවුවා සේ මෙම චතාරිකය ද හුදෙක් අප පසු කළ චතාරික සමයන් මෙන් නොසිතා ජේසුස් වහන්සේ එදා ඒ විඳි වේදනාවන්ට සහනයක් වූ වෙරෝනිකා මෙන් අප ද අපේ පව් වලට මනස්ථාපනය වී දේව අනුගාමිකයන් ලෙස ජේසුස් වහන්සේ ඒ විඳි යාගයට කෘත ගුණ දක්වමු.

# ශා. නික්ලස් ජාත්‍යන්තර පාසල ගැන දෙමාපියෝ විමසති

සා. නික්ලස් ජාත්‍යන්තර පාසලේ කොළඹ ශාඛාව පත් වී ඇති අවිනිශ්චිත තත්ත්වය ගැන දෙමාපියෝ කනස්සල්ල පළ කරති.

කතෝලික පෞද්ගලික පාසල්වලට තම දරුවන් ඇතුළත් කර ගැනීමට නොහැකි වූ හෙයින්, කතෝලික අධ්‍යාපනයක් ලබා දීම සඳහා මෙම පාසල තෝරා ගත් බව දෙමාපියෝ පවසති. එහෙත් මෙම පාසල කතෝලික සභාවේ පරිපාලනය තුළ ඇති පාසලක් නොවන බව ඔවුන්ට අනාවරණය වූයේ පසුව බව දෙමාපියෝ පවසති.

සා. නික්ලස් ජාත්‍යන්තර පාසලේ කොළඹ ශාඛාව වසා දැමීමට තීරණය කර ඇති බව සැලවීමෙන් දරුවන්ට හදිසියේ පාසල් සෙවීම ගැටලුවක් බව දෙමාපියෝ පවසති.

මේ පිළිබඳව කොළඹ අගරදගුරු පදවි අධ්‍යාපන හා කතෝලික පාඨශාලා සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමාගෙන් විමසන ලදුව එතුමන් පැවසුවේ සා. නික්ලස් ජාත්‍යන්තර පාසල පිළිබඳව ගැටලුව විසඳීමට අති උතුම් කාදිනල් හිමිපාණන් ඉමහත් වෙහෙසක් ගන්නා බවයි. එතුමාණන් බලාපොරොත්තු වන පරිදි සෙලින්කෝ සමාගම සතු අයිතිය අගරදගුරු පදවියට ලබා ගැනීමට හැකි වුවහොත් පාසල පිළිබඳව සියළු ගැටලු නිරාකරණය වන බවයි.

අගරදගුරු හිමිපාණන් ගන්නා තීරණ හා ලබා දෙන උපදෙස් මත මීගමුව හා කොළඹ සා. නික්ලස් ජාත්‍යන්තර පාසල් පිළිබඳව අගරදගුරු පදවි අධ්‍යාපන කාර්යාලය විසින් ඉදිරි කටයුතු කරන බව ගරු රංජිත් මදුරාවල පියතුමා පැවසීය. **(ඩැනිස්ටර් ප්‍රනාන්දු)**

# විසිතුන්වන වරට රඟ දැක්වෙන "කල්වාරිය" පාස්කු නාට්‍යය

හැත්තෑව දශකයේ බොරලැස්ස ලෝරන්ස් මහතාගේ පාස්කු නාට්‍ය දැකීමෙන් හලාවත ද පාස්කු නාට්‍යයක් රඟ දැක්වීමේ ආශාවක් පිලිෂියන් පෙරේරා තුළ මුලින්ම සිතේ හට ගත්තේය. කොළඹ පදවිය මෙහෙයවූ නට්‍ය තරගයක දී සම්මානයක් ලබා ගැනීම තවත් නාට්‍ය කිරීමට පෙළඹවීය.

1979 දී "එම්බා කල්වාරිය" නමින් පාස්කු නාට්‍යයක් හලාවත සාන්ත මරියා බාලිකා විදුහල් එළිමහන් වේදිකාවේ දී රංග ගත විය. එය මිලානියුස් ප්‍රනාන්දු හා පිලිෂියන් පෙරේරා දෙපල ගේ සම රචනයක් හා සම අධ්‍යක්ෂණයකි. එය නිෂ්පාදනය කළේ හලාවත චින්තන නිර්මාණ රූ පර්ෂදය විසිනි. එම නාට්‍ය දින නවයක් තුළ රංග ගත විය. එය හලාවත නාට්‍ය ඉතිහාසයේ රන් සලකුණක් තැබිය. ඉන් පසුව 1981 වර්ෂයේ දී පිලිෂියන් පෙරේරා විසින්ම රචනය කර ඔහු විසින්ම අධ්‍යක්‍ෂණය කළ "කල්වාරිය" නම් වූ නාට්‍ය හලාවත සුදුසුන රංග ශාලාවේ දී දින 07 ක් වේදිකා ගත විය. එය නිෂ්පාදනය කළේ ද හලාවත චින්තක නිර්මාණ රංග පර්ෂදය විසිනි. දිගු නිහැඬියාවකට පසුව 1999 දී විසි වස් සමරු රංගනය සලාපුර කලා කවය මඟින් හලාවත සුදසුන රංග ශාලාවේ දී දින 04 තුළ රංග ගත විය. සම්ප්‍රදායික පාස්කු නාට්‍ය කලාවෙන් බැහැරව පර්යේෂණ ගවේෂණයක් ලෙසින් "කල්වාරිය" ඉදිරිපත් කළේය. නැවතත් 2001 වසරේ දී හලාවත ආසන දේව මන්දිරයේ දී 175 වන ජුබිලි පාස්කු උත්සවය වෙනුවෙන් සලාපුර කලා කවය විසින් රංග ගත විය. අවසන් වරට රඟ දැක්වූයේ 2012 වසරේ දී අලුත්වත්ත දේව මන්දිරයේ දී ය. ඒ නොමිලේ ය.

2014 අප්‍රේල් 5 වන දින හලාවත සාන්ත මරියා මහ විදුහල් භූමියේ දී හලාවත පරිත්‍යාග ශීලි මහත්ම මහත්මින්ගේ ධන පරිත්‍යාග යෙන් මෙම කල්වාරිය නිෂ්පාදනය කරනුයේ හලාවත මීසම් පාස්කු හවුලෙන් හා මීසම් සේවක ලින්ටන් නිහාල් ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් මෙවර රඟ දක්වන්නේ 23 වරටය. **(පර්සි ප්‍රනාන්දු)**

# මීගොමුව වෙරළ උද්‍යානයේ මහා පාදනමස්කාරය

ජේසුගේ දුක්ප්‍රාප්තිය නර්තන කාව්‍ය බැලේ සම්ප්‍රදා ශෛලියෙන් ලොව ප්‍රථම වතාවට ඉදිරිපත් කළේ මීගොමුව "තාරකයාණෝ" නාට්‍ය කණ්ඩායම වේ.

ඔවුන් සමඟ එක්ව මීගොමු - වැල්ලවීදිය සා. සෙබස්තියන් දෙව් මැඳුරේ මීසම් සේවක ගරු ටෙරන්ස් බෝදියාබදු පියතුමා හා මීසම් ජනතාවගේ මූලිකත්වයෙන් මහා පාද නමස්කාරයක් අප්‍රේල් 06 ඉරිදා සවස 4 ට මීගොමුව වෙරළ උද්‍යානයෙන් පටන්ගෙන වැල්ලවීදිය සා. සෙබස්තියන් දෙව්මැඳුර දක්වා සිදුකැරේ. ඔබ සැමට ආරාධනා!

**(ජෝ. සංගපාලආරච්චි)**

# මත්තුමගල මීසමේ චතාරික වැඩසටහන

මත්තුමගල මීසමේ චතාරික වැඩසටහන් ආරම්භ කරන ලද්දේ "යක්ෂයාට විරුද්ධව සිටින්න එවිට ඔහු ඔබෙන් පලා යනු ඇත. දෙවියන් වහන්සේට ළං වන්න. එවිට ඔවුන්වහන්සේ ඔබට ළං වෙනු ඇත" (ජාකොබ් 4:7-8) යන තේමාව ඔස්සේ මීසම තුළ විශේෂ වැඩසටහන් සූදානම් කළේය.

ඒ අතර දිව්‍ය පූජාව සමඟ දින 40 චතාරික භාවනාව හා E5 නිරාහාරශීලි ව්‍යාපෘතිය ද පසන් හා ලතොනි ගායනයන් ද අප්‍රේල් 5-6 චතාරික වන්දනා ගමන මඩු සිද්ධස්ථානයට ගමන් කරයි. මත්තුමගල මීසමේ 50 වන ජුබිලි සංවත්සරය වෙනුවෙන් ආධ්‍යාත්මිකත්වයට මුල්තැන දෙමින් මීසම් සේවක ගරු ගිරාන් පියතුමා විසින් එම කටයුතු සිදු කරයි. **(ටී. ක්‍රිෂාන් ප්‍රනාන්දු)**


කාරුණික දැනුම් දීමයි

**pradeepaya@yahoo.com සහ pradeepaya @sltnet.lk ඊ මේල් ලිපිනයන් ප්‍රදීපය පුවත්පත් ලිපි එවීම සඳහා පමණක් භාවිත කරන්න.**

**ප්‍රදීපය දැන්වීම් එවීම සඳහා පමණක් pradeepayaadds@yahoo.com භාවිත කරන්න.**


# අධ්‍යාත්මික පෞරුෂ වර්ධන වැඩසටහන

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් දිවුලපිටිය අධ්‍යාපන කොට්ඨාසයේ බෞද්ධ පාසල් වල ඉගනුම ලබන 6 ශ්‍රේණියෙන් ඉහළ කතෝලික දරුවන් වෙනුවෙන් මෙවර පාස්කුව තුළ ආධ්‍යාත්මික පෞරුෂ වර්ධන වැඩසටහනක් මෙවර පාස්කුවේ දී බඩල්ගම ශු. ජපමාල මාතා දේවස්ථානයේදී පසුගියදා පවත්වනු ලැබීය.

දරුවන්ගේ හදවත් ආධ්‍යාත්මිකව හා මානසිකව පෝෂණය වීමට මග පෙන්වීමක් මෙම වැඩසටහන තුළින් උදා විය. සිසු සිසුවියන් 280 ක් පමණ ඊට සහභාගි වූ අතර වයස් අනුව කණ්ඩායම් කර වඩාත් ඵලදායී ලෙස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ගරු නන්දන සපරමාදු පියතුමා, ගරු රොෂන් මිරන්ඩා පියතුමා, ගරු ජුඩ් ටෙන්සන් පියතුමා හා ඩග්ලස් හෙට්ටිආරච්චි මහතා මෙම වැඩසටහන මෙහෙයවනු ලැබීය. බඩල්ගම මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමාගේ සහ මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ කතෝලික ධර්මය ගුරු උපදේශිකා දුෂ්මන්ති දයා කුමාරි මෙනවියගේ සංවිධානයෙන් මෙම කටයුත්ත සිදු කෙරුණි. **( මරිස් මදුරාවල )**

# පදවි දහම් සේවා කාර්ය මණ්ඩලවල සුහද එකමුතුව

ජාතික ධර්මෝපදේශ හා බයිබල් සේවා මධ්‍යස්ථානය මගින් සංවිධානය කරනු ලැබූ ශ්‍රී ලංකාවේ පදවි ධර්මෝපදේශ, අධ්‍යාපන හා බයිබල් සේවා මධ්‍යස්ථාන අතර සුහද එකමුතුව මාර්තු මස 21, 22 යන දිනවල දී හලාවත සංහිඳියාව දහම් නිකේතනයේ දී පැවැත්විණි. මෙම සුහද හමුවේ මූලික පරමාර්ථය වූයේ ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය හා පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථාන අතර සුහදතාවය, එකමුතුකම හා එකිනෙකා හඳුනා ගැනීම ය.

"කිතුනු නායකත්වයට මාර්ගෝපදේශය" යන මැයෙන් මහාචාර්ය ඇන්ටන් මීමන මහතා ද, "ස්වඅධ්‍යයනය සමගින් අපගේ දහම් සේවා ගැඹුරට දියත් කරමු" යන මැයෙන් සංජීව විජේසිංහ මහතා ද හරවත් දේශනයන් ඉදිරිපත් කළේ ය. එලෙසම ගරු සාන්තනා පැවිදි සොයුරිය ද එම මාතෘකා ඔස්සේ දෙමළ බසින් ඉතා සාරවත් දේශනයක් ඉදිරිපත් කළාය. මෙම සුහද හමුවට ධර්මෝපදේශ බයිබල් හා අධ්‍යාපන කොමිසමේ සභාපති අති උතුම් මැක්ස්වෙල් සිල්වා කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරුතුමා ද සහභාගි විය.

එතුමා මෙවැනි සුහද හමු පැවැත්වීම ඉතා යෝග්‍ය බවත් හැකිනම් වාර්ෂිකව මෙවැනි හමුවීම් පැවැත්වීම සිංහල දෙමළ අංශයන්ගේ සුහදතා වර්ධනයට රුකුලක් වන බවත් පැවසී ය.

ජාතික ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යක්ෂ ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා මෙම සුහද හමුව පැවැත්වීමේ සංවිධාන කටයුතු සියල්ල කළේ ය. ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය ද මේ සඳහා ඉතා උනන්දුවෙන් කටයුතු කළ අතර, සියලුම පදවි නියෝජනය කරමින් 55 දෙනෙකු පමණ මෙම අවස්ථාවට සහභාගි විය.

**ගරු මෙක්ටිල්ඩ් මාරි ශු.ප. පැවිදි සොයුරිය**

# පමුණුවිල ඥානකාන්තිය

පමුණුවිල ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ සැදැහැවත් ජනතාව ගේ සහභාගීත්වයෙන් චතාරිකයේ ගම වටා පාද නමස්කාරය අප්‍රියෙල් 06 වෙනි ඉරුදින සවස 2.30 ට දේවස්ථාන භූමියෙන් ආරම්භ වී ගල්ඒදන්ඩ, ගෝනවල ග්‍රාමයන් වටා සංචාරය කිරීමට නියමිතය. ඉන් අනතුරුව සවස 6.30ට දිව්‍ය පූජා යාගය දේවස්ථානයේ දී සිදු කරනු ලබයි. චතාරික සමය වෙනුවෙන් පමුණුවිල දෙව් මැදුරෙහි අප්‍රියෙල් 08,09,10,11 යන දිනයන්හි දී විශේෂ ඥානකාන්තියක් පැවැත්වීමට ද මීසම්පති ගරු ජූඩ් ෂාමන් ප්‍රනාන්දු පියතුමා කටයුතු පිළියෙළ කර ඇත. **(ලූෂන් එඩ්වඩ් පෙරේරා)**

# මරිය වසර වෙනුවෙන් චතාරික ධර්ම විවේකයක්

මරිය වසර නිමිත්තෙන් මාර්තු 21-22-23 තෙදින මීගමු දූව මීසම් සංඝය විසින් (දූව - පිටිපනවීදිය) මරුද මඩු ශුද්ධ භූමියේ චතාරික ධර්ම විවේකයක් පැවැත්වින.

මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමාගේ මූලිකත්වයෙන් 1500ක පමණ වන්දනා නඩයක් ඊට සහභාගි වූහ. දිව්‍ය පූජාව, ජපමාලය, පාදනමස්කාරය, ශුද්ධවූ පැය මෙන්ම "පසන්" ගායනා තුළින් වන්දනාකරුවන්ට ලැබුන අධ්‍යාත්මික පෝෂණය ඉතා වැදගත්ය. 22 දින රාත්‍රියේ දෙව් මැදුරේ සිට ලූර්දු ගුහාව තෙක්, මරි මවුන්ගේ දර්ශණය සොරෝලය රැගත් "ඉටිපහන්" පෙරහර කාගේත් සිත් ඇද බැඳ ගත් දැකුම්කලු ඓතිහාසික සිද්ධියක් විය. **(සටහන - ඇබ්ඩන් මිහිඳුකුල, සේයා - සොමේෂ් ප්‍රනාන්දු)**

# කළමුල්ල මීසමේ "දේව දයාව" අප්‍රේල් 27 ඉරිදා

හත්වන වරටත් වාර්ෂිකව පවත්වන කළමුල්ල මීසමේ දේව දයාවේ මංගල්‍යය අප්‍රේල් 27 ඉරුදින සවස 3.00 කටුකුරුන්ද ශු. පිලිප්නේරි දෙව්මැඳුරේදි පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

**(ඊ.පී.රේමන් සිල්වා කළමුල්ල)**

මෝදර සා. අන්ද්‍රේ දෙව්මැඳුරේ මීසම් සේවක සුදත් සිල්වා පියතුමාගේ දයාබර පියාණන් වූ ලියනගේ ඇලෝසියස් සිල්වා මහතා සඟ සුව දිනීය.

ඒ මහතාගේ අවසන් කටයුතු අප්‍රේල් මස 03 දා වැලිවිට සා. මරියා දෙව්මැඳුරේ පැවැති දිව්‍ය යාගයෙන් පසුව රෝමානු කතෝලික සුසාන භූමියේදී සිදු කෙරිණි. ඇලෝසියස් සිල්වා මහතාට මොක් සුව පතමු.

# දහම් ගුරු භවතුන්ට විශේෂ දෙසුමක්

පුත්තලම මීසමට අයත් සියලුම දහම් ගුරුවරුන් සඳහා විශේෂ දෙසුමක් පසුගියදා ඥානාර්ථ ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාගේ මෙහෙයවීමෙන් පුත්තලම සා. මරියා දෙම්මැදුරේ දී පැවැත්විණි.මෙහි තේමාව වූයේ "නූතන සිසු අර්බුද හමුවේ අධ්‍යතන කිතුනු ගුරු භූමිකාව" යන්නයි.

දේශක මහතා ඉතා හරවත් මෙන්ම ගුණාත්මක වූ දෙසුමකින් දහම් ගුරුභවතුන් දැනුම්වත් කෙරිණි. මෙය සංවිධානය කරනු ලැබුවේ පුත්තලම මීසම් සේවක ගරු වින්සන් ජෙයරාසා, මීසම් සහයක ගරු ප්‍රභාත් සංජය, ගරු විරාජ් එරංග පියතුමන්ලා විසිනි. **(ශානක මධුරංග - පුත්තලම)**



## ප්‍රදීපය
## මංගල යෝජනා

**මනාලියෝ**

කොළඹටනුදුරු, සිංහල, කතෝලික, අවු. 26, උස 5' 3", කොළඹ ප්‍රධාන කන්‍යාරාමයක උගත්, **B.Sc** (විශේෂ ගණිත) උපාධිධාරී, දැනට පුද්ගලික ආයතනයක සේවය කරන දියණියට ඉංජිනේරු, ගණකාධිකාරී හෝ උගත්, ව්‍යාපාරික යහපත්, චරිතවත් පුතකු වැදගත් පවුලකින් ව්‍යාපාරික දෙමව්පියන් සොයයි. වටිනා ආයාදයක් දෙනු ලැබේ. **E-mail: ymsp6352@gmail.com** අංක **N7134**, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...

**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**

## ඔබගේ දුවට හෝ පුතාට සුදුසු
## කතෝලික සහකරුවකු හෝ සහකාරියක සඳහා

**මංගල යෝජනා දැන්වීමක් පළ කර ගැනීමට අවශ්‍ය නම් පහත උපදෙස් පිළිපදින්න.**

**ඔබගේ පුතුගේ හෝ දියණියගේ විස්තර මුද්‍රිත අකුරින් හෝ පැහැදිලි අත් අකුරින් ලියා හැකි ඉක්මනින් අප වෙත යොමු කරන්න.**

- මංගල යෝජනා දැන්වීම් සඳහා පළමු වචන 15 ට රු. 500/- ක මුදලක් වන අතර ඉන් පසුව වැඩිවන වචනයකට රු. 8.00 ක මුදලක් එකතු වේ.
- තැපැල් මගින් මංගල යෝජනා දැන්වීම එවන්නේ නම් දැන්වීම සමග ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් එවන්න.
- ඔබගේ දුරකථන අංකය පළකළ යුතු නම් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර අත්සන් කරන්න.
- දැන්වීම ෆැක්ස් මගින් අප වෙත එවන්නේ නම් දැන්වීම සඳහා වැය වන මුදල මරදාන **HNB** ශාඛාවේ ගිණුම් අංක 108010005037 ට ඔබගේ මුදල් බැර කරන්න. ඉන්පසු මුදල් බැර පත හා දැන්වීම අප ආයතනයට ෆැක්ස් කරන්න.
- දැන්වීම ෆැක්ස් යළ පසු එය අප ආයතනයට ලැබී ඇත්දැයි පරීක්ෂා කර දැන ගන්න.
- මංගල යෝජනා සඳහා පිළිතුරු එවීමේදී මංගල යෝජනා අංකය පැහැදිලිව සඳහන් කර කුඩා කවරයක (3 1/2' 6") එවන්න.



ගරු අධ්‍යක්ෂ පියතුමා,
කොළඹ කතෝලික මුද්‍රණාලය, අංක 2,
ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08.
දු.ක. 2695984 / 2678106 / 011-4899611 ෆැක්ස් : 2692588

